**බොනී ර්. ස්වීනි** (SBN 176174)
**ස්ටෙෆනි වයි. චෝ** (SBN 291903)

HAUSFELD LLP 600 Montgomery Street, Suite 3200
San Francisco, CA 94111
T: (415) 633-1908
F: (415) 633-4980

**මයිකල් ඩී. හවුස්ෆෙල්ඩ්** (pro hac vice pending)
**ස්කොට් ඒ. ගිල්මෝර්** (SBN 284961)

HAUSFELD LLP
1700 K Street NW
Suite 650 Washington, DC 20006
T: (202) 540-7200
F: (202) 540-7201

*පැමිණිල්ලේ නීතිඥවරු*

# එක්සත් ජනපද දිස්ත්‍රික් අධිකරණය
# කැලිෆෝනියාවේ මධ්‍යම දිස්ත්‍රික්කය

| | |
|---|---|
| ***පැමිණිකරුවෝ,*** | No: 2:19-cv-02626-JFW-PLA |
| රෝයි මනෝජ්කුමාර් සමාදානම්,<br>රමේෂ් තේවරාජන්, විද්‍යා ජයකුමාර්,<br>රමණන් සිවලිංගම්, ශාන්ති පද්මනාදන්,<br>සමන් පෙරේරා, නිමල් ජයසූරිය,<br>වසන්ති රත්නසිංහම්, සුරේෂ් ජෙයබාලන්,<br>සෙන්තිල් පුවනේස්වරන්, මයුරන් රාජකුමාර් | ගරු ජෝන් එෆ්. වෝල්ටර්<br><br>පළමු සංශෝධිත<br>පැමිණිල්ල |
| එදිරිව, | |
| ***විත්තිකාර,***<br>නන්දසේන ගෝඨාභය රාජපක්ෂ | ජූරි නඩු විභාගයක් ඉල්ලා සිටියි. |

# ඇතුළත


හැඳින්වීම ........................................................................................................ 05

නීතිමය අධිකාරය සහ බල ප්‍රදේශය ........................................................................ 06

පැමිණිලිකරුවෝ ................................................................................................ 07

විත්තිකරු ........................................................................................................ 07

පරිසිද්ධීන් ........................................................................................................ 08

I. පසුබිම ........................................................................................................ 08

*අ) රාජපක්ෂ පාලන තන්ත්‍රය: ශ්‍රී ලංකාවේ වාර්ගික හිංසනය*

*හා දේශපාලන මර්දනකාරීත්වය* ........................................................................ 08

*ආ) සන්නද්ධ හමුදාවන් සහ පොලිසිය*

*ගෝඨාභය විසින් පාලනය කෙරුණි* ........................................................................ 09

*ඇ) ගෝඨාභය විසින් වධක බිම් පාලනය කරන ලදී* .................................................... 10

*ඇ) ගෝඨාභයගේ සුදු වෑන්: පැහැරගැනීම්, වධ හිංසාවන්,*

*ලිංගික ප්‍රචණ්ඩත්වය හා කප්පම් ගැනීමේ රටා* ...................................................... 11

II. රෝයි සමාදානම් වධ හිංසාවට ලක්කිරීම ................................................................ 12

*අ) රෝයි අත්අඩංගුවට ගැනීම* ............................................................................ 12

*ආ) ජාත්‍යන්තර නිරීක්ෂකයන් - නමුත් නිදහසක් නැත* ................................................ 14

*ඇ) මෙහි කිසිවකුට උදව් කළ නොහැක:*

*චෛත්‍ය පාරේ රැඳවුම් මධ්‍යස්ථානයේ වධ හිංසාවන්* .................................................... 14

*ඇ) බූස්ස රැඳවුම් කඳවුරට මාරු කර යැවීම* ............................................................ 15

*ඉ) බලහත්කාරී පාපොච්චාරණයන්* ........................................................................ 15

III. රමේෂ් තේවරාජන්ට සිදුකළ වධහිංසා ................................................................ 15

*අ) ධර්ම චක්‍රය: CID පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා විසින්*

*වධ දෙනු ලැබීම* ........................................................................................ 16

ආ) රාජ්‍ය බුද්ධි සේවය විසින් වධ දෙනු ලැබීම ........................................................ 16

IV. ශාන්ති පත්මනාදන්ට සිදු කළ වධහිංසා ................................................................ 17

*අ) ලංකාවට පැමිණීම* .................................................................................... 17

ආ) ගල්කිස්ස පොලිස් ස්ථානයේ බිහිසුණු අත්දැකීම .................................................. 18

*ඇ) පොලිස් පළිගැනීම: 'ඇගේ බල්ලා මැරූ විදියටම අපි ඇ මරා දමන්නෙමු'* ..... 19

V. සුරේෂ් ජයබාලන් වධහිංසාවට ලක්කිරීම.................................................... 19

*අ) යුද අපරාධ සාක්ෂි බේරාගැනීම.................................................................. 19*

*ආ) 'හතරවැනි තට්ටුවේදී' වධහිංසා............................................................ 20*

*ඇ) ලිංගික වධහිංසා....................................................................................... 21*

*ඇ) ජොසොෆ් කඳවුරට මාරුකර යැවීම............................................................ 21*

VI. විද්‍යා ජයකුමාර් වධහිංසාවට ලක්කිරීම...................................................... 22

*අ) යුද කලාපයෙන් නික්මයාම හා සමූහ සිරගතකිරීම....................................... 22*

*ආ) 'උඹට අඹු සැමියන් වශයෙන් කෙනෙක් එක්ක නිදාගන්න වේවි":*

*හමුදා කඳවුරක ලිංගික වහල්කම්................................................................. 22*

*ඇ) "හතරවැනි තට්ටුවේ"දී ප්‍රශ්න කිරීම සහ වධහිංසා...................................... 24*

*ඇ) හමුදා මූළුතැන් කඳවුරක ලිංගික වහල්කම්................................................. 24*

*ඉ) පොලිස් ස්ථානයක ලිංගික වධහිංසා........................................................... 25*

VII. නිමල් ජයසූරිය වධහිංසාවට ලක්කිරීම....................................................... 25

VIII. සමන් පෙරේරා වධහිංසාවට ලක්කිරීම.......................................................28

*අ) "හතරවැනි තට්ටුවේ"දී වධහිංසා සහ ලිංගික හිංසන..................................... 28*

*ආ) ආරක්ෂක ලේකම්වරයාගෙන් දුරකතන ඇමතුමක්........................................ 29*

IX. සෙන්දිල් පුවනේස්වරන්ට සිදුකළ වධහිංසා.................................................. 29

*අ) පැහැරගැනීම.............................................................................................. 29*

*ආ) ජෝසොෆ් කඳවුරේදී හංවඩු ගැසීම............................................................ 30*

X. රමණන් සිවලිංගම්ට සිදුකළ වධහිංසා........................................................... 31

*අ) දෙමටගොඩ පොලිස් ස්ථානයේදී අත්අඩංගුවට ගැනීම හා වධහිංසා කිරීම...... 31*

*ආ) පැහැර ගැනීම සහ හුදකලා සිර අඩස්සියෙහි තබා ගැනීම............................ 31*

*ඇ) වධදීම් හා ලිංගික හිංසනයන් යටතේ ප්‍රශ්න කිරීම....................................... 32*

XI. වසන්ති රත්නසිංහම්ට සිදුකළ වධහිංසා....................................................... 33

*අ) පුල්මොඩ්ඩෙ පොලිස් ස්ථානයේදී ලිංගික හිංසන......................................... 33*

XII. මයූරන් රාජ්කුමාර් වධහිංසාවට ලක් කිරීම.................................................. 33

*අ) ජෝසොෆ් කඳවුරේදී හංවඩු ගැසීම්........................................................... 34*

XIII. අඛණ්ඩව පවත්වාගෙන යන දණ්ඩ මුක්තිය................................................ 34

*අ) ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රකට රහස: වධහිංසා පිළිබඳ*

*වාර්තා නිරන්තරයෙන් ගෝථාභයගේ අවධානයට යොමු කරන ලදී.................. 35*

*ආ) ගෝධාභය යුක්තිය අවහිර කොට දණ්ඩ මුක්ති සංස්කෘතියක් තහවුරු කළේය*........ 35

චෝදනාව I: වධහිංසාව........ 37

චෝදනාව II: සිවිල් පහර දීම........ 39

චෝදනාව III: සිවිල් අඩන්තේට්ටම් කිරීම........ 40

චෝදනාව IV: හිතාමතා මානසික පීඩා ඇතිකිරීම........ 40

# හැඳින්වීම

1. 2005 සිට 2015 දක්වා, ඇමරිකානු පුරවැසියකු විසින් ශ්‍රී ලංකා රාජ්‍යය තුළ වාර්ගික හිංසනයේ සහ දේශපාලන මර්දනයේ ලේ වැකි ව්‍යාපාරයකට නායකත්වය දෙන ලදී. එම ඇමරිකානුවා ගෝඨාභය රාජපක්ෂ ("ගෝඨාභය" නොඑසේනම් "විත්තිකරු") ය. ඔහුගේ සහෝදරයා වූ මහින්ද රාජපක්ෂ 2005දී ජනාධිපති ධූරයට පත්වීමෙන් පසු ගෝඨාභය ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ධූරයට නම්කරන ලදී. ලොයොලා නීති විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්වකීය රැකියාව අත්හළ ගෝඨාභය, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ විධාන වගකීම (command responsibility) භාරගනිමින් දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව ඔවුන් මුදා හැරියේය.

2. රාජපක්ෂ පාලන තන්ත්‍රය විසින් දිවයිනේ බහුතර ජනවර්ගය වූ සිංහලයන්ගේ සැහැසි ජාතිකවාදය, දීර්ඝ කාලයක් තිස්සේ අයිතීන් මැඩලන ලද සුළුතර ජනවර්ගයක් වූ දෙමළ ජනයාට එරෙහිව මොළවන ලදී. ගෝඨාභය බලය ලබන විට, සිංහල අධිපතිත්වය සහිත ආණ්ඩුව සහ දිවයිනේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ස්වාධීන දෙමළ රාජ්‍යයක් සඳහා සටන්කළ දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානයේ නායකත්වයෙන් යුතු දෙමළ බෙදුම්වාදීන් අතර දශක ගණනාවක් දිග්ගැසුණු සිවිල් යුද්ධයකට ශ්‍රී ලංකාව පැටලී සිටියාය.

3. ඒ වනවිටත් ම්ලේච්ඡ වූ යුද්ධයකට ගෝඨාභය විසින් නව මට්ටමක කෲරත්වයක් ගෙන එන ලදී. වග විභාගයකින් තොර සහ ඇතැම්විට සිතාමතා සිවිල් වැසියන් ඉලක්ක කළ ප්‍රහාරක රටාවකින් යුතු සීමා බාධා රහිත යුදමය මෙහෙයුම්, ඔහුගේ චරිතාපදානය ලියූ ලේඛකයා විසින් නම් කර ඇත්තේ 'ගෝඨාගේ යුද්ධය'[1] මැයෙනි.

4. 2009 මැයි මාසයේදී, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එල්ටීටීඊ සංවිධානය පරාජය කොට අකර්මණ්‍ය කරන ලදී. එහි නායකත්වය මුළුමණින්ම පාහේ ඝාතනය කොට, දස දහස් සංඛ්‍යාත දෙමළ සිවිල් වැසියන් සංහාරය කළ එය, යුද්ධයෙන් දිවි බේරාගත්තවුන් 300,000කට ආසන්න සංඛ්‍යාවක් රැඳවුම් කඳවුරු තුළට කොටු කරනු ලැබුණි. යුද කලාපයෙන් පිටතට ආවුන් සෝදිසි පරීක්ෂාවන්ට ලක් කරන ලද අතර, දහස් සංඛ්‍යාතවුන් සිර කඳවුරු සහ වධකාගාර තුළට 'අතුරුදහන්' කෙරුණි.

5. මේ කෲරතර ක්‍රමය යුද්ධයෙන් අවුරුදු ගණනාවකට පසු ද එලෙසින්ම පැවතුණි. අද දක්වාත්, එකී අපරාධකරුවෝ පූර්ණ දණ්ඩ මුක්තිය භුක්ති විඳිති. වත්මන් ආණ්ඩුව යටතේ පවා, රාජපක්ෂ සමයේ චූදිත වධකයන් සහ යුද අපරාධකරුවන්ට උසස්වීම් ප්‍රදානය කරමින්, මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ විමර්ශන සොයා බැලීමේ වගකීම් නරුම ලෙස පවරනු ලබන අතර වධ හිංසා පිළිබඳ එක්සත් ජාතීන්ගේ විභාග කිරීම්වලට පවා ආණ්ඩුව නියෝජනය කිරීමට නම් කැරෙයි.

6. මේ නඩුකරයේ පැමිණිලිකරුවන් විසින් නියෝජනය කරනු ලබන්නේ, ගෝඨාභයගේ විධානයට යටත්ව ක්‍රියාකළ ආරක්ෂක හමුදාවන් විසින් පැහැරගැනීමට, වධහිංසනයට හා බලහත්කාරී ලිංගික දූෂණයට පාත්‍ර කරන ලද දෙමළ සිවිල් වැසියන්, එල්ටීටීඊ යුද සිරකරුවන් සහ රාජපක්ෂ පාලන තන්ත්‍රයේ විවේචකයන්ගෙන් ඉතා කුඩා කොටසකි. මෙකී පැමිණිලිකරුවන් වනාහී;

* **රෝයි සමාදානම් –** ශ්‍රී ලංකාවට පැමිණි විටක අත්අඩංගුවට ගනු ලැබූ කැනේඩියානු දෙමළ ජාතිකයකි. පයිප්ප බට සහ රයිෆල් බඳවලින් පහර දී, ඔහුගේ බිරිඳ සහ දරුවන් බලහත්කාරී ලිංගික දූෂණයට හා ඝාතනයට ලක් කරන බවට කළ තර්ජන මගින් පාපොච්ඡාරණය කිරීමට රෝයිට බල කෙරිණ.

* **රමේෂ් තේවරාජන් -** දෙමළ මානව හිමිකම් ක්‍රියාකාරිකයකි. පෙට්‍රල් පෙහවූ ප්ලාස්ටික් බෑගයක් යොදාගෙන හුස්ම සිරකිරීමට ද, සිවිලිමේ එල්ලා, නග්න දෙපතුල්වලට යකඩ මුගුරුවලින් පොලිස් භටයන් කළ පහරදීම්වලට ද ඔහු භාජනය විය.

* **ශාන්ති පද්මනාදන් -** ආණ්ඩුවට එරෙහිව විරෝධතා දැක් වූ තරුණ දෙමළ කාන්තාවකි. පොලිසිය විසින් පැහැරගෙන යනු ලැබූ ඇය යළි යළිත් බලහත්කාරී ලිංගික දූෂණයට ලක්කර, පහර දී, දුම්වැටිවලින් පුලුස්සා, රත් වූ යකඩ කූරකින් හංවඩු ගසන ලදී.

* **නිමල් ජයසූරිය -** සිංහල මානව හිමිකම් ක්‍රියාකාරිකයකි. පොලිසිය විසින් පහරදීමෙන් ද, දෙමළ සිරකරුවන් වධහිංසනයට ලක් කිරීම බලා සිටින්නට බලකිරීමෙන් ද තම සගයන් පාවා දීමට පීඩනයක් එල්ල කෙරුණි.

[1] C.A. Chandraprema, Gota's War (2012).

*** විද්‍යා ජයකුමාර් -** හමුදාවන්ට යටත් වූ එල්ටීටීඊ පරිපාලනයෙහි තරුණ සිවිල් සේවිකාවක වූ ඇය, හමුදා කඳවුරු සහ පොලිස් ස්ථානවල හුදකලා සිර අඩස්සියෙහි තබන ලද අතර, අල්ලා ගන්නා ලද අවශේෂ දෙමළ කාන්තාවන් සමග තුන් වසරකට වැඩි කාලයක් ලිංගික වහල්කම් සහ වධහිංසනයන් දරා සිටීමට බල කෙරුණි.

*** සමන් පෙරේරා -** එල්ටීටීඊ සංවිධානයට ආධාර කළ බවට චෝදනා ලැබූ, සිංහල ආරක්ෂක හමුදා සාමාජිකයෙකි. කටු කම්බි රිංග වූ යකඩ බටයක් ගුද මාර්ගයෙන් ඇතුල් කිරීම ඔහුට දෙන ලැබූ වධහිංසාවන්ට ඇතුළත් විය.

*** රමණන් සිවලිංගම් -** එල්ටීටීඊ සංවිධානයට සහාය දැක්වීම හේතුවෙන් අත්අඩංගුවට ගත් දෙමළ ශිෂ්‍යයෙකි. නැවත නැවතත් රත් කළ යකඩයකින් හංවඩු ගැසූ ඔහු, පෙට්‍රල් යොදා හුස්ම සිරකිරීමට හා අධි ශීත යකඩ කූරක් ගුද මාර්ගයට ඇතුළත් කිරීම මගින් බලහත්කාරී දූෂණයට ලක් කරනු ලැබුණි.

*** සුරේෂ් ජෙයබාලන් -** පුණ්‍යායතනයක සේවකයකු වශයෙන් රාජපක්ෂ පාලන තන්ත්‍රය විසින් සිදුකළ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ ලේඛනගත කළ දෙමළ ජාතික එල්ටීටීඊ සාමාජිකයෙකි. ඔහු රඳවාගෙන ප්‍රශ්න කළ පොලිසිය විසින් පහරදීමට ද, දුම්වැටිවලින් පිලිස්සීම ද, පෙට්‍රල් පෙඟවූ ප්ලාස්ටික් බෑගයකින් හුස්ම සිරකිරීමට ද, ගුද මාර්ගීය ලිංගික දූෂණයට ද ඔහු ලක් කරන ලදී.

*** මයුරන් රාජ්කුමාර් -** දෙමළ ජාතික රජයේ ගුරුවරයෙකි. එල්ටීටීඊ සංවිධානයට සහාය දැක්වීමේ චෝදනා යටතේ සිර කඳවුරක රඳවා තැබූ ඔහු, පහර දී, දුම්වැටිවලින් පුලුස්සා, රත් වූ යකඩ කූරකින් හංවඩු ගසන ලදී.

*** සෙන්දිල් පුවනේස්වරන් -** එක්සත් රාජධානියේ උපාධිධාරී දෙමළ ජාතිකයෙකි. සිය නිවසට ගිය විටක පොලිසිය විසින් පැහැරගන්නා ලද ඔහු, හමුදා කඳවුරකට යවනු ලදුව, පහරදීමටත්, සම ගැළවී යන්නට පටන්ගන්නා තුරු හංවඩු ගැසීමටත් භාජනය කිරීමෙන් පසු පාපොච්චාරණය කිරීමට එකඟ විය.

*** වසන්ති රත්නසිංහම් -** එල්ටීටීඊ පරිපාලනයේ සිවිල් මූල්‍ය අංශයේ සේවය කළ තරුණ දෙමළ කාන්තාවකි. යුද කලාපයෙන් පලායනවිට අල්ලා ගන්නා ලද ඇය පොලිස් ස්ථානයක රඳවාගෙන, ඇයගේ ප්‍රශ්නකරුවන් විසින් ලී මුගුරක් යොදාගෙන ලිංගික දූෂණයට පාත්‍ර කරන ලදී.

7. දෙවන ලෝක සංග්‍රාමයේ නියුරම්බර්ග් සහ ටෝකියෝ අධිකරණ දක්වා දිවෙන එක්සත් ජනපද හා අන්තර් ජාතික නීතිය යටතේ, මෙකී අපරාධයන්ගේ විධාන වගකීම ගෝඨාභය රාජපක්ෂ විසින් උසුලනු ලබන්නේය. ඔහු යටතේ වූ ආරක්ෂක හමුදාවන් මහා පරිමාණ වශයෙන් වධහිංසාවන් හා ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකළ බව එක්කෝ හෙතෙම දැන සිටියේය, නැතහොත් දත යුතුව තිබුණේය. මෙම අපහරණයන් වළක්වනු වෙනුවට, ඔහු ඒවා දිරිමත් කිරීමට හෝ ඉවසා සිටීමට ක්‍රියා කළේය. අපරාධකරුවන්ට එරෙහිව අභිචෝදනා ගොනු කරනු වෙනුවට, හේ යුක්තිය පසිඳලීමට බාධා කොට, සාක්ෂිකරුවන්ට මරණ තර්ජන එල්ල කළේය. සිය වධකයන්ට දණ්ඩ මුක්තිය පොරොන්දු වෙමින් ඔහු ජාත්‍යන්තර රූපවාහිනියකට මෙසේ ප්‍රකාශ කළේය: "මම මේ රට තුළ කිසිදු විමර්ශනයකට අවසර නොදෙමි.....මේ මගේ අවසන් තීන්දුවයි."

8. මේ වනාහී, කැලිෆෝනියානු නීතිය හා වධහිංසාවට පාත්‍ර වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ හානි පූරක සහ දණ්ඩනීය අලාභ පියවාගනු වස් පවරන ලද සිවිල් නඩුකරයකි. පැමිණිලිකරුවන් බලාපොරොත්තු වන්නේ, ඇමරිකානු පුරවැසිභාවයේ ප්‍රතිලාභ දිනාගත් ගෝඨාභය, ඇමරිකානු නීතියේ වගකීම් භාරය දැරීමට ද සැළැස්වීමයි.

## නීතිමය අධිකාරය සහ බල ප්‍රදේශය

9. එක්සත් ජනපද නීති සංග්‍රහයේ 28 § 1331 යටතේ මෙම අධිකරණයට පැමිණිලිකරුවන්ගේ වධහිංසා පිළිබඳ හිමිකම් ගැන ෆෙඩරල් නෛතික අධිකාරයක් හිමිවන්නේ, වධහිංසාවට පාත්‍ර වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත (Pub. L. No. 102-256, 106 Stat.73 (1992) යටතට එම හිමිකම් ගැනෙන හෙයිනි. (28 USC § 1350 යටතේ සංග්‍රහගත ය) ("TVPA")

10. එක්සත් ජනපද නීති සංග්‍රහයේ 28 § 1367 යටතේ, පැමිණිලිකරුවන්ගේ කැලිෆෝනියා නෛතික හිමිකම් සම්බන්ධයෙන් මෙම අධිකරණයට නීතිමය අධිකාරය හිමිවන්නේ එම නඩුකරයේ හෝ මතභේදයේම කොටසක් වශයෙනි.

11. එක්සත් ජනපද නීති සංග්‍රහයේ 28 § 1391(b)(3) යටතේ බල ප්‍රදේශය නිවැරදි වන්නේ, විත්තිකරුට සිතාසි බාරදෙන ලද්දේ මෙම දිස්ත්‍රික්කය තුළ දී වන හෙයින් අධිකරණයේ පුද්ගල නීතිමය අධිකාරයට එය යටත්වන හෙයිනි.

## පැමිණිලිකරුවෝ

12. පැමිණිලිකාර රෝයි මනෝජ්කුමාර් සමාදානම් දෙමළ සම්භවයක් සහිත කැනේඩියානු පුරවැසියෙකි. ඔහු වර්තමානයේ කැනඩාවේ පදිංචිව සිටියි.

13. පැමිණිලිකාර රමේෂ් තේවරාජන් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඔහු දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටියි.

14. පැමිණිලිකාර ශාන්ති පද්මනාදන් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඇය දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටින්නීය.

15. පැමිණිලිකාර නිමල් ජයසූරිය පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඔහු සිංහල සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටියි.

16. පැමිණිලිකාර විද්‍යා ජයකුමාර් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඇය දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටින්නීය.

17. පැමිණිලිකාර සමන් පෙරේරා පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඔහු සිංහල සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටියි.

18. පැමිණිලිකාර වසන්ති රත්නසිංහම් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඇය දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටින්නීය.

19. පැමිණිලිකාර සුරේෂ් ජෙයබාලන් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඔහු දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටියි.

20. පැමිණිලිකාර රමණන් සිවලිංගම් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඔහු දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටියි.

21. පැමිණිලිකාර මයුරන් රාජ්කුමාර් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඔහු දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටියි.

22. පැමිණිලිකාර සෙන්දිල් පුවනේස්වරන් පළිගැනීමෙන් ආරක්ෂා වනු වස් එම අන්වර්ථ නාමයෙන් පෙනී සිටියි. ඔහු දෙමළ සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයෙක් වන අතර වර්තමානයේ යුරෝපයේ පදිංචිව සිටියි.

## විත්තිකරු

23. විත්තිකාර ගෝඨාභය රාජපක්ෂ එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන අතර වර්තමානයේ පදිංචිව සිටින්නේ ශ්‍රී ලංකාවේ අගනුවර වන කොළඹ ය.

24. ශ්‍රී ලංකාවේ උපත ලද ගෝඨාභය, දශක ගණනාවක් දිගු හමුදා සේවයෙන් පසු 1990 වසරේ හෝ ඒ ආසන්නයේ දී එක්සත් ජනපදයට සංක්‍රමණය වූයේය. තොරතුරු පිළිබඳ විශ්වාසය (information and belief) අනුව, ඔහු කැලිෆෝනියාවේ ලොස් ඇන්ජලීස් හි ලොයොලා නීති විද්‍යාලයේ යුනික්ස් පද්ධති පරිපාලකවරයකු ලෙස රැකියාවක නිරත විය. ගෝඨාභයගේ සහෝදරයා වූ මහින්ද රාජපක්ෂ, 2005 වසරේ නොවැම්බර් හෝ ඒ ආසන්න කාලයක දී ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස ඡන්දයෙන් තේරී පත් වූයේය. එම කාලය ආසන්නයේම ගෝඨාභයගේ සහෝදරයා විසින්, ඔහුව ආරක්ෂක ලේකම් වශයෙන් සේවය කරනු සඳහා පත්කරනු ලැබුණි. ගෝඨාභය, ආරක්ෂක අමාත්‍යාංශයේ දෛනික ක්‍රියාත්මිතයන් අධීක්ෂණය කළ අතර 2005 සිට 2015 වසර තෙක් හමුදාවන්ට ද 2005 සිට 2013 වසර තෙක් පොලීසියට ද විධාන සැපයීය. 2015 ජනාධිපතිවරණයෙන් ඔහුගේ සහෝදරයා පරාජය වීමෙන් පසු ඔහු සිය තනතුර අත් හළේය. වර්තමානයේ ඔහු රජයේ කිසිදු නිලයක් නොදරයි.

25. ශ්‍රී ලංකා රජයේ නිලයක් දරමින්, දිගු කාල පරිච්ඡේදයන් විදෙස්ගතව සිටිය ද කැලිෆෝනියාව සමග තමන්ට වූ සම්බන්ධය ගෝඨාභය විසින් කිසිවිටක බිඳ නොදැමී ය. ඔහු සහ ඔහුගේ බිරිඳට, දකුණු කැලිෆෝනියාවේ

නිවාස දේපළ හිමිව තිබුණි. ගෝඨාභය, කැලිෆෝනියාවේ වෙළඳ ව්‍යාපාරයන් පවත්වාගෙන යමින්, අරමුදල් රැස් කරන අතර ලොස් ඇන්ජලීස් හි ධර්ම විජය බෞද්ධ විහාරස්ථානයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ද අසුන් ගනී. කැලිෆෝනියානු විහාරස්ථානය හා එහි පැවිදි පිරිස්, රාජපක්ෂවරුන්ගේ දේශපාලන ව්‍යාපාරයන්ට ආධාර කරනු වස් මහජන සම්බන්ධීකරණ කටයුතු පැවැත්වීම ද, ඔවුන්ගේ රණකාමී ජාතිකවාදී මතවාදය ප්‍රවර්ධනය කිරීම ද, මෙම නඩු ක්‍රියාමාර්ගය පවා හෙළා දැකීම ද මගින් පෙරළා ඊට සමාන දේශපාලන උපකාර සිදුකර තිබේ.

# පරිසිද්ධීන්

## I. පසුබිම

### *අ) රාජපක්ෂ පාලන තන්ත්‍රය: ශ්‍රී ලංකාවේ වාර්ගික හිංසනය හා දේශපාලන මර්දනකාරීත්වය*

26. ඉන්දියාවේ දකුණු තුඩුවෙන් ඔබ්බෙහි වූ දූපත් රාජයයක් වන ශ්‍රී ලංකාව, හාරසිය වසක් තරම් කාලයක් බෙදා වෙන්කොට යටත් කිරීමේ පිළිවෙත් මූලික විජිතවාදී පාලනයකට පාත්‍රව තිබුණි. 1948 බ්‍රිතාන්‍ය පාලනයෙන් ශ්‍රී ලංකාව ස්වාධීනත්වය ලැබීමෙන් පසු දෙමළ ජනයා සහ අවශේෂ සුළුතර අයිතීන් කොන්කරමින් බහුතර සිංහල ජනයා ආණ්ඩු පාලනය අත්පත් කරගත්හ.

27. දේශපාලන ඉච්ඡා භංගත්වය සහිත වසර ගණනාවකින් පසු, වාර්ගික ආතතීන් ප්‍රචණ්ඩත්වය තුළින් පුපුරා ගියේය. දහස් ගණනක් දෙමළ ජනයා සංහාරය වූ 1983 "කලු ජූලිය" වනාහී එහි කූථ ප්‍රාප්තියයි. 1983 සිට 2009 දක්වා, දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ හෝ "දෙමළ කොටි") ස්වාධීන දෙමළ රාජ්‍යයක් සඳහා වූ සිවිල් යුද්ධයකට නායකත්වය දුන්නේය.

28. වසර ගණනාවක් පුරා, රටෙහි විශාල භූමි භාගයක බලවත් තත්ත්වාකාර ආණ්ඩුව වූයේ එල්ටීටීඊ සංවිධානයයි. එහි සන්නද්ධ සේනාංකයන්ට අමතරව අධිකරණ, පාසැල්, මහජන සෞඛ්‍යය, මූල්‍ය සහ යටිතල පහසුකම් සම්බන්ධයෙන් වගකියන සිවිල් පරිපාලනයක් ද එල්ටීටීඊය විසින් පවත්වාගෙන යනු ලැබුණි.

29. අනතුරුව, 2005දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා වශයෙන් ඡන්දයෙන් තේරී පත්වූයේය. සිංහල - බෞද්ධ ජාතිකවාදයේ උග්‍ර ප්‍රවර්ධකයන් වූ මහින්ද සහ ගෝඨාභය රාජපක්ෂ, දෙමළ කොටින් සමග වූ ගැටුම අවසන් යුදමය විසඳුමක් මගින් නිමා කරනු පිණිස ප්‍රබල ව්‍යාපාරයක් ගොඩ නැගුවේය. සිවිල් වැසියන් සහ සටන්කරුවන් අතර අවම වූ බෙදුමක් සහිතව දෙමළ විපාර්ශ්වය ඉලක්ක කළා වූ මෙම ව්‍යාපාරයේ ප්‍රධාන සැළසුම්කරු වූයේ, ආරක්ෂක ලේකම්වරයා වශයෙන් ගෝඨාභය රාජපක්ෂ ය.

30. රාජපක්ෂ පාලන තන්ත්‍රය විසින්, හමුදාවන් ද, පොලිස් සේනාංක හා දෙමළ අතුරු හමුදා කණ්ඩායම් ද භාවිතා කරමින් එල්ටීටීඊ පාලන ප්‍රදේශ මත සමූල නාශක ප්‍රහාරයක් දියත් කරන ලදී. 2009 වසන්ත කාලය වනවිට, එල්ටීටීඊ සංවිධානය ඊසාන දිග වෙරළ තීරයට කොටු කරනු ලැබුණි. ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඒක පාර්ශ්විකව නම් කරන ලද ක්‍රමයෙන් කුඩාවන "යුද මුක්ත කලාපයන්" ගණනාවක් තුළට, සිය දහස් සංඛ්‍යාත දෙමළ සිවිල් වැසියන් ආණ්ඩුවේ හමුදාවන් විසින් ගාල් කරන ලදී. මේ වනාහී, අනතුරට ලක්වීමෙන් ගැළවෙනු වස් සිවිල් ජනයාට ඒකරාශී වන ලෙස දන්වා නම් කරන ලද ප්‍රදේශයන් ය. කෙසේවතුදු, "යුද මුක්ත කලාපයන්" තුළ රැකවරණ ලද සිවිල් වැසියන් මතට සුපර් සොනික් ජෙට් යානා මගින් බෝම්බ ප්‍රහාරයන් ද, බර කාලතුවක්කු අවි මගින් ෂෙල් ප්‍රහාරයන් ද එල්ල කෙරුණි.

31. යුද්ධයේ අවසාන දවස්වල දී, යුද්ධයෙන් දිවි බේරාගත් විඩාපත් ජන සෙනඟ, කළපුවකට ඉහළින් දිවෙන පටු මගක් වූ වඩ්ඩුවාකල් පාලම මත රැස්කමින් ශ්‍රී ලංකා යුද හමුදාවන් යටතට පත්වූහ. සිය දහස් සංඛ්‍යාත දෙමළ ජනයා, යුද්ධයෙන් පසුව ද දිගු කලක් සිටි, රජයේ කඳවුරු තුළ රඳවනු ලැබුණි.

32. 2009 මැයි 18 වැනිදා හෝ ඒ ආසන්න දිනයක දී, එල්ටීටීඊ සංවිධානයේ දිවි බේරාගත් නායකයෝ හමුදාවට යටත් වූහ; බොහෝදෙනා නොවිධිමත් ලෙස ඝාතනය හෝ අතුරුදහන් කරන ලද අතර සෙස්සන් රඳවා ගනු ලැබුණි. යුද්ධයේ අවසාන මාස කිහිපය තුළ 40,000 - 70,000 අතර සිවිල් වැසියන් ප්‍රමාණයක් මිය ගිය බව එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇස්තමේන්තු කර තිබේ.

33. යුද්ධය නිමා වී, එල්ටීටීඊ සංවිධානය සමූල ඝාතනය කර තිබුණ ද, අප්‍රමාණ දෙමළ පුරවැසියන් ද, සිංහල විමතිකයන් ලෙස දක්නා ලදවුන් ද සැළැස්මානුකූල වධහිංසාවන්ට හා ලිංගික හිංසනයන්ට භාජනය කළ රැඳවුම් මධ්‍යස්ථාන පද්ධතියක් රාජපක්ෂ පාලන තන්ත්‍රය විසින් පවත්වාගෙන යන ලදී. කොළඹ බුද්ධි සේවා

කාර්යාංශයන්ගේ සිට ප්‍රාදේශීය පොලිස් ස්ථාන හා කැලෑබද හමුදා කඳවුරු දක්වා රටපුරාම යොදාගත් වධහිංසන පැමිණවීමේ ක්‍රම සහ රටා පොදු එකක් විය. සිවිල් ජනයාට එරෙහිව මෙකී පැතිරුණු හා සැලැස්මානුකූල ප්‍රහාරයන් දියත් කරන ලද්දේ ගෝඨාභය රාජපක්ෂගේ පාලනය යටතේ වූ හමුදා හා ආරක්ෂක සේනාංක විසිනි.

*ආ) සන්නද්ධ හමුදාවන් සහ පොලිසිය ගෝඨාභය විසින් පාලනය කෙරුණි.*

34. ගෝඨාභය රාජපක්ෂ, 2005 නොවැම්බර් 25 හෝ ඒ ආසන්න දිනයක දී ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් පත්විය. මෙකී නීති කෘත්‍යයට අදාළ වන සම්පූර්ණ කාලය තුළ ඔහු විසින් එකී ධූරය හොබවන ලදී.

35. ආරක්ෂක ලේකම්වරයා වශයෙන්, ගෝඨාභය රාජපක්ෂ, 2005 - 2015 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ හමුදා හා බුද්ධි සේවා සියල්ලට අණ දුන්නේය. අභිනවයෙන් බිහිකළ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය යටතට ගන්නා තෙක්, 2005 වසරේ සිට 2013 අගෝස්තු දක්වා පොලිස් සේනාංක ද ඔහු විසින් පාලනය කරන ලදී.

36. ආරක්ෂක ලේකම්වරයා වශයෙන්, ප්‍රධාන කොටම නීති රෙගුලාසි දෙකක් යටතේ අසාමාන්‍ය හදිසි බලතල ගෝඨාභයට හිමිව තිබුණි. දැනටත් බල පවත්නා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, "ත්‍රස්තවාදය" පිළිබඳ අතිශය පළල් නිර්වචනයක් ප්‍රතිග්‍රහණය කරමින් එල්ටීටීඊ සංවිධානය සමග සම්බන්ධතාවක් ඇතැයි සැකකරනු ලබන කවර හෝ පුද්ගලයකු නෛතික විවරණයකින් තොරව දීර්ඝ කාලීනව රඳවා තබාගැනීමටත්, වධ හිංසාවන්ට අවකාශ සළසමින්, හුදු පාපොච්ඡාරණ මත සදොස් බව නිශ්චය කිරීමටත් අධිකාරීන්ට අවසර ලබා දෙයි. 2005දී සම්මත කොටගෙන 2011දී අත් හිටුවන ලද හදිසි නීති රෙගුලාසි මගින් චෝදනා රහිතව අසීමිත කාලයක් රඳවා තබාගැනීමට අවශ්‍ය වූ තවත් පදනමක් සපයනු ලැබුණි.

37. මෙකී බලතලවලින් සන්නද්ධ වූ ගෝඨාභය සිය පාලනය තහවුරු කරගත්තේය. ඔහු වාර්තා කරන ලද්දේ, බොහෝ දුරට සංකේතාත්මක නාමයක් වූ ආරක්ෂක ඇමති ධූරය හෙබ වූ ස්වකීය සහෝදරයා වූ ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙතට ය. ආරක්ෂාව පිළිබඳ තීරණ පිටුපස සිටි සැබෑ බලවතා වූ ගෝඨාභය, විටක සෑම ආයතනයක් තුළම සිය අන්තේවාසිකයන්ගෙන් සැදුම්ලත් අභ්‍යන්තර කවයකට ඍජු නියෝග ලබාදෙමින්, තෝරා බේරා භාවිතා කළ මූලික විධාන ධූරාවලියක් (chain of command) ඔස්සේ ස්වකීය පාලන බලය අභ්‍යාස කළේය.

38. සන්නද්ධ හමුදා: ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව ආරක්ෂක අමාත්‍යාංශය විසින් පරිපාලනය කරන ලදී. පත්වීම්, උසස්වීම් ප්‍රදානය කිරීම් හා වැරදිකරුවන් හමුදා අධිකරණය හමුවේ අභිචෝදනා ගොනු කිරීම ද අතුළු විනය හා සම්බන්ධ කාර්යයන් පිළිබඳ අධිකාර බලය ගෝඨාභය සතු විය.

39. බුද්ධි සේවා: සන්නද්ධ බුද්ධි බලකාය හා රාජ්‍ය බුද්ධි සේවාව ඇතුළු අභ්‍යන්තර හා බාහිර බුද්ධි තොරතුරු සේවා, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පාලනය කරන ලදී.

40. පොලිසිය: වධ හිංසා පිළිබඳ කුප්‍රකට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (CID), ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID), අතුරු සේනාංකයක් වූ විශේෂ කාර්ය බලකාය (STF) සහ කොළඹ අපරාධ කොට්ඨාශය (CCD) ද ඇතුළත් සියළු පොලිස් අංශ භාරව තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශට ය. අතිරේක ආරක්ෂක ලේකම්වරුන්, පොලිස්පති හා නියෝජ්‍ය පොලිස්පතිවරුන් ඇතුළත් විධාන ධූරාවලියක් ඔස්සේ මෙකී ඒකක සම්බන්ධයෙන් ක්‍රියාකාරී බලය ගෝඨාභය විසින් අභ්‍යාස කරන ලදී.

41. නිශ්චිත සන්නිවේදන විධික්‍රමයක් ඔස්සේ මෙකී සේනාවෝ ගෝඨාභයට වාර්තා කළහ: අත්අඩංගුවට ගැනීමක් හෝ පැහැරගැනීමක් පිළිබඳ නියෝග මෙකී විධාන ධූරාවලිය ඔස්සේ පහළට යැවුණු අතර, අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබාගැනීම් සුපරීක්ෂාකාරීව සටහන් කොට, අයි ලේඛනගත කර ජ්‍යෙෂ්ඨ අධිකාරීන්ට පෙරළා වාර්තා කරනු ලැබුණි.

42. හිටපු හමුදා නිලධාරියකු වූ ගෝඨාභය, යුද හා පොලිස් සේනාවන්ගේ එදිනෙදා මෙහෙයුම් සොයා බැලූ නායකයකු විය. ජාතික ආරක්ෂක කවුන්සිලයේ මුලසුන දරන ලද්දේ ගෝඨාභය විසිනි. දේශපාලන නායකත්වය සැපයූ ඔහුගේ සහෝදරයා වූ ජනාධිපති සමග පොලිස් සහ හමුදා මෙහෙයුම් සම්බන්ධ කළ තීරක පුරුක වශයෙන් ක්‍රියාකළේ ඔහු ය. කලින් සිටි හා ඔහුට පසුව සිටි ආරක්ෂක ලේකම්වරුන්ට වඩා මහත් සේ වැඩි බලයක් ගෝඨාභය දැරුවේය. හමුදා මෙහෙයුම් සහ පොලිස් විමර්ශන නියම කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ කාර්යයන්ට ඔහු පෞද්ගලිකවම මැදිහත් වූවේය. කුලියට ගැනීම් හා බඳවා ගැනීම් ද, ද්‍රෝහීභාවය පිළිබඳ සැකකරනු ලැබූ

නිලධාරීන් නෙරපා හැරීමේ හා ඔවුන්ට එරෙහි අභිචෝදනා ගොනුකිරීම් ද ඔහු විසින් අධීක්ෂණය කරන ලදී. ඔහුගේ අභ්‍යන්තර කවය හා සමීපව වැඩ කරනු සඳහා ඇතැම්විට අතරමැදි නිළධාරීන් මඟහැර කටයුතු කළ හේ, සිය අන්තේවාසිකයන් මත ඍජු අධිකාරය පවත්වාගෙන ගියේය.

43. ඔහුගේ නියෝජිතයාගේ ප්‍රසිද්ධ ප්‍රකාශයන්ට අනුව, උපාය මාර්ගයන් සම්බන්ධීකරණය සඳහාත්, මෙහෙයුම් සැළසුම් කිරීම සහ වාර්තා ලබා ගැනීම සඳහාත් ගෝඨාභය ඔහු යටතේ වූ නිලධාරීන් සමග නිරන්තර හමුවීම් පැවැත්වීය[2]. ආරක්ෂක හමුදාවන් අධීක්‍ෂණය සම්බන්ධයෙන් ගෝඨාභයගේ භූමිකාව පිළිබඳ පැහැදිලි කරමින් 2009 මැයි 6 වැනිදා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකු සම්මුඛ සාකච්ඡාවක දී මෙසේ කීය:

> *"ඇත්ත වශයෙන්ම, කොළඹ මනා ආරක්ෂාවක් සහතික කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන පුද්ගලයා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යි. සතිපතා අපගේ ප්‍රගතිය ගැන අප විසින් ඔහු යාවත්කාලීන කළ යුතු අතර, ඊට අමතරව, පොලිස්පතිවරයා ද විමර්ශන ගැන දෛනික පදනමින් විමසා බැලීම සිදුකරයි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිමල් මැදිවක ද ඔහුගේ උපරිම සහාය අප වෙත ලබාදෙයි. ආරක්ෂක ලේකම්වරයා අපේ ශක්තියයි; අපගේ විමර්ශනයන්ට සාර්ථකත්වය අත්කර දෙන පරිදි, ඔහු විසින් අපි සියලු දෙනා එක් කණ්ඩායමක් වශයෙන් එකතු කර තිබේ."*[3]

44. තම ආරක්ෂක සේනා වනාහී මැනවින් පාලනය කෙරෙන සංවිධානයක් බව ඔහුගේම වචනවලින් ගෝඨාභය ප්‍රකාශ කර තිබේ.

> *"සෑම කුඩා පැතිකඩක්ම ඉතාම වැදගත් වන්නේ මෙය දම්වැලක් වැනි නිසා ය. එය එක් සේනාවක් හෝ සේවාවක් නොව, පූර්ණ කණ්ඩායමක ප්‍රයත්නයන් ය. ඉහළින්ම සිටින ජනාධිපතිවරයා සම්බන්ධීකරණය කරමින් නායකත්වය සැපයීය."*[4]

45. ගෝඨාභය සඳහන් කරන මෙම "පූර්ණ කණ්ඩායමට", මෙකී පැමිණිලිකරුවන්ව රට පුරා පොලිස් ස්ථානවල හා හමුදා කඳවුරුවල රඳවාගෙනෙ වධහිංසාවට භාජනය කළ නිලධාරීහු ද ඇතුළත් වූහ.

## *ඇ) ගෝඨාභය විසින් වධක බිම් පාලනය කරන ලදී.*

46. පැමිණිලිකරුවන් රඳවා තබාගෙන වධහිංසා පමුණුවන ලද රැඳවුම් මධ්‍යස්ථාන ගෝඨාභය විසින් පාලනය කරනු ලැබුණි. මේවාත්, රටපුරා පිහිටි අනෙකුත් මේ හා සමාන ස්ථානත්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පරිපාලනය කරන ලද අතර, හමුදාව හෝ පොලිසිය විසින් ද, ඇතැම්විට දෙපිරිසම විසින් ද මේවා භාවිතා කරන ලදී:

* **චෛත්‍ය පාර රැඳවුම් මධ්‍යස්ථානය -** දිවයිනේ බටහිර වෙරළ තීරයේ කොළඹ පිහිටා ඇති චෛත්‍ය පාර රැඳවුම් ස්ථානය, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තු මූලස්ථානයට මෙහෙයුම් කටයුත් රැගෙන යනු ලැබූ 2008 අග භාගයේ යම් වකවානුවක් වන තෙක්ම, සිරකරුවන් රඳවා තබා ගැනීමට, ප්‍රශ්න කිරීමට සහ වධහිංසා පැමිණවීමට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) විසින් භාවිතා කරන ලදී.

* **අපරාධ විමර්ශන දෙපාර්තමේන්තු මූලස්ථානය හෙවත් "හතරවැනි තට්ටුව" -** කොළඹ යෝක් වීදියේ පිහිටි අපරාධ විමර්ශන දෙපාර්තමේන්තු මූලස්ථානය (CID), 'හතරවැනි තට්ටුව' නමින් රට පුරා දන්නා, කුප්‍රකට වධක බිමකි. 2008 අග භාගයෙන් පසු, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් මෙම ස්ථානයේ කාර්යාල සහ රැඳවුම් ස්ථාන පවත්වාගෙන යන ලදී.

* **බූස්ස කඳවුර -** දකුණු දිග වෙරළ තීරයේ පිහිටි ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් පවත්වාගෙන යනු ලබන රැඳවුම් කඳවුරකි.

* **ගල්කිස්ස පොලිස් ස්ථානය -** දකුණු කොළඹ ප්‍රදේශයේ පොලිස් ස්ථානයකි.

---

[2] බලන්න Business Today, නියෝජ්‍ය පොලිස්පති - සිසිර මෙන්ඩිස් [සම්මුඛ සාකච්ඡාව], April 28, 2009, http://www.businesstoday.lk/printarticle.php?articleid=23

[3] Business Today, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි - අනුර සේනානායක [සම්මුඛ සාකච්ඡාව], May 6, 2009, http://www.businesstoday.lk/printarticle.php?articleid=201.

[4] Business Today, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ: නොසැලෙන අධිෂ්ඨානය [සම්මුඛ සාකච්ඡාව], May 2, 2010, http://www.businesstoday.lk/printarticle.php?articleid=2434.

*** දෙමටගොඩ පොලිස් ස්ථානය -** වධ හිංසා පැමිණවීම් පිළිබඳ කුප්‍රකට අංශයක් වන කොළඹ අපරාධ කොට්ඨාශය (CCD) පවත්වාගෙන යනු ලබන කොළඹ පිහිටි ස්ථානයකි.

*** පුල්මොඩ්ඩෙ පොලිස් ස්ථානය -** දිවයිනේ නැගෙනහිර වෙරළාසන්නව, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් භාවිතා කළ මෙම ස්ථානය පිහිටා ඇත්තේ 2009 වසන්ත කාලයේදී යුද කලාපයේ සිට අභ්‍යන්තරිකව අවතැන්වූවන් සෝදිසි පරීක්ෂාවට ලක්කරමින් ලියාපදිංචි කරන ලද ප්‍රදේශයක ය.

*** ජොසොෆ් කඳවුර -** දිවයිනේ උතුරු පළාතේ වවුනියාවෙහි පිහිටි ජෝසොෆ් කඳවුර විධිමත්ව හැඳින්වෙන්නේ වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය (SFHQ - W) ලෙසිනි. මෙය, ශ්‍රී ලංකාවේ උතුරු දිග දිස්ත්‍රික්කයන්හි හමුදා සහ පොලිස් මෙහෙයුම් සඳහා ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් වශයෙන් පැවතුණි. සන්නද්ධ බුද්ධි බලකාය, රාජ්‍ය බුද්ධි සේවාව හා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය ඇතුළු හමුදා, බුද්ධි සේවා හා පොලිස් සේනාංක මෙකී කඳවුරේ සිට ක්‍රියාත්මක වූහ.

*** ලිංගික වහල්කමෙහි යොදවාගත් අප්‍රකට හමුදා කඳවුරු -** පැමිණිලිකාරිනි විද්‍යා ජයකුමාර්, වෙනත් දෙමළ කාන්තාවන් සමග රඳවා තබාගෙන ලිංගික වහල්කමෙහි යොදවා ගනු ලැබුණේ නිත්‍ය හමුදා ව්‍යුහයන්ගේ කොටසක් වූ කඳවුරු දෙකක් තුළදී ය.

## *ඇ) ගෝඨාභයගේ සුදු වෑන්: පැහැරගැනීම්, වධහිංසාවන්, ලිංගික ප්‍රචණ්ඩත්වය හා කප්පම් ගැනීමේ රටා*

47. මෙකී වධක බිම්වල සිදුකරන ලද අපහරණයන් වනාහී අහඹු අවචර්යාවන් නොවේ. ඇත්තෙන්ම, ඒවා ආරක්ෂක අමාත්‍යාංශයේ විවිධ උපාංග අතර සම්බන්ධීකරණය අවශ්‍ය කෙරුණු චර්යාගත හා සැලැස්මානුකූල ක්‍රියාවන් ය.

48. ඒවා බොහෝවිට ආරම්භ වන්නේ, ගෝඨාභයගේ භීම පාලනය හා පර්යාය යෙදුමක් බවට පත් වූ "සුදු වෑන්" පැහැර ගැනීම සමග ය. සාමාන්‍යයෙන්, වින්දිතයන් පැහැර ගැනීම්, ප්‍රශ්න කිරීම් සහ මුදා හැරීම් සිදුකරනු ලබන්නේ කණ්ඩායම් තුනක් විසිනි. පැහැරගැනීම් සිදුකරන්නන් වනාහී, සිවිල් ඇඳුමින් සැරසී, ලියාපදිංචි අංක තහඩු ගැළ වූ වෑන් රථ ධාවනය කරන සිංහල පිරිමින් 4-5 දෙනකුගෙන් සැදුම්ලත් කණ්ඩායමකි. බොහෝ විට දැස් බැඳ, ලණු හෝ මාංචුවලින් දැත් බඳින ලද වින්දිතයන් වාහනයේ පිටුපසට තල්ලු කරනු ලැබුණි. අත්අඩංගුවට ගනීමේ වරෙන්තු පෙන්වීමක් සිදු නොවේ. කලින් තීරණය කළ ස්ථානවලට ප්‍රශ්නකිරීම සඳහා ඔවුන් රැගෙන යනු ලැබේ.

49. පොලිස් ස්ථාන වේවා, හමුදා කඳවුරු වේවා, වධක බිම්වල පිහිටි සිරකුටි, කුඩා සහ සනීපාරක්ෂාවෙන් තොර ඒවා වූහ. වින්දිතයන් ඔවුන්ගේ සිරකුටි තුළින් පිටතට ගෙන කලින් සූදානම් කළ, බොහෝ දුරට වධක උපකරණවලින් සමන්විත වෙනත් කාමරවලට ගෙන එනු ලැබේ. මේසයක් හා පුටුවකින් යුතු, මුගුරු, වයර් හා පයිප්ප බට වැනි මෙවලම් සහිත ප්‍රශ්න කිරීමේ කාමරය සාමාන්‍යයෙන් විශාල කාමරයකි. මේවා බොහෝ දුරට සිවිලිම් බාල්කයකට සම්බන්ධ කළ ලණුවක් නැතිනම් දම්වැලක් හෝ පුද්ගලයන් පොළොවේ සිට ඉහළට එසවිය හැකි කප්පි පද්ධතියක් සහිත වේ.

50. වින්දිතයන් නිත්‍ය වශයෙන්ම, දීර්ඝ කාලයක් පුරා ප්‍රශ්න කිරීමවලට භාජනය කෙරේ. වින්දිතයා සම්බන්ධ ලිපි ගොනුවක් ප්‍රශ්න කරන්නා අත නිතර තිබේ. කායික හිංසනයේ පොදු විධික්‍රමයන් වූයේ අතුල් පහර දීම, ගුටි බැට දීම, මුෂ්ටි ප්‍රහාර සහ බර බූට් සපත්තුවලින් මුහුණ සහ ශරීරය පුරා පා පහර දීම ය; වින්දිතයන්ගේ පිට කොන්දට, පාදවලට හා / හෝ යටිපතුල්වලට වැලි පිර වූ ප්ලාස්ටික් පයිප්ප බටවලින් ද, පොලු හා මුගුරු හා කේබල් වයර්වලින් යළි යළිත් පහරදීමද ඊට ඇතුළත් ය. තුවාල, තැලුම්, එල්ලා තැබීම්, යටි පතුල්වලට පහරදීම්, විදුලිය ඇල්ලීම් සහ ජලයේ ගිල්වීමෙන් හෝ පෙට්‍රල් හෝ මිරිස් කුඩු ගැල් වූ ප්ලාස්ටික් බෑගයන් හිස වැසෙන සේ අල්ලා සිටීම මගින් හුස්ම සිරකිරීම්වලින් වින්දිතයෝ පොදුවේ පීඩා විඳිති. පිලිස්සෙන මිරිස් දුම ආඝ්‍රාණය කිරීමට බොහෝ රැඳවියන්ට බල කෙරෙයි. විශේෂයෙන්ම බලහත්කාරී ලිංගික දූෂණයට පූර්වයෙන් කාන්තාවන්ගේ කලවයේ ඇතුල් පැත්ත දුම්වැටිවලින් පිලිස්සීම යොදාගනු ලැබේ. ඇසට පෙනෙන කැළැල් ශේෂ කරමින්, රත් වූ යකඩ කූරුවලින් වින්දිතයන් බොහෝවිට හංවඩු ගසනු ලබයි.

51. කාන්තාවන් හා පිරිමින්ට ලිංගික වදහිංසා පැමිණවීම ද වධක බිම්වල බහුල වශයෙන් සිදුකෙරේ. සාමාන්‍යයෙන් කාන්තා වින්දිතයකු නම් නිරුවත් කරනු ලැබීම, නම් අඩ ගසමින් අවමන් කිරීම සහ පියයුරු සහ ජනනේන්ද්‍රිය වේදනාකාරී ලෙස මිරිකීම සහ ඇදීමට භාජනය කරනු ලබයි. අනතුරුව, බලහත්කාරී ලෙස

අපරාධකරුවන් සමග මුඛ ලිංගික ක්‍රියාවන්හි යෙදීමට හා / හෝ යෝනි මාර්ගික හෝ ගුද මාර්ගීය දූෂණයට ඔවුන් ලක්කිරීම සිදු කෙරේ. පිරිමි වින්දිතයන්ට බොහෝ දුරට ඔවුන් වධයට පමුණුවන්නන් හා මුඛ සංසර්ගයේ යෙදෙන්නට බල කෙරෙන අතර, බොහෝවිට අවමන් සහගත යෙදුම් ද භාවිතා කෙරේ. පිරිමි වධකයන් විසින් සිය පුරුෂ ලිඟු හා යකඩ කූරු වැනි මෙවලම් පිරිමි වින්දිතයන්ගේ ගුද මාර්ගවලට ඇතුල් කළ ලිංගික දූෂණයට ලක් කරනු ලබයි. ඇතැම් අවස්ථාවල, දෙමළ කාන්තා හා පිරිමි රැඳවියන් ලිංගිකව අපහරණය කිරීමට සිංහල කාන්තා රැකවලුන් හෝ ආරක්ෂක සෙබළියන් සම්බන්ධ වී තිබේ.

52. පැහැරගනු ලැබූ වින්දිතයන් බොහෝ විට මුදා හැරෙන්නේ ඔවුන්ගේ පවුලේ අයවලුන් විසින් ආරක්ෂක හමුදාවන්ට කප්පම් මුදලක් ගෙවීමෙන් පසු පමණි. සාමාන්‍යයෙන් ඔවුන් භාරදෙනු පිණිස, දෑස් බැඳ, දෑත් මාංචු ලා, නොදන්නා ස්ථානයකට වාහනයකින් කැටුව යනු ලැබේ. ඔවුන් මුදා හරිනු ලබන බව සාමාන්‍යයෙන් ඔවුන්ට දැනුම් නොදෙන අතර බොහෝ දෙනා උපකල්පනය කරනුයේ තමන් මරා දැමෙනු ඇති බව ය. දෑස් බැඳි රෙදි කඩවල් හා මාංචු ගලවනු ලැබූ වින්දිතයන් අතරමැදියකු මගින් පවුල් වෙතට මුදා හැරේ. හිටපු රැඳවියන් පිළිබඳ තොරතුරු සොයන ආරක්ෂක හමුදා විසින්, රටින් පලා ගිය වින්දිතයන් විසින් හැර දමා යන පවුල්වල සාමාජිකයන්ට තාඩන පීඩන එල්ල කරනු ලබයි. ඇතැම් අවස්ථාවල දී, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා මානව හිමිකම් කණ්ඩායම්වලට සිදුවීම් පිළිබඳ වාර්තා කිරීම වළක්වනු පිණිස එල්ල කරනු ලබන පළිගැනීම්වලට ඔවුහු මුහුණ දෙති.

53. පැමිණිලිකරුවන්ගේ අත්දැකීම් මෙකී පිටපතට අනුකූල වේ.

## II. රෝයි සමාදානම් වධහිංසාවට ලක්කිරීම

### *අ) රෝයි අත්අඩංගුවට ගැනීම*

54. 2005 වසරේ දී, සිය වාසභූමිය වූ කැනඩාවේ සිට ශ්‍රී ලංකාවට සංචාරය කර වර්තමානයේ ඔහුගේ බිරිඳ වන කාන්තාව හා විවාහ වනු පිණිස සිවිල් යුද්ධයේ ඇති වූ තාවකාලික සංහිඳියාවේ වාසිය රෝයි ලබා ගත්තේය. ඔවුහු කොළඹ නිවසක් කුලියට ගත්හ. ඇය ගැබිනියක වූ විට දරුවා ලැබෙන තුරු ශ්‍රී ලංකාවේ රැඳී සිටින්නට ඔවුහු තීරණය කළෝය.

55. වරින් වර, සිය මිතුරකුගේ පරිගනක ඉලෙක්ට්‍රොනික වෙළඳ සැළක් සඳහා අවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට රෝයි සහාය විය. 2007 සැප්තැම්බර් මාසයේදී, ඔහුගේ මිතුරා විසින් ලංකාවට ආනයනය කළ ජංගම දුරකථන 600ක් රෝයිගේ නිවසට බාරදෙන ලද්දේ පසු දා මිතුරා පැමිණ රැගෙන යන තෙක් ය.

56. 2007 සැප්තැම්බර් 14 වැනිදා හිමිදිරි උදෑසන, මැෂින් තුවක්කු රැගත් සිවිල් හැඳගත් පිරිසක් රෝයිගේ නිවසට ආහ. නින්දේ පසු වූ රෝයි හා ඔහුගේ බිරිඳ අවදි වූයේ අවිගත් පිරිස් නිවසේ දොරට තට්ටු කරන හඬිනි. තමන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ (TID) නිලධාරීන් ලෙස හඳුන්වා දුන් පුද්ගලයෝ රෝයිගේ නිවස පරීක්ෂා කිරීමට අවශ්‍ය බව දන්වා සිටියහ. රෝයි එකඟ වූ අතර ඔවුහු නිවසට ඇතුල් වූහ. ඔහුගේ මිතුරා සඳහා ආනයනය කිරීමට රෝයි උපකාර කළ විවෘත නොකළ ජංගම දුරකථන පෙට්ටි නිවසේ කොරිඩෝවේ තබා තිබුණි. නිලධාරීහු එකී පෙට්ටි දැක විවෘතකොට එහි ඇත්තේ ජංගම දුරකථන බව දුටු විට, ඊට අදාළ නිශ්කාශන ඉන්වොයිසිය ඉල්ලා සිටියහ. භාණ්ඩ තොගය හා සම්බන්ධ පෝර්ම පත්‍රිකා රෝයි විසින් පෙන්වන ලදී; භාණ්ඩ හිමි සිය මිතුරාගේ වෙළඳ ව්‍යාපාරයට බැව් ඔහු පැහැදිලි කළේය. පෙට්ටි තුළ ගෝලීය තැන් සෙවුම් පද්ධති උපකරණයක් (GPS) ඇතැයි ද, එය නීති විරෝධී යැයි ද නිලධාරීහු රෝයිට කීහ. කෙසේ වුවද, එවැනි කිසිදු උපකරණයක් රෝයිට පෙන්වීමට ඔවුහු කටයුතු නොකළෝය.

57. තමන්ට ආසන්න වශයෙන් රුපියල් 25,000ක මුදලක් ගෙවන්නේ නම් තමන් පිටව යන්නෙමැයි ඔවුහු රෝයිට කීහ; නොඑසේනම්, ප්‍රශ්න කිරීම සඳහා ඔහු ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ මූලස්ථානයට ඔහුව රැගෙන යන බව ඔවුන් දන්වන ලදී. තමන්ට තමන්ගේ නිදහස පිණිස ගෙවන්නට ඒ සා මුදලක් නැතැයි රෝයි ප්‍රකාශ කළ විට ඔවුහු රෝයි අත් අඩංගුවට ගත්හ.

58. දෑත් හා දෑස් බඳින ලද රෝයි, රිදී පැහැති මෙර්සිඩීස් වෑන් රථයක් තුළට නංවාගන්නා ලදී. ඔහුගේ ගැබිණි බිරිඳ හා දරුවා නිවාස අඩස්සියේ තැබීමට ත්‍රස්ත විමර්ශන නිලධාරීහු ක්‍රියා කළහ. ඔහු මරා දමන බවටත්, ඔහුගේ සිරුර විසිකර දමන බවටත් තර්ජනය කරමින් නිලධාරීහු කොළඹ නගරය වටා මඳ වෙලාවක් කරක් ගැසූහ. ඒ උදෑසන ගෙවී යත්ම, ඔහුව කොළඹ නගර මධ්‍යයේ පිහිටි ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ රැඳවුම් ස්ථානයට රැගෙන යන ලදී.

59. එහි ළඟා වූ පසු, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ නිලධාරීහු මූලස්ථානය තුළට රෝයි කැටුව ගොස්, පුටුවකට තබා මාංචු ලා, ජංගම දුරකථන තොගය පිළිබඳ ඔහුගෙන් ප්‍රශ්න කළහ. අනතුරුව රෝයි සාජන්ට් ආබ්ඩීන්ගේ කාර්යාලය තුළට රැගෙන ගොස් මේසයකට තබා මාංචුලන ලදී.

60. විත්තිකාර ගෝඨාභයට යටත් සේවකයෙකු වන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සුනිල් එස්. සිරිසේන අත්සන් කළ රැඳවුම් නියෝගයක් යටතේ ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් රෝයි රඳවා ගන්නා ලදී. අවසරයකින් තොරව සිංගප්පූරුවේ සිට විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීමෙන් පසු ඔහු "ජාතික ආරක්ෂාව හා මහජන සාමයට අගතිදායී ලෙස ක්‍රියාකිරීම" වළක්වනු පිණිස ඔහු රඳවා තබාගත් බව රැඳවුම් නියෝගයේ ප්‍රකාශ වේ.

61. පෙරවරු 10.00ට පමණ රැඳවුම් ස්ථාන බාර නිලධාරී ප්‍රසන්න ද අල්විස් මුණගැසීමට රැගෙන යනු ලැබුණි. ගෝලීය තැන් සෙවුම් පද්ධති උපකරණයක් සන්තකයේ තබා ගැනීම නීති විරෝධී බව රෝයිට දැනුම් දුන් ප්‍රසන්න විසින් ආසන්න වශයෙන් විනාඩි 15ක් පමණ ඔහුව ප්‍රශ්න කරන ලදී. කැනඩාවේ ටොරොන්ටෝවේ දෙමළ කොටි ඔත්තු සේවා මෙහෙයවීම සම්බන්ධයෙන් ප්‍රසන්න රෝයිට චෝදනා කළේය.

62. 2007 සැප්තැම්බර් හා 2008 නොවැම්බර් දක්වා කාලය තුළ නීතිඥයකු හමුවීමට ඉඩ නොදී, චෝදනා ඉදිරිපත් කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයකු හමුවට නොපමුණුවා, ඔහු රඳවා තැබීම ස්වාධීන අධිකරණයක් මගින් විචාරීමක් සිදු නොකොට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් රෝයි රඳවා තබා ගන්නා ලදී.

63. 2007 සැප්තැම්බර් මාසයේ සිට 2008 අප්‍රේල් මාසය දක්වා පළමු අට මාසය, කොළඹ චෛත්‍ය පාරේ පිහිටි ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ රැඳවුම් මධ්‍යස්ථානය තුළ සිරගතව රෝයි ගෙවා දැමුවේය. ඔහු, අවශේෂ ශ්‍රී ලාංකික සිරකරුවන්ගෙන් වෙන්කරන ලද අතර වෙනත් විදෙස් ජාතිකයන් කිහිප දෙනකු සමග සාජන්ට් ආබ්ඩීන්ගේ කාර්යාලය තුළ රඳවා තැබුණි.

64. එහිදී, සම්පූර්ණ කාලය තුළම මේසයකට මාංචු ලා තිබූ රෝයිට වේදනාකාරී ඉරියව්වලින් බිම වාඩි වී හෝ වැතිරී සිටීමට බල කෙරුණි. රැඳවුම් මධ්‍යස්ථානය විසින් කොට්ටයක්, ගුදිරියක් හෝ පුටුවක් හෝ වෙනත් බඩු මුට්ටු සම්පාදනය නොකළේය. රෝයි සිර අඩස්සියේ සිටි කාලය තුළ, "කැනේඩියානු කොටියා"යි කියමින්, ඔහු මරා දමන බවට රැකවලුන් විසින් නිරන්තරයෙන් තර්ජනය කළේය. ඔහුට ආහාර සහ ජලය සීමිතව ලබා දුන් අතර ඔහුට අවශ්‍ය දියවැඩියා ඖෂධ ලබා දීමෙන් නිතර වැළකී සිටීම හේතුවෙන් ඇතැම් අවස්ථාවල ඔහු සිය ඇඳේම මුත්‍රා පහ කරගත්තේය.

65. රෝයි සහ සෙසු රැඳවියන්ට පහර දී ප්‍රශ්න කිරීම සඳහා ආසන්න වශයෙන් සතියකට දෙතුන් වතාවක් රැකවල් නිලධාරීන් සාජන්ට් ආබ්ඩීන්ගේ කාර්යාලයට ඇතුළු වූහ. රෝයි, වේදනාකාරී ඉරියව්වලින් විලංගු දමනු ලැබුණි. රැකවලුන්, ලෝහ බට හෝ දෘඪ රබර් මුගුරුවලින් රෝයිට පහර දුනි. තමන් දෙමළ කොටි සාමාජිකයකු යැයි පාපොච්ඡාරණය කරන්නැයි ඔවුහු ඔහුට මොර දුන්හ. මෙම පහරදීම් හා දිග්ගැසුනු පීඩාකාරී ඉරියව්වලින් ඉඳීම රෝයිට දැඩි කායික වේදනාවක් ඇති කළ අතර අද වනතුරුත් ඔහු ආබාධිතයෙකි.

66. වධහිංසාවල මානසික බලපෑම් ද තිබුණි. රෝයි රඳවා සිටි සම්පූර්ණ කාලය තුළ ත්‍රස්ත විමර්ශන නිලධාරීහු ඔහුව බියජනක තර්ජනයන්ට හා වාර්ගික අවමන් කිරීම්වලට බඳුන් කළහ. ඔහුගේ බිරිඳ අත්අඩංගුවට ගෙන බලහත්කාරී ලිංගික දූෂණයට ලක්කිරීමට තර්ජනය කර සිටි ඔවුහු, ඔහු නිදහස් කරගැනීම පිණිස ඇය මාර්ගයෙන් අල්ලස් ගෙවන්නැයි බල කළෝය. රෝයිගේ හිසට වෙඩි තැබීමටද ඔවුහු තර්ජනය කළහ. අනෙක් රැඳවියන් නිරුවත්කර පහර දෙනු බලා සිටින්නට ද ඔවුන් විසින් රෝයිට බලකරන ලදී.

### *ආ) ජාත්‍යන්තර නිරීක්ෂකයන් - නමුත් නිදහසක් නැත*

67. රෝයි රඳවා සිටියදීම ජාත්‍යන්තර නිරීක්ෂකයන් කිහිප දෙනෙක්ම ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ රැඳවුම් මධ්‍යස්ථානයට ආවෝය. රෝයි අත් අඩංගුවට ගැනීමෙන් දින කිහිපයක් ඇතුළතදී, 'නෝමන් මහතා'යැයි රෝයි විසින් දැන හඳුනාගත් විදේශ කටයුතු හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු දෙපාර්තමේන්තුවේ කැනේඩියානු නිලධාරියකු සහ කොළඹ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයීය සේවකයකු ඔහු බැලීමට පැමිණියහ. ඔහු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 'මට කළ හැක්කේ කුමක්දැයි බලන්නෙමැ'යි නෝමන් මහතා කීය.

68. 2007 ඔක්තෝබර් මාසයේදී, වධහිංසා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ නියෝජිත මන්ෆ්‍රෙඩ් නොවැක්, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ රැඳවුම් මධ්‍යස්ථානය නිරීක්ෂණයට පැමිණියේය. රෝයි විසින්, නොවැක් මහතාව දුටු නමුත් ඔහුට කතා කිරීමට අවස්ථාවක් නොලැබිණ. ඊට පසුව නොවැක් මහතා විසින් එක්සත් ජාතීන්ගේ

සංවිධානයට ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි, කොළඹ ත්‍රස්ත විමර්ශන රැඳවුම් මධ්‍යස්ථානයේ වධහිංසා පිළිබඳ විවිධ වාර්තා තමාට ලැබුණු බව විස්තර කළ අතර, සාජන්ට් ආබ්ඩීන් එක් අපරාධකරුවකු ලෙස නම් කර සිටියේය.[5]

69. 2007 ඔක්තෝබර් 19 වැනිදා හෝ ඒ ආසන්න දිනයක ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ (රතු කුරුසයේ) නිලධාරීන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ රැඳවුම් මධ්‍යස්ථානයට පැමිණ රෝයි මුණ ගැසුණි. එහිදී ඔහුගේ රඳවා තැබීම ලේඛනගත කරමින්, ලියාපදිංචි කාඩ්පතක් ඔහුට ලබා දෙනු ලැබිණ. තමාට නිදා ගැනීමට ගුදිරියක් නැති බව රෝයි ඔවුන්ට පැහැදිලි කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2007 දෙසැම්බරයේ මුල් භාගයේදී ඔහුට තුනී ගුදිරියක් ලබා දෙන ලදී.

*ඇ) මෙහි කිසිවකුට උදව් කළ නොහැක: චෛත්‍ය පාරේ රැඳවුම් මධ්‍යස්ථානයේ වධහිංසාවන්*

70. 2007 දෙසැම්බර් 17 වැනිදා හෝ ඒ ආසන්න දිනක, ස්ථාන භාර නිලධාරී ප්‍රසන්න ද අල්විස් සහ විත්තිකාර ගෝඨාභය රාජපක්ෂ අතර දුරකථන සංවාදයක් රෝයිගේ කන වැකුණි. ඔවුන් සාකච්ඡා කරමින් සිටියේ ඔහු පිළිබඳව ය.

71. එදින සන්ධ්‍යාවේ දී, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන්ගේ අමානුෂික වධහිංසා වටයකට ගොදුරුවීමට රෝයිට සිදුවිය. ඒ රැයේ දී, රැඳවුම් මධ්‍යස්ථානයේ උප අණ දෙන්නා වූ පොලිස් පරීක්ෂක පීරිස්, වැඩ මුර නිමා වූ රැකවල් භටයන් කිහිප දෙනෙකු සමග රෝයි රඳවා සිටි කුටියට ඇතුල් විය. රතු කුරුසයෙන් ලබාදුන් ගුදිරියට හිමිකමක් ඔහුට නැති බව පොලිස් පරීක්ෂක පීරිස් රෝයිට කීවේය. ගුදිරිය රෝයිගෙන් පසෙකට ඇද දැමූ රැකවල් භටයන් දණ ගසන්නැයි රෝයිට කී විට ඔහු අවනත විය. 'කැනේඩියානු එල්ටීටීඊ'කාරයා මරා දැමිය යුතු බවට යළි යළිත් මොර දෙමින් පීරිස් සහ අවශේෂ නිලධාරීහු රෝයිගේ උදරයට පා පහර දුන්හ. ටී-56 රයිෆල් බඳෙන් ද නිලධාරීහු රෝයිට පහර දුන්නෝය. අයකු රෝයිගේ පපුවේ ඇළයකට සිය රයිෆලයෙන් අනින ලද අතර, පීරිස් සහ සෙස්සන් විසින් රෝයිගේ මුහුණට ද, යටිබඩට ද, බාහු හා දෙපාවලට පයින් පහර දෙන ලදී. මේ පහරදීම්වල ප්‍රතිඵලයක් වශයෙන් වම් මැණික්කටුවෙහි ඉදිමීමකින් ද, දනහිස් ආබාධයකින් සහ උදරයේ හා ඉකිලියේ වේදනාවන්ගෙන් රෝයි පීඩා වින්දේය.

72. පසුදා උදෑසන, ස්ථාන භාර නිලධාරී ප්‍රසන්න ද අල්විස් කලින් දා රාත්‍රියේ තමාට කුමක් වීදැයි උපහාසාත්මකව රෝයිගෙන් ඇසුවේය. අනතුරුව, තමන්ට පහර දුන් බව රතු කුරුසයට නොකියන ලෙසට ඔහු රෝයිට අනතුරු හැඟවූයේය. රෝයි විසින් පාපොච්ඡාරණයකට අත්සන් තබන්නේ නම් ඔහු නිදහස් කරන බවත්, පාපොච්ඡාරණයටකට අත්සන් කළ පසු මෙවැනි පහරදීම් යළිත් සිදු නොවන බවත් හෙතෙම රෝයිට කීවේය. අදාළ ලිය කියැවිලි සාජන්ට් ආබ්ඩීන්ට සකස් කළ හැකි බවත්, පාපොච්ඡාරණයට අත්සන් තැබීමට රෝයි ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ බිරිඳ හා දරුවා අත් අඩංගුවට ගෙන රැඳවුම් මධ්‍යස්ථානය තුළම ඔවුන් සිරගත කිරීමට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන් කටයුතු කරන බව ද ඔහු කීවේය. තමන්ට නීතිඥයකු හමුවීමට අවශ්‍ය බව රෝයි, නිලධාරී ප්‍රසන්නට කී විට, "තමුන්ට නීතිඥයකු ගන්න බැහැ. කිසිම කෙනකුට මෙතැනදි තමුන්ට උදව් කරන්න බැහැ"යි ප්‍රසන්න පිළිතුරු දුන්නේය.

*ඇ) බූස්ස රැඳවුම් කඳවුරට මාරු කර යැවීම*

73. 2008 මැයි මාසයේ හෝ ඒ ආසන්න කාලයක, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට අයත්, දකුණු ශ්‍රී ලංකාවේ පිහිටි බූස්ස රැඳවුම් මධ්‍යස්ථානයට රෝයි මාරු කර යැවුණි. 2008 මැයි 11 වැනිදා, ඔහු මාරුකර යැවීමේ නියෝගයට අත්සන් කරන ලද්දේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, විත්තිකාර ගෝඨාභය රාජපක්ෂගේ යටත් නිලධාරියකු වූ අතිරේක ආරක්ෂක ලේකම් එස්. හෙට්ටිආරච්චි විසිනි. 2008 ජූලි මාසයේ අග භාගය වන තෙක් රෝයි එහි රඳවා තිබු .

74. බූස්සේදී, වැසිකිලියක් හෝ ජලය නොමැති කුඩා කුටියක රෝයි හුදකලාවේ සිරකොට තැබුණි. බෝතලයකට මුත්‍රා කිරීමටත්, ප්ලාස්ටික් බෑගයකට මළපහ කිරීමටත් රෝයිට බල කෙරුණි.

[5] UN Human Rights Council, Report of the Special Rapporteur on torture and other cruel, inhuman or degrading treatment or punishment, Manfred Nowak: mission to Sri Lanka, 26 February 2008, A/HRC/7/3/Add.6, available at: https://www.refworld.org/docid/47d683cf2.html.

75. රෝයි රඳවා තබාගත්තවුන් විසින් සෑම දිනකම ප්‍රශ්න කිරීම සඳහා ඔහුව ප්‍රශ්න කිරීමේ කාමරයට ගෙන යන ලදී. එහිදී, වෙනත් රැඳවියන්ට අමානුෂික වධහිංසා පමුණුවනු නරඹන්නට ඔහුට බල කෙරුණි. රැකවල්ලු සිරකරුවන්ව දෙපයින් එල්ලූහ. පෙට්‍රල් සහ මිරිස් කුඩු ප්ලාස්ටික් බෑග්වලට දමා, ඒවා සිරකරුවන්ගේ හිස වැසෙන සේ ගැට ගැසූ ඔවුහු අනතුරුව පයිප්ප බට සහ ලී මුගුරුවලින් ඔවුන්ට පහර දුන්හ. රැකවල් භටයන් විසින් කාන්තා රැඳවියන්ට පහර දී, පුලුස්සා, ලිංගික අතවර කරන ලදී. එකී සැළකුම් රෝයිටත් දෙන්නට ඔවුහු තර්ජනය කළහ.

*ඉ) බලහත්කාරී පාපොච්ඡාරණයන්*

76. 2008 ජූලි මස අග භාගයේදී, රෝයි කොළඹ වෛත්‍ය පාරේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ රැඳවුම් මධ්‍යස්ථානයට තාවකාලිකව යළිත් රැගෙන යනු ලැබුණි. එල්ටීටීඊ සංවිධානයේ ජාත්‍යන්තර ඔත්තු සේවා අංශයේ සාමාජිකයෙකැයි පාපොච්ඡාරණය කරන ලෙස රෝයිට පීඩනයක් එල්ල කෙරුණි. පාපොච්ඡාරණය නොකරන්නේ නම්, ඔහුගේ බිරිඳ අත්අඩංගුවට ගෙන ඇය බලහත්කාරී ලිංගික දූෂණයට ලක්කොට ඔහුගේ දරුවා මරා දමන බවට රෝයි රඳවා තබාගත්තවුන් විසින් ඔහුට තර්ජනය කරන ලදී. 2008 අගෝස්තු මාසයේ මුල දී, තම බිරිය තර්ජනයන්ගෙන් බේරාගනු පිණිස, තමන් එල්ටීටීඊ සංවිධානය වෙනුවෙන් නීති විරෝධී GPS උපකරණයක් ආනයනය කළ බවට ව්‍යාජ පාපොච්ඡාරණයක්, රෝයි ලීවේය. අනතුරුව හෙතෙම යළිත් බූස්ස රැඳවුම් කඳවුරට යවනු ලැබුණි.

77. බලපෑම් යටතේ ඔහුගෙන් ගත් පාපොච්ඡාරණය පදනම් කරගනිමින්, නීති විරෝධී ලෙස GPS උපකරණයක් ආනයනය කිරීම මගින් එල්ටීටීඊ සංවිධානයට ආධාර හා අනුබල දුන් බවට, 2008 නොවැම්බර් 4 වැනිදා හෝ ආසන්න දිනක දී රෝයිට එරෙහිව චෝදනා ගොනු කෙරුණි. ඇප ලබාදීම හෝ ස්වාධීන නඩු විභාගයක් නොලද අවුරුදු තුනක රැඳවුම් කාලයකින් පසු, වරද පිළිගැනීමේ එකඟතාවකට රෝයිගේ නීතිඥයා විසින් කේවල් කරන ලදී. තම පවුලේ අයට එරෙහි වධහිංසා හා තර්ජනයන් නවතනු පිණිස, GPS උපකරණයක් තමන් සන්තකයේ තබාගැනීම සම්බන්ධයෙන් 2010 අගෝස්තු 19 වැනිදා වරද පිළිගත් රෝයි ශ්‍රී ලංකා රුපියල් 500,000ක (ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් 2,680ක් වූ) දඩ මුදලක් ගෙවා දැමුවේය. ඔහුට එරෙහි අවශේෂ චෝදනා අත්හැර දැමුණි. 2010 අගෝස්තු 27 වැනිදා, රෝයි රැඳවුම් භාරයෙන් නිදහස් කර යැවුණි.

78. 2010දී රෝයි රැඳවුම් භාරයෙන් නිදහස් කිරීමෙන් පසු දේශීය පුවත්පතකට සිය කතාව රෝයි විසින් කියන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් රෝයිගේ ඥාතීන්ට රටෙන් පිටවීමට අවශ්‍ය පොලිස් සහතිකය ලබාදීම ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

## III. රමේෂ් තේවරාජන්ට සිදුකළ වධහිංසා

79. ශ්‍රී ලාංකික දෙමළ සම්භවයක් ඇති රමේෂ් තේවරාජන්, 2000 වකවානුවේ මානවවාදී සංවිධානවල සේවය කළ අයෙකි. ඔහුගේ පවුලේ අය ඒ වන විටත් දුක් පීඩා විඳ ඇති හෙයින් ඔහු දේශපාලනයෙන් ඉවත් වී සිටීමට අදිටන් කරගෙන සිටියේය.

80. මානවවාදී සංවිධානයක කටයුතු කළ තම ආරක්ෂාව පිළිබඳව රමේෂ් මුලින්ම භීතියට පත්වූයේ 2006 දී ප්‍රංශ රාජ්‍ය නොවන සංවිධානයක් වන ඇක්ෂන් අගේන්ස්ට් හන්ගර් සංවිධානයේ දෙමළ කාර්ය මණ්ඩල සාමාජිකයන් 17 දෙනකුගේ කුප්‍රකට ඝාතනයෙනි. මානව හිමිකම් සංවිධාන සමග කළ වැඩ කටයුතු නිසා තමන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඉලක්කයක් වනු ඇති බවට ඔහු බිය පත්ව සිටියේය. ඉන් එක් සංවිධානයකට අරමුදල් සපයන ලද්දේ එක්සත් ජනපද ආණ්ඩුව විසිනි.

81. 2008 වසරේ වසන්තයේදී රමේෂ් නිවෙසින් පිටව සිටියදී අංක තහඩු නොමැති සුදු වෑන් රියකින් පැමිණි ආරක්ෂක අංශ නිලධාරීන් පිරිසක් ඔහු සොයා පවුලේ අය හමුවී තිබේ. රමේෂ් සැඟවී ගත්තේය.

82. 2009 දී අත්අඩංගුවට ගන්නා ලද ඔහු "හතරවැනි තට්ටුව" ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රකට, කොළඹ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලස්ථානය වෙත ගෙනයන ලදී.

83. රඳවා සිටි මුළු කාලය පුරාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේත්, වෙනත් ආරක්ෂක සේවාවලත් නිලධාරීන් විසින් රමේෂ් එල්ටීටීඊ සංවිධානයට ආධාර කළ බවට බොරු චෝදනා නගමින් දිගින් දිගටම ප්‍රශ්න කරනු ලැබුණි. ඔහු ගැන ලිපි ගොනුවක් තබාගෙන සිටි ප්‍රශ්න කරන්නෝ සටහන් තබා ගත්හ.

### *අ) ධර්ම චක්‍රය: CID පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා විසින් වධ දෙනු ලැබීම*

84. අත්අඩංගුවට ගෙන දින කීපයක් ගතවෙද්දී විශේෂ කාමරයකට රමේෂ් ගෙනගිය රැකවල්ලු ඔහුට සරම ගලවා යට ඇඳුමින් පමණක් සිටින ලෙස බල කළහ. කාමරය මස් මඩුවක් සේ ගඳ ගසන්නකි. සිවිලිමේ යකඩ කොකු වලින් කඹ එල්ලා තිබූ අතර බිත්තිවල ලේ පැල්ලම් තිබුණි.

85. කාමරයේ ප්‍රශ්න කරන්නන් දෙදෙනකු විය: එක් අයෙක් සද්දන්ත පුරුෂයකු වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වායි. රමේෂ්ගේ දණහිස් යටින් යවනු ලැබූ පොල්ලකට යටින් දැත් යවා හිස පහලට සිටින සේ එල්ලා ධර්මචක්‍ර සෙයියාවෙන් දීර්ඝ කාලයක් හිඳින්නට බල කරන ලදී. රමේෂ් සිය කතාව නැවතත් සම්පූර්ණයෙන්ම විස්තර කරද්දී “දැන් ඇත්ත කියපන්!” යයි නිශාන්ත අනතුරු ඇඟවීය. නිශාන්ත ඉන්පසු රමේෂ්ගේ පතුල්වලට මුගුරකින් පහරදුන් අතර එය මහත් වේදනාකාරී විය. හඬන්නට පටන්ගත් රමේෂ් තමන්ට ඒ වේදනාව දරාගත නොහැකි බව නිලධාරියාට පැවසීය. ඔහුගේ පිටට, කකුල්වලට සහ අත්වලට පොල්ලකින් පහර දීමේ ප්‍රතිපලය වූයේ අතැ’ඟිලි කළු ගැසීමයි. සිර කුටියට ආපසු ගෙනවිත් දමනු ලැබූ ඔහුට සිය කතාව ගැන ඊළඟ ප්‍රශ්න කිරීමට පෙර නැවත සිතා බලන ලෙස කියන ලදී.

86. පසුව රමේෂ් එම වධක කුටියටම තවත් සවසක ගෙනයන ලදී. නැවත වතාවක් ප්‍රධාන වධකයා වූයේ නිශාන්තයි. තවත් නිලධාරීහුද එහි සිටියහ. රමේෂ්ගේ සකල ශරීරයම පොල්ලකින් තලන ලදී. හිස සහ මුහුණ ආරක්ෂා කර ගැනීම සඳහා අත් එසවූ ඔහුගේ දකුණු අතේ මැණික් කටුව තුවාල වූ අතර අදත් ඔහුට ඒ අතින් බර දෙයක් ඔසවාගෙන යා නොහැකිය. ඝන ෆයිල් මිටියක් ඔහුගේ හිස මත තැබූ පොලිස් නිලධාරීහු ඒ මතට තඩි බැහ. කරකැවිල්ල හැදී මද වෙලාවක් සිහි නැතිවූ ඔහු පසුව දුටුවේ තමන් අවට ලේ ගලාගොස් තිබුනු ආකාරයයි.

87. රඳවාගෙන සිටියදී ගුටි බැට දීම සහ ප්‍රශ්න කිරීම දිගටම සිදු කරණ ලදී: තවත් අවස්ථාවක වෙනත් ප්‍රශ්නකරුවන් කණ්ඩායමක් පෙට්‍රල් පෙඟවූ ප්ලාස්ටික් මල්ලකට ඔහුගේ හිස ඔබා හුස්ම හිර කළහ.

88. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න කිරීම්වලදී රමේෂ් වාචික පරිභවයටද මුහුණ දුන්නේය: ඒ අතර පොලිස් නිලධාරියෙක් මෙසේ කී අවස්ථාවක්ද විය: “අම්මට හුකන්න හුත්තිගේ පුතා. තමුසේ බබා හුකුම් එපා”.

### *ආ) රාජ්‍ය බුද්ධි සේවය විසින් වධ දෙනු ලැබීම*

89. පසුව 2009 දී, බස් රියකට පටවනු ලැබූ රමේෂ් බූස්ස රැඳවුම් කඳවුරට මාරු කර යවන ලදී. ලියාපදිංචි කරන කලාපයේදී ඔහු නිරුවත් කර සෝදිසි කරන ලදී. ඉන් අනතුරුව ඔහු සිර කුටි පෙළක රඳවා තබන ලදී. රමේෂ් බූස්ස කඳවුරේ මාස ගණනාවක් සිරකර තබා තිබුණි.

90. ඒ කාල සීමාව තුළදී, රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීන් ලෙස තමන් හඳුන්වාගත් පිරිසක් විසින් ඔහු ප්‍රශ්න කර වධහිංසාවට ලක් කරනු ලැබුණි. ප්‍රශ්න කිරීම ආරම්භ වන විට, රමේෂ්ගේ ලිපි ගොනුව අතැ’තිව සිටි ප්‍රධාන ප්‍රශ්න කරන්නා, ඔහු “හතරවැනි තට්ටුවේ” දී ප්‍රකාශ කළ දේ පිලිබඳ විස්තර එයින් දැන සිටියේය.

91. ප්‍රශ්න කරන අවස්ථාවලදී රාජ්‍ය බුද්ධි සේවා නිලධාරීහු රමේෂ්ට ඝනකම් ලී පිත්තකින් පහර දුන්නෝය. එක් අවස්ථාවකදී ප්‍රධාන ප්‍රශ්න කරන්නා රමේෂ්ගේ හිස බිත්තියේ අනිමින් “මට කියපං! මට කියපං!” යනුවෙන් මොර දුන්නේය. තවත් අවස්ථාවක දී රමේෂ්ගේම ටී ෂර්ටය ඔහුගේ ගෙල වටා ඔතා හිරකරන්නට උත්සාහ කළේය. උල් මතුවන සේ ලෑල්ලක ගසා තිබූ ඇන මත ඔවුහු එක් අවස්ථාවක රමේෂ් බලහත්කාරයෙන් දණ ගැස්වූහ. දණ ගසා සිටියදී නිලධාරියකු ඔහුගේ හිසට තඩි බෑම නිසා හම පසාරු කරගෙන ඇන ගිලා බැස්සේය. රමේෂ්ගේ වෘෂණ කෝෂ තදින් මිරිකමින් නිලධාරීහු ඔහු ලිංගික හිංසනයටද ගොදුරු කළෝය.

92. මේ ප්‍රශ්න කිරීම්වලදී, “හුත්තිගේ පුතා”, “එල්ටීටීඊ කැරියා” සහ “තමුසේ මරලා දාන්න තිබ්බේ” වැනි අවමාන සහගත, ලිංගික ඇඟවුමක් සහිත අපහාසද නිලධාරීන් විසින් රමේෂ්ට එරෙහිව යොදා ගන්නා ලදී.

93. කලක් ගතවීමෙන් පසුව ඔහු නැවතත් “හතරවැනි තට්ටුවට” මාරුකර යවන බව මුරකරුවන් විසින් රමේෂ්ට දැනුම් දෙන ලදී. නිලධාරියකු විසින් දෙනලද පාපොච්චාරණයකට අත්සන් කරන්නට රමේෂ්ට බල කරන ලදී. බලහත්කාරයෙන් ලබාගත් පාපොච්චාරණය පසුව ඔහුට විරුද්ධව චෝදනා ගොනු කිරීමට යොදාගන්නා ලදී. මේ වන විට ඔහු සිටියේ වැහැරී ගොස්, සියදිවි නසාගන්නා මනෝභාවයකිනි.

94. වධහිංසා කිරීමේදී පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා දැරූ භූමිකාව බලධාරීහු දැන සිටියහ. කෙසේවෙතත්, වධහිංසාව සම්බන්ධයෙන් ඔහු දැරූ භූමිකාවට අදාලව ඔහුට කිසි විටෙකත් නඩු පවරා හෝ විනයානුකූල දඬුවමක් දී හෝ නැත. ඒ වෙනුවට මහින්ද රාජපක්ෂ ආණ්ඩුවත්, වර්තමාන ආණ්ඩුවත් යටතේ ඔහුට අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවේ උසස්වීම් දී තිබේ. වර්තමානයේ ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සංවිධිත අපරාධ අංශය භාර නිලධාරියා ලෙසින් මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය ඇතුළු මානව හිමිකම් නඩුකර සම්බන්ධ විමර්ශන මෙහෙයවයි. මානව හිමිකම් උල්ලංඝනය කරන්නන් නෛතික වශයෙන් වගවීමෙන් බැඳ තබන්නට තමන් වෙත ඇති අභිලාශය හා ශක්‍යතාව ගෙනහැර දැක්වීමට උදාහරණ ලෙස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කර ඇත්තේ මේ නඩු ය.[6]

95. රමේෂ්ට එරෙහි චෝදනා පසු කලෙක අතහැර දමන ලද අතර ඔහු තම ජීවිතාරක්ෂාව පිළිබඳ බියෙන් ශ්‍රී ලංකාව හැර පලා විත් විදේශයක දේශපාලන රැකවරණ පැතීය. එතැන් පටන්, ඔහුගේ පවුලේ සාමාජිකයන්ට දිගින් දිගටම සිදුවන පොලිස් අඩන්තේට්ටම් හා තර්ජනවලට මුහුණ දෙන්නට සිදුවී තිබේ. ඔහු නිදහස් කිරීමෙන් පසු, ඔහු ඉන්නා තැන සොයා ගැනීමට වෙහෙසෙන නිලධාරීන් විසින් පවුලේ සාමාජිකයන්ගෙන් ප්‍රශ්න කර ඇති අතර ඔහු සිටින ස්ථානයක් හෙළි නොකළොත් නරක පලවිපාක විඳින්නට සිදුවනු ඇති බවට තර්ජනය කර තිබේ. අඩන්තේට්ටම් දිගටම සිදු කෙරෙමින් පවතී. තවත් අවස්ථාවක, 2018 අගදී, රමේෂ් පිළිබඳ තොරතුරු සොයාගැනීමේ අපේක්ෂාවෙන් පොලිස් නිලධාරීන් විසින් ඔහුගේ නිවස සෝදිසි කරන ලදී.

96. අද වනතුරුත්, ඔහු මහත් ශාරීරික වේදනාවෙන් සහ දිගුකල් පවතින මානසික ක්ෂතියෙන් පීඩා විඳියි. බියකරු සිහින පෙනෙන ඔහුට ශ්‍රී ලංකා පොලිසිය හමුවූ ඒම පිළිබඳ නපුරු මතක ආවර්ජනය වෙයි. පූර්ණකාලීනව රැකියාවක නිරත විය නොහැකි ඔහු තවමත් භෞතචිකිත්සා ප්‍රතිකාර ලබමින් සිටියි.

# IV. ශාන්ති පත්මනාදන්ට සිදු කළ වධහිංසා

*අ) ලංකාවට පැමිණීම*

97. ශ්‍රී ලංකාවේ යුද්ධය 2009 දී අවසන් වනවිට ශාන්ති පත්මනාදන් උසස් අධ්‍යාපනය ලබන පාසල් සිසුවියකි. ඉන් සමත්වී ඇය ව්‍යාපාර අධ්‍යයනය සඳහා බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයකට ඇතුලත් වූවාය. බ්‍රිතාන්‍යයේදී ඇයට හමුවූයේ ශ්‍රී ලංකාවේ දෙමළ තරුණියක් ලෙසින් කිසිදා නොලබන අත්දැකීමකි. ඒ, දෙමළ ජනතාවට සිදුවන අකටයුතුකම් ගැන දඩුවමට ලක්වීමේ බියෙන් තොරව උද්ඝෝෂණය කරන්නට ලැබෙන පරිසරයයි. ජනාධිපති මහින්ද රාජපක්ෂ ලන්ඩන් නුවරට පැමිණි අවස්ථාවේත්, ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවට එරෙහිව සිදුකරන ලද යුද අපරාධ චැනල් 4 රූපවාහිනියෙන් ප්‍රදර්ශනය කළ අවස්ථාවේත්, ඇය වෙනත් දෙමළ පිරිස් සමග උද්ඝෝෂණ වලට සහභාගි වූවාය.

98. 2012 අගභාගයේදී ශාන්ති සිය පවුලේ උදවිය දැකබලා ගැනීම පිණිස තවත් ඥාතිවරියක් සමග ශ්‍රී ලංකාවට ගියාය. ඔවුන් ගුවන් තොටුපලේදී සිය ගමන් මලු රැස්කරගත් වහාම උරහිසට තට්ටු කර කාමරයකට ඇදගෙන ගොස් නිල ඇඳුම් හැඳගත් පොලිස් නිලධාරීන් විසින් ප්‍රශ්න කරන ලදී. ඔවුන්ගේ කොළඹ ලිපින ලියා ගැනීමෙන් අනතුරුව, නිලධාරීහු ඔවුන්ට යාමට ඉඩ හළහ.

99. එදා රාත්‍රියේ මහත් ශබ්දයක් නගමින් පිරිමි හතරදෙනෙක් ශාන්තිගේ මහගෙදරට කඩා වැදුනෝය. හැඳුනුම්පත් පෙන්නමින් ඔවුන් කියා සිටියේ තමන් පොලිස් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙන් (TID) පැමිණි බවය. නිවැසියන්ගේ හැඳුනුම් පත් සහ නිවස පරීක්ෂා කිරීමෙන් පසු ශාන්ති සහ තවත් ඥාතිවරියක්, මාංචු ලා, හඬමින්, කෑ මොර දෙද්දී අංක තහඩු නොමැති සුදු වෑන් රියකට බලහත්කාරයෙන් පටවාගෙන වාහනයේ බිම ඉන්දවන ලදී. අත්අඩංගුවට ගැනීමට විරෝධය පෑ ශාන්තිගේ පියා පහරදී බිම හෙලන ලදී. වාහනය තුළදී එක් නිලධාරියෙක් ශාන්තිගේ මුහුණට දැඩි අතුල් පහරක් දී, ඇගේ කකුලට බූට් සපත්තුවෙන් පා පහර දුන්නේය. තරුණ කාන්තාවන් හඬමින් පැහැදිලි කළේ ඔවුන් පවුලේ අය බලන්නට පැමිණ සිටි බවයි. නිලධාරීන් ඔවුන්ට කතා කළේ 'කොටියා' කියමිනි.

*ආ) ගල්කිස්ස පොලිස් ස්ථානයේ බිහිසුණු අත්දැකීම*

100. යුවතියන් දෙදෙනා ගල්කිස්ස පොලිස් ස්ථානයට රැගෙන ආ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ නිලධාරීන් විසින් එහිදී ඔවුන් වෙන් කරන ලදී. නිලධාරියකු වෙත ශාන්ති ගෙනයන ලදුව ඔහු ඇගේ හැඳුනුම්පත ප්ලාස්ටික් සාක්ෂි කවරයක බහා, ඇඟිලි සලකුණු ගෙන ඇගේ ඡායාරූප ගත්තේය. ඉන්පසු මුරකරුවන් විසින් කුටියකට

---

[6] *බලන්න:* Report of the UN High Commissioner for Human Rights, *Promoting reconciliation, accountability, and human rights in Sri Lanka*, UN Doc. A/HRC/40/23, para. 47 Feb. 8, 2019, https://documents-dds-ny.un.org/doc/UNDOC/GEN/G19/029/25/PDF/G1902925.pdf.

ගෙනගොස් මාංචු ගලවන ලදී. ඇගේ ඇඳුම් ගලවන ලෙස ඔවුහු කැඩුනු දෙමළෙන් අණ කළහ. ඇගේ ඇඳුම රැගත් ඔවුන් කට්ට කළුවර කාමරයක ඇය අගුලු දමා ගියේ යට ඇඳුම් පමණක් හැඳ සිටියදීය.

101. තවත් මුරකරුවන් දෙදෙනකු විසින් පැය කීපයකට පසු සිර කුටියෙන් පිටතට ගත් ශාන්ති කොරිඩෝවක් දිගේ කැඳවාගෙන යන ලදී. ගිනියම් රස්නය නිසා හඬමින් වතුර ඉල්ලා සිටින දෙමළ ගැහැණු හඬවල් වෙනත් කුටිවලින් ඇයට ඇසුණි. මුරකරුවන් ඇය රැගෙන ගියේ ප්‍රතිදීප්ත බල්බයකින් එළිය කෙරුනු ජනේලයක් රහිත කාමරයකටය. ලිපි ගොනුවක් රැගත් නිලධාරියකු මේසයක් අසල හිඳගෙන සිටි අතර ඇය කැටුව ආ මිනිසා කාමරයේ රැඳී සිටියේය. කාමරයෙන් දුගඳ වහනය වූ අතර, ලේ විලස දිස්වුනු වියලී ගිය කළු පැල්ලම් දකින්නට ලැබුනි. සිවිලිමේ බොලොක්කයකින් දම්වැලක් එල්ලුනු අතර, කාමරයේ කෙළවරක පොලු කිහිපයක් තිබුණි.

102. ශාන්තිගේ අත් මාංචුවකින් දම්වැලට හිරකළ මිනිස්සු ඇගේ දෙකකුල් පොළොවෙන් උඩ පැද්දෙන තෙක් දම්වැලින් ඇද එසැවූහ. ඇගේ ශරීරයේ සියලු බර දරා සිටි යකඩ මාංචු මැණික් කටුව කාගෙන සිටියේය. ඇය හැඳ සිටියේ යට ඇඳුම් පමණි. ඇය එල්ටීටීඊ සංවිධානය වෙනුවෙන් වැඩ කරන බවට ඔවුහු කැඩිච්ච දෙමළෙන් ඇයට චෝදනා කළහ. මුරකරුවෝ බර යමක් පුරවන ලද ප්ලාස්ටික් බට අතට ගත්හ. ඉන්පසු ඇය සිවිලිමේ එල්ලෙමින් සිටියදී සිහි නැති වන තුරුම ඔව්හු ඇයට පැයක් පමණ වේලා පහර දුන්හ.

103. රඳවා සිටි කුටිය තුලදී පසුව ඇයට සිහිය එද්දී ඒ දවල්ද, රෑද කියා ශාන්ති නොදත්තීය. එහෙත් ඇයට නින්ද යාම වලකනු පිණිස මුරකරුවෝ දොරට මහ හඬින් තඩි බෑහ.

104. සති තුනක පමණ කාලයක්, මේ ආකාරයට, සෑම දිනකම ශාන්තිගෙන් ප්‍රශ්න කරන ලදී. ඇගේ කාමරයට නිලධාරීන් දෙදෙනෙක් ඇතුල් වෙති. බොහෝවිට ලිංගිකව ඇය අතපත ගාන ඔවුහු, ඊළඟට ප්‍රශ්න කරන කාමරයට ගෙනගොස්, ලිපිගොනුව සමග මේසය අසල සිටින නිලධාරියාට මුණ ගස්වති. සිංහලෙන් එකිනෙකා හා කතා කරමින්, ඇයට කැඩුනු දෙමළෙන් කතා කරන ඔවුහු ඇය ගැන සල්ලාල ලිංගික කියමන් දොඩති. හැම අවස්ථාවකම ඇය සිරකුටියට ආපසු ගෙනෙනු ලැබුවේ සිහි මූර්ඡාවෙනි.

105. පළමු තුන් අවස්ථාවලදී ශාන්තිට දම්වැලින් එල්ලා පහර දෙන ලදී. හතරවැනි දිනයේ ඇය බලහත්කාරයෙන් පොළොවේ හොවා තැබූ පොලිස් නිලධාරියෙක් ඔහුගේ බූට් සපත්තු දැමූ කකුල ඇගේ ගෙළ පිටුපසට තැබීය. ලිපි ගොනුවකින් ඡායාරූපයක් එළියට ගත් ඔවුහු ඇයට ඒ දෙස බලන්නට සැලසූහ. එය බ්‍රිතාන්‍යයේ උද්ඝෝෂණයකට ඇය සහභාගී වී සිටින ඡායාරූපයකි. එහි සිටින අනික් අයගේ නම් කියන ලෙස ඇයට බල කරන ලදී. ඔවුන්ගේ නම් නොදන්නා බව ඇය පැවසූ විට, රත් පැහැ ගැන්වෙන තුරු ගිනියම් කළ යකඩ පොල්ලක් ගෙනා ඔවුහු එය ඇගේ පිටට තබා තද කළහ. ඔවුන් කවුදැයි නොදන්නා බව කියමින් ඇ ළතෝනි දුන්නාය. ඇයට සිහි නැතිවන තුරු ඔවුහු රත්වූ යකඩය දිගින් දිගටම ඇගේ පිටට තබා තද කළහ. ඉන් පසු ගතවූ දින කිහිපයේදීම ඔවුන් විසින් මෙයාකාරයෙන් ඇය හංවඩු ගසන ලදී.

106. පළමු හංවඩු ගැසීමෙන් පසු එක් අවස්ථාවකදී නිලධාරියෙක් ශාන්තිගේ සිරකුටියට ඇතුල් විය. කුටියේ දොරට අල්ලා ඇගේ දෑත් වලට මාංචු දැමූ ඔහු ඇගේ කම්මුලට ගැසීය. දල්වන ලද සිගරට්ටුවක් කිහිප වතාවක් ඇගේ කලවා වල ඔබන ලදී. පිලිස්සීමෙන් බේරීම සඳහා ශාන්ති දඟලන විට ඇගේ කකුල හිර කරගෙන කලවට සිගරට්ටුව එබීය. ඉන් අනතුරුව ශාන්තිගේ යට ඇඳුම් ගැලවූ ඔහු තම කලිසම ගලවා යෝනි මාර්ගයට පුරුෂ ලිංගය රිංගවා ලීය. ඊට පසු දෙවතාවක්ම ඇගේ සිරකුටියට පැමිණි ඔහු එයාකාරයෙන්ම ඇය දූෂණය කළේය. එක් වතාවක් ඔහු සිය ඇඟිලි ගුද මාර්ගයේ යවන්නට උත්සාහ කළ විට එය වලක්වාලන්නට ඇය සමත් වූවාය. ඔහු ඇගේ පියයුරු මිරිකීමද, සැපීම ද කළේය.

107. එම නිලධාරියා විසින්ම ප්‍රශ්න කරන අවස්ථාවලදී ලිංගික වශයෙන් ඇය අවමානයට පත් කරන ලදී. තමන් විසින් ඇයට කරන ලද ලිංගික ක්‍රියා ඇයට පහර දෙන අවස්ථාවලදී ඔහු අනිකුත් නිලධාරීන්ට විස්තර කළේය. ඔවුන් සිංහලයන් වුවද, ඔහු කතා කළේ කැඩුනු දෙමළෙනි. ඒ ඇයට තේරුම් යනු පිණිසය. පහර දෙන අවස්ථාවලදී අනිකුත් නිලධාරීන් ඇගේ පියයුරු මිරිකූහ. යෝනිමුඛය බලහත්කාරයෙන් ඇල්ලූහ.

108. එල්ටීටීඊ සාමාජිකයන් ලෙස සැක කරනු ලබන්නන් ඇය ලවා හඳුනා ගැනීමට ප්‍රශ්න කරුවෝ යොමුවන්නට පටන් ගත්හ. ඇය විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබූ කල, නිලධාරින් ඇයට දඬුවම් කළේ මහත විදුලි රැහැන් වලින් ඇගේ පිටට කස පහර දීමෙනි. ඇගේ ඉලය වටා දහ කැවෙන රැහැන වේදනා දෙමින් පපුවට වදී. දෙවතාවක් මුහුණ වසා පොලිස් ස්ථානයෙන් පිටත ජනාකීර්ණ තැනකට ගෙනයනු ලැබූ ඇයට වෙනත් දෙමළ ජාතිකයන් හඳුනා ගන්නා ලෙස කියන ලදී.

109. කලක් ගතවූ පසු නිලධාරීහු පාපොච්චාරණයකට අත්සන් කිරීමට ශාන්තිට බල කළහ. පළමු පිටුව වූයේ සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් ලියා තිබූ පෝරමයකි. එහි ඇගේ පුද්ගලික විස්තර විය. අනික් පිටු ඇයට කියවා ගත නොහැකි සිංහලෙන් අතින් ලියන ලද ඒවාය. අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ විට, මිරිස් කුඩු දැමූ ප්ලාස්ටික් උරයක් ඇගේ හිසේ නවා, එය බෙල්ල වටේ බඳින ලදී. හුස්ම හිරවී දඟලන්නට පටන් ගත් විට උරය ඉවත් කරන ලද පසු ඇය අත්සන් කළාය.

*ඇ) පොලිස් පළිගැනීම්: 'ඇගේ බල්ලා මැරූ විදියටම අපි ඈ මරා දමන්නෙමු'*

110. සති තුනක් පමණ කල් ගතවූ පසු එක් දිනක, ඇගේ ඇඳුම රැගෙන කුටියට ආ නිලධාරීන් දෙදෙනෙක් එය ඇඳගෙන ඔවුන් පසුපස එන ලෙස කීවෝය. ඔවුහු ගොඩනැගිල්ලෙන් පිටත නවතා තිබූ වෑන් රියකට ඇය ගෙන ගියෝය. ඉන්පසු ඇගේ හිස ගෝනියකින් වැසූහ. ඇයට සිතුනේ මරන්නට ගෙනියන බවය. ඒ වෙනුවට සිදුවූනේ මුදල් දී ඇය නිදහස් කරගනීම සඳහා පවුලේ සාමාජිකයන් විසින් සම්බන්ධ කරගන්නා ලද අයකුට ඇය බාර දෙනු ලැබීමය. ශ්‍රී ලංකාව හැර පලා ආ ඇය යලිත් කිසි දාක ආපසු නොගියාය.

111. ශාන්ති ශ්‍රී ලංකාව හැර ආදා පටන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් ඇගේ පවුලේ සාමාජිකයන් භීෂණයට පත් කරන ලදී. පවුලේ එක සාමාජිකයකු අත් අඩංගුවට ගත් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් දහ දොළොස් වාරයකට වඩා ඇගේ නිවස පරීක්ෂා කරන ලදී. පැටි කල සිට හදා වඩාගත් සුනඛයා නිලධාරීන් විසින් මරා දමන ලදී. ශාන්ති හමුවූ විටෙක බල්ලා මරා දැමූ ආකාරයටම ඇයත් මරා දමන බවට ඔවුහු පවුලේ අයට අනතුරු ඇඟවූහ.

112. ඈ විඳි වධ වේදනාවේ ශාරීරික හා මානසික පීඩාවෙන් අදත් පෙළෙන ඇගේ සිරුර පුරා හංවඩු කැළැල් තිබේ.

113. ශාන්තිට විරුද්ධව කිසිවිටෙකත් අපරාධ නඩුවක් පවරා නැත.

## V. සුරේෂ් ජෙයබාලන් වධහිංසාවට ලක්කිරීම

*අ) යුද අපරාධ සාක්ෂි බේරාගැනීම*

114. සුරේෂ් ජෙයබාලන් ශ්‍රී ලාංකික දෙමළ ජාතිකයෙකි. 2007 දී එල්ටීටීඊ සංවිධානයට බැඳෙන්නට ඔහුට බල කෙරුණු අතර ඔහු රැකියාව කළ පුණ්‍යායතනයක ඔත්තුකරුවෙක් ලෙස වැඩ කිරීමට නියෝග කෙරුණි. ඔහුගේ කාර්යය වූයේ ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් ඔත්තු බැලීමට සඳහා ඇතුල්වන්නන් පිළිබඳ නිරීක්ෂණය කිරීමයි.

115. දෙමළ ජනගහණයට එරෙහි මානව හිමිකම් උල්ලංඝනයන් හා සිවිල් ජනයාට වන හානි පිළිබඳ ලේඛනගත කිරීමේ වැදගත් භූමිකාවක් මෙකී පුණ්‍යායතනය විසින් ඉටු කරන ලදී. 2009 යුද්ධය කූඨ ප්‍රාප්තිය කරා ළඟා වන වකවානුවේ ශ්‍රී ලංකා යුද හා ආරක්ෂක සේනාවන් විසින් සිදුකරන යුද අපරාධ පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම සුරේෂ් විසින් සිදු කළේය. අදාළ පුණ්‍යායතනය මෙකී තොරතුරු ලොව පුරා මානව හිමිකම් සංවිධානවලට හා ආගමික අධිකාරීන්ට සන්නිවේදනය කළේය.

116. ආණ්ඩුවේ ආරක්‍ෂක සේනා විසින් කාර්යාල අංගනය අත්පත් කරගැනීමට පෙර ලිපි ලේඛන ඉවත්කර ගැනීමට සුරේෂ් සහ වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයෝ දිව ගියහ. වින්දිතයන්ගේ සේයා රූ, ජීවිත හානි පිළිබඳ වාර්තා සහ යුද අපාරධ පිළිබඳ වෙනත් සාක්ෂි ඇතුළු මෙම වාර්තා සුරේෂ් විසින් වළලා දමන ලදී. මානව හිමිකම් උල්ලංඝනයන් තමන් විසින් ලේඛනගත කරන බව දැනගතහොත් ආණ්ඩුව තමන්ගෙන් පළිගනු ඇතැයි සුරේෂ් සහ ඔහුගේ කාර්ය මණ්ඩල සගයන් බියවූහ. සුරේෂ් තමන් සන්තකයේ වූ ඇතැම් පෞද්ගලික දෑ මෙන්ම එල්ටීටීඊට අයත් දෑද වළලා දැම්මේය.

117. 2009 වසන්තයේදී, සිය නිවසින් අවතැන් වූ හෙතෙම සිවිල් ජනයාට එරෙහි යුද හමුදාවේ වග විභාගයකින් තොර ප්‍රහාරයන්ගෙන් ගැළවෙනු පිණිස දස දහස් සංඛ්‍යාත අවශේෂ සිවිල් වැසියන් සමග පලා යමින් සිටියේය. අවසානයේදී 2009 මැයි මාසයේ, ඔහු සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් සෙසු දෙමළ ජනයා සමග වඩ්ඩුවාකල් පාලම තරණය කර යුද හමුදාවට බාර වූහ.

118. සුරේෂ් සහ ඔහුගේ දෙමාපියන් අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා වූ කඳවුරක මාස කිහිපයක් රඳවා තබා අනතුරුව නිදහස් කරනු ලැබුණි. යුද්ධය අවසන්ව, එල්ටීටීඊ සංවිධානය විනාශ වූ තත්ත්වයක් තුළ ඔහු නව දිවියකට මුල පිරුවේය: යුද්ධය විසින් අහිමි කළ කාලය හඹා අල්ලාගනු පිණිස, දැවුරුද්දක හැදෑරීම් කටයුතු එක්

වසරකින් නිමා කරමින් ඔහු සරසවි උපාධියක් සම්පූර්ණ කළ අතර පරිගණක දත්ත කළමනාකරණය පිළිබඳ රැකියාවක් ද ලැබුණි.

## *ආ) 'හතරවැනි තට්ටුවේදී' වධහිංසා*

119. 2011 අග භාගයේදී, සිය නිවස බලා ඇවිද යමින් සිටිය දී සිවිල් හැඳගත් පොලිස් නිලධාරීන් සිව් දෙනකු විසින් සුරේෂ් පැහැරගන්නා ලදී. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) බව දැක්වෙන ස්වකීය හැඳුනුම්පත් ඔහුට පෙන්වූ ඔවුහු ඔවුන්ගේ ලෑන්ඩ් කෲසර් රථයේ පසුපසට ඇද දමාගත්තේය. දෑත් හා දෑස් බැඳ, කොළඹ 'හතරවැනි තට්ටු' ගොඩනැගිල්ලට රැගෙන යනු ලැබූ ඔහු, එහි ළඟා වූ සැණින් ඡායාරූප ගත කෙරුණි. රාත්‍රිය ඔහු සිර කුටියක ගත කළේය.

120. පසුදා, නිලධාරීන් දෙදෙනෙක් වාඩි වී සිටි මේසයක් සහිත කාමරයකට සුරේෂ් කැටුව යන ලදී. ඒ වනාහී ඔහු අත්අඩංගුවට ගත් පුද්ගලයන්ම විය. ඔහු පිළිබඳ පෙර සූදානම් කරගත් ලිපි ගොනුවක්ද, හඬ පටගත කිරීමේ යන්ත්‍රයක් ද ඔවුන් රැගෙන විත් තිබු . ඔවුහු ඔහුගේ පවුල පිළිබඳව හා ඔහුගේ දිවියේ තතු කාලානුක්‍රමිකව ප්‍රශ්න කර සිටියේය. එක් නිලධාරියෙක් සටහන් තබාගත්තේය. අනතුරුව සුරේෂ් පෙරළා සිර කුටිය තුළට යවනු ලැබුණි. දින කිහිපයක් ඇවෑමෙන් ඔහුගෙන් යළිත් ප්‍රශ්න කෙරුණි.

121. සති කිහිපයකට පසු, කෙළවර වැස්මක් සහිත ලෝහ මුගුරක් ද, සිවිලිමේ සවිකළ ලෝහමය දණ්ඩක් ද, දිග පටු බංකුවක් ද ඇතුළු වධ හිංසා සඳහා සූදානම් කළ වෙනත් කාමරයකට ඔහු රැගෙන යනු ලැබුණි. ඔහු අත්අඩංගුවට ගත් අයකු ද ඇතුළු නිලධාරීන් දෙදෙනකු ඔහු එනතුරු රැඳී සිටියහ. ඔවුහු ඔහු යට ඇඳුම දක්වාම නිරුවත් කර, ඔහුගේ දෑත් සිවිලිමේ වූ යකඩ දණ්ඩකට තබා ගැට ගැසූහ. බියට පත් සුරේෂ්, තමන් දන්නා සියලු දෑ හෙළිකළ බව පැහැදිලි කරමින් හඬා වැටුණේය. තමන් දන්නා සම්පූර්ණ ඇත්ත හෙළිකරන මෙන් අවධාරණය කරමින්, ඉන් එක් නිලධාරියකු මුගුරකින් ඔහුගේ පසුපසට ද, ප්ලාස්ටික් වැස්මක් සහිත වයරයකින් ඔහුගේ දෙපාවලට ද පහර දුන්නේය. එක් ත්‍රස්ත විමර්ශන නිලධාරියෙක් ඔහුට පහර දුන් අතර අනෙකා සටහන් ගත්තේය. සුරේෂ්ගේ ළතෝනිය රැව් පිළිරැව් දුනි. ඔහු දුබල හා ව්‍යාකූල වනතෙක් පහරදීම් සිදුවිය; ඉක්බිති ඔහුව පෙරළා ඔහුගේ කුටියට ඇදගෙන ගිය ඔවුහු ඔහුගේ දෙපාවලට විලංගු ලෑහ.

122. දින කිහිපයකට පසු ඔහුගේ සිර කුටියට ආ නිලධාරීහු, සිංහලෙන් ලියන ලද ලියැවිල්ලකට අත්සන් කරන්නැයි කීහ. එය කුමක්දැයි ඔහු ඇසූ විට ඔහුගේ මුහුණට පහර දුන් ඔවුහු එය ප්‍රකාශයක් යැයි කීවෝය. ඔහුට කියැවීමට නොහැකි වුවද, එයට අත්සන් කරනු විනා කරන්නට අන් යමක් නැති බව ඔහුට හැඟිණ.

123. පසුව එළැඹි මාසවලදී, ඔවුහු ඔහුගෙන් තව දුරටත් ප්‍රශ්න කරමින් වධහිංසා පැමිණවූහ. මුෂ්ටියෙන් ද, කේබල් වයර්වලින් ද, ලෝහ තුඩක් සහිත මුගුරුවලින් හා දෑඩ ද්‍රව්‍යයක් පිර වූ ප්ලාස්ටික් බටවලින් ද ඔහුට පහර දෙනු ලැබුණි. ඔහුට පමුණුවන ලද වධහිංසා අතර අතුල් පහරවල් ද, බූට් දැමූ පයෙන් පා පහරවල් ද, දුම්වැටිවලින් පිලිස්සීම් ද, මිරිස් කුඩු හා දුම ආඝ්‍රාණය ද, ගැරප්පුවක් බඳු ලෝහමය උපකරණයකින් සිදුරු කිරීම ද, පුටුවකින් පහර දීම ද ඇතුළත් විය. ඔහු සිහි විසඥ වූ විට ඔවුහු ඔහුගේ මුහුණ අයිස් වතුර පිර වූ නාන ඔරුවකට එබූහ; ආශ්වාස වාතය ලබාගනු වස් ඔහු හිස පිටතට ගත් විට, මොට්ට අවියකින් ඔවුහු ඔහුගේ හිසට පහර දුන්නෝය.

124. වරක් ඔවුහු ඔහුගේ සිරුර කුඩා මේසයක් මත බාවා, ඔහුගේ දෑත් හා දෙපා මේස කකුල්වලට විලංගු ලා මහත් පීඩාකාරී ආරුක්කු හැඩයකට පසුපසට නැවූහ. එකී පීඩාකාරී ඉරියව්වෙහි 15 හෝරාවක් සිටින්නට ඔවුන් ඉඩ හැර තැබීමෙන් ඔහුගේ සුශු නාවට ස්ථිර හානි ඇති විය.

## *ඇ) ලිංගික වධහිංසා*

125. එක් රැයක දී, යට ඇඳුම් දක්වාම නිරුවත් කරන ලද ඔහුගේ දෑත් යකඩ දණ්ඩකට ගැට ගසා, දුම්වැටිවලින් ඔහුගේ දෑත් හා දෙපා පුලුස්සා, මුහුණට මිරිස් හා ගම්මිරිස් කුඩු ඉස, පැට්‍රෝල්වල පොඟවන ලද කවරයක් ඔහුගේ හිස වැසෙන සේ තදින් අල්ලා සිටිමින් හුස්ම හිර කරවීමට ඔවුහු ක්‍රියා කළහ; ඔහුගේ හුස්ම හිරවන විට ඔවුන් සිනහසෙනු ඔහුට ඇසුණි. ඔවුහු, ප්‍රතිදීප්ත බල්බයක් ඔහුගේ දෙපාවල ගසා බිඳින ලද අතර ඔහුගේ දෑත් පුටු කකුල්වලට යටින් තබා එක්වනම තදින් පුටුවේ වාඩිවූහ.

126. මේ අවස්ථාවේදී, පුද්ගලයන් දෙදෙනකු විසින් ඔහුව ලිංගිකව අපහරණය කරන ලදී. ඔවුන් දෙදෙනාම බීමත්ව සිටි අතර, ඔහුගේ මුව තුළට ශුක්‍ර පහ කරන තෙක් ඔවුන්ගේ පුරුෂ ලිංගයන් හා හස්ත මෛථුනායේ යෙදෙන්නැයි සුරේෂ්ට බලකළහ. ඉක්බිති, ඉන් අයෙක් සුරේෂ්ගේ ගුද මාර්ගයට ඔහුගේ ලිඟුව ඇතුල් කොට ඔහු

බලහත්කාරී ලිංගික දූෂණයට ලක් කළේය. අනෙක් පුද්ගලයා සුරේෂ්ගේ දෙකලවා අතරට ඔහුගේ පුරුෂ ලිංගය මැදිකොට ලිංගික සංසර්ගය අනුකරණය කළේය. අනතුරුව, ඔවුහු බංකුවක් මත ඔහු උඩුබැලි අතට බාවා ඔහුගේ දෙපා සහ දෑත් බංකු කකුල්වලට ගැට ගැසූහ. ඉන් එක් අයෙක් තමන් හා සහයෝගයෙන් වැඩ කරන මෙන් ඔහුට කියමින් ඔහුගේ වෘෂණ කෝෂ මුගුරකින් තලා දැමීය. අනෙක් නිලධාරියා, සුරේෂ්ගේ මුව තුළට සිය පුරුෂ ලිංගය ඇතුල්කොට ශුක්‍ර පහ කළේය. මේ සම්පූර්ණ කාලය තුළ මෙම පුද්ගලයෝ සුරේෂ්ට පරිහාසාත්මකව සිනාසුනහ.

*ඇ) ජොසොෆ් කඳවුරට මාරුකර යැවීම*

127. 2012 මුල් භාගයේ හෝ ඒ ආසන්න කාලයක දී, නිලධාරීන් විසින් සුරේෂ් 2009 යුද්ධ අවසානයේ දී ලිපි ලේඛන වළලූ ස්ථානයට වාහනයකින් රැගෙන යන ලදී. ඔවුහු වළලා තිබූ ලිපි ලේඛන ගොඩගත්හ. එතැන් සිට ඔහු ජෝසොෆ් කඳවුර වෙත රැගෙන යනු ලැබ එහි අඳුරු කුටියක ඔහු සිරකරනු ලැබිය. ජෝසොෆ් කඳවුර තුළ, අවස්ථා තුනකදී කලින් හා සමාන ලිංගික හිංසනයට සුරේෂ් පාත්‍ර කරනු ලැබිණ. ඔහු ගුද මාර්ගයෙන් ලිංගික දූෂණයට ලක් කෙරුණු අතර, මුඛ සංසර්ගයේ යෙදෙන්නට බලකරමින් වෙනත් ආකාරයේ ලිංගික අපහරණයන්ට ද භාජනය කරනු ලැබුණි.

128. ජෝසොෆ් කඳුවරේ පියගැට පෙළක් යට, කිසි  බඩු මුට්ටුවක් නොමැති සිර කුටියක ඔහුවා රඳවා තැබුණි. එහු එහි පැමිණිදාට පසුදා කාකි නිල ඇඳුම් හැඳගත් පොලිසිය විසින් ප්‍රශ්න කිරීමේ කාමරයට ඔහුව කැටුව යන ලදී. නිලධාරීන් දෙදෙනකු ඔහු දුටු අතර, ඉන් අයෙක් 'හතරවැනි තට්ටුවේදී' සටහන් තබාගත් පුද්ගලයා බවට ඔහු හඳුනාගත්තේය. ඔවුහු ඔහු ප්‍රශ්න කරමින්, වළලා ඇති අවශේෂ ලිපි ලේඛන පිළිබඳ හෙළිකරන මෙන් බලකර සිටියහ. ඉක්බිති ඔහුව පෙරළා ඔහුගේ සිර කුටියට යැවිය.

129. දින කිහිපයක් ඇවෑමෙන්, සිර කුටියෙන් පිටතට ගන්නා ලද සුරේෂ්, මුගුරු, ලෝහ දඬු, වයර්, ලණු හා බැරලයක් සහිත වධකාගාරයක් තුළට රැගෙන එනු ලැබුණි. ඔහු ප්‍රශ්න කරනු ලැබුවන් විසින් ඔහුගේ දෑත් ඔහු පිටුපසින් වූ කණුවක් වටා යවා මාංචු දමන ලදී. අනතුරුව ඔහුගෙන් ප්‍රශ්න කරන ලද අතර, ඔහු දෙන පිළිතුර ඔවුනට නොරිසි වී නම් ඔවුහු මුගුරුවලින් ද, මුෂ්ටිවලින් ද, බූට් සහ වයර්වලින්ද ඔහුට පහර දුන්නෝය. සමහර අවස්ථාවල, අයිස් කැට සහිතව ජලය පිර වූ බැරලයක ඔහු බස්සවනු ලැබුණි. ඔහු සහයෝගයෙන් කටයුතු කිරීමට එකඟ වන තෙක් ඒ තුළ සිටීමට ඔවුහු බල කළහ. වේදනාව දරාගත නොහැකි වූ විට තමන් සහයෝගයෙන් වැඩ කරන බවට සුරේෂ් මුර ගා කී  අතර, ඔහුට තවදුරටත් කියන්නට යමක් නැති බව පසක් කරගත් විගස යළිත් ඔහු බැරලය තුළට බලෙන් බස්සවනු ලැබුණි.

130. 2012 මැද භාගයේදී, සුරේෂ්ගේ පවුලේ අය විසින් ජෝසොෆ් කඳවුරේ නිලධාරීන්ට කප්පම් මුදලක් ගෙවීමට කටයුතු පිළියෙල කිරීමෙන් පසු ඔහුව නිදහස් කර යැවුණි. අනතුරුව, ජීවිතය පිළිබඳ හටගත් බියෙන් ඔහු ශ්‍රී ලංකාවෙන් පලා ගියේය.

131. ඔහුට කිසි විටක කිසිදු අපරාධයක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් සිදු නොවුණි.

132. ඔහුගේ වෘෂණ කෝෂවලට සිදුකළ හානිය ඇතුළු ඔහු අත්විඳි වධ හිංසා විසින් ඇතිකළ කායික හා මානසික කැළැල් තව දුරටත් සුරේෂ් රැගෙන යමින් සිටියි. ඔහු අවස්ථා කිහිපයකදීම සිය දිවි හානි කරගැනීමට උත්සාහ කර ඇති අතර නිදි වර්ජිත බව, අතීතාවර්ජනයන් හා ඔහු රඳවා සිටි කාලය පිළිබඳ දුස්-ස්වප්නයන්ගෙන් ඔහු පීඩා විඳියි.

## VI. විද්‍යා ජයකුමාර් වධහිංසාවට ලක්කිරීම

133. විද්‍යා ජයකුමාර් ශ්‍රී ලාංකික දෙමළ ජාතික කාන්තාවකි. ඇය දැරියක්ව සිටියදී, ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ඔවුන් විසූ ගම්මානයට කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම නිසා 1995දී ඇයගේ පවුල බලහත්කාරයෙන් අවතැන්භාවයේ හෙළනු ලැබිණ. හමුදාව විසින් දෙමළ ජන ප්‍රජාවට සිදුකරනු ලැබූ අකටයුතුකම් පිළිබඳ ඇයගේ පාසැලේදී කතා කළ දේශකයන්ට සවන් දීමෙන් පසු, 1997 වර්ෂයේ වයස අවුරුදු 18දී ඇය එල්ටීටීඊ සංවිධානයට බැඳුණාය. වසර කිහිපයක් ඇය රෝහලක ආවතේවකරුවකු වශයෙන් සේවය කළාය.

134.  2002දී, ආණ්ඩුව සහ එල්ටීටීඊ සංවිධානය අතර සාම ක්‍රියාදාමයක් දියත්ව තිබියදී, එල්ටීටීඊ සංවිධානයට බැඳුණු විද්‍යාගේ සහෝදරයකු, ඊට හිලව් වශයෙන් විද්‍යා සංවිධානයෙන් නිදහස් කරන මෙන් ඉල්ලා සිටියේය. ඇය මුදාහැරීම ප්‍රතික්ෂේප කළ ඔවුහු ඇය යුද පෙරමුණට නොයවා සිටීමට කැමැත්ත පළ කළහ. ඒ අනුව, ඇය එල්ටීටීඊ පරිපාලන අංශයේ රැකියාවක නිරත වූවා ය.

135. කෙසේ වුවද, 2008දී, ශ්‍රී ලංකා හමුදාවෝ එල්ටීටීය යටතේ පාලනය වූ භූමි භාගය ඇතුළට ගමන් කළෝය. විද්‍යා, එල්ටීටීඊ සංවිධානයේ ප්‍රමුඛ කාන්තා සාමාජිකාවකගේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කරනු ලැබිණ. රජයේ හමුදාවන්ගේ පෙරට යාම නොනැවතී සිදුවූ අතර තත්ත්වය භයානක විය. සංවිධානය අතහැර යළිත් පවුල හා එක්වීමට විද්‍යා කල්පනා කළ නමුත්, සංවිධානය හැරයාම නිසා අල්ලාගෙන දඬුවම් පමුණුවනු ඇතැයි ඇය බිය වූවාය. අවසානයේ, ගැළවී යාමට ඇය තීරණය කළා ය.

### *අ) යුද කලාපයෙන් නික්මයාම හා සමූහ සිරගතකිරීම*

136. 2009 වසන්ත කාලය වන විට ශ්‍රී ලංකා යුද හමුදාව සහ එල්ටීටීඊ සංවිධානය අතර සිවිල් යුද්ධය ලේ වැකි අවසානයකට එළඹෙමින් තිබුණි. සිය දහස් සංඛ්‍යාත දෙමළ සිවිල් වැසියෝ සන්නද්ධ ප්‍රහාරයන්ගෙන් දිවි බේරාගනු පිණිස පයින්ම පලා ගියෝය. මං මාවත්වල රැස්කන වෙහෙසට පත් ගැහැණුන්, පිරිමින් සහ ළමුන් අතරට විද්‍යා ද එකතු වූවාය. 2009 මැයි මාසයේදී, කළපුවකට ඉහළින් තැනූ පටු මගක් වූ වඩ්ඩුවාකල් පාලම දක්වා ඇය ගමන් කළාය. යුද්ධයෙන් දිවි ගළවාගත් දහස් සංඛ්‍යාත බියපත් ජනයා, ඔවුන් රඳවාගන්නට බලා සිටින ශ්‍රී ලංකා හමුදාවන්ගේ දෑත් අතරට පාලම හරහා ගමන් කළෝය.

137. මැයි 18 වැනිදා හෝ ඒ ආසන්න දිනයක දී පාලම තරණය කළ විද්‍යා හමුදාවට යටත් වූවාය. ඇය පළමුව තාවකාලික රඳවා ගැනීමේ භූමියකට යැවුණු අතර අනතුරුව ආසන්න වශයෙන් මාස හයක් ඇය රඳවා තබාගත් අත්හැර දමන ලද නිවසකට බසයකින් ගෙනයනු ලැබුනි. 2009 නොවැම්බර් මාසයේ දිනක, හමුදා නිලධාරියකු විසින් ඇය ප්‍රශ්න කරනු ලැබූ අතර එල්ටීටීඊ සංවිධානය සමග ඇයට කලින් තිබූ සම්බන්ධය පිළිගන්නා තෙක් ඇයගේ උදරයට හා ඇළපතට පයින් පහර දුන්නේය. ඒ රාත්‍රියේදී, සොල්දාදුවන් විසින් ඇගේ දෑස් බැඳ, දෑත් පිටුපසට කොට ගැට ගසා, වාහනයකට ඇය නංවන ලදී.

### *ආ) 'උඹට අඹු සැමියන් වශයෙන් කෙනෙක් එක්ක නිදාගන්න වෙව්": හමුදා කඳවුරක ලිංගික වහල්කම*

138. ශ්‍රී ලංකා යුද හමුදා කඳවුරු ආශ්‍රිත රහසිගත රැඳවුම් ස්ථාන දෙකකට විද්‍යා යවනු ලැබුණි. මෙම ස්ථාන දෙකෙහිදීම, ඇය සහ වෙනත් දෙමළ කාන්තාවන් ලිංගික වහල්කමට බලයෙන් ඇද දැමුණු අතර හමුදා සෙබළුන් හා සෙබළියන්ගේ ලිංගික හිංසනයන් හා වධහිංසාවන් සෑම රැයක් පාසාම විඳින්නට ඔවුන්ට සිදුවිය. 2009 නොවැම්බර් මාසයේ ආරම්භ වූ මේ බිහිසුණු අත්දැකීම 2013 පෙබරවාරි මාසය වන තෙක් අවසන් නොවුණි.

139. 2009 නොවැම්බරයේදී දෑස් බැඳ ගෙනගිය ගමනකින් පසු, විද්‍යා ළඟා වූ පළමු රැඳවුම් ස්ථානයේ ඇය රඳවා තැබුණේ අවුරුදු 15 සිට 30 දක්වා වූ තරුණ දෙමළ කාන්තාවන් කණ්ඩායමක් සමග ය. ඇය එහි ගෙවූ පළමු දිනයේදී, ඇය ඔත්තුකරුවකු වනවා නම් නිදහස් කර යවන්නට හමුදා නිලධාරියෙක් කැමැත්ත පළ කළේය. ඇය එය ප්‍රතික්ෂේප කළ අතර නිල ඇඳුම් හැඳි කාන්තාවන් දෙදෙනකු එනතුරු ඇයව කාමරයක දමා තිබිණ. ඔවුන් හා පැමිණි සෙබළෙක් කැඩුණු දෙමළ බසින් කියා සිටියේ, මෙම කාන්තාවන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බවත්, ඇය ඔවුන්ට කීකරු විය යුතු බවත් ය.

140. ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සේයාරුවක් බිත්තියේ එල්ලූ ඇඳක් සහිත කාමරයකට විද්‍යාව ගෙනගිය කාන්තාවන් ඇයට ඇඳුමක් දී, ඇඳුම් මාරුකර ගන්නැයි කීහ. ඔවුන්ට කාමරයෙන් පිටව යන්නැයි විද්‍යා කී විට එකී කාන්තාවෝ හඬ නගා සිනහ සී ඇය හැඳ සිටි යට ඇඳුම් ඇතුළු සියළු ඇඳුම් ඉරා දැමූහ. අනතුරුව ඔවුහු ඇයට යට ඇඳුමකින් තොරව ඇඳුම ඇන්දවූවෝය. ඇය යම් කෙනකු සමග 'සැමියා හා බිරිඳ මෙන් නිදාගන්නට' යන බව කාන්තා නිළධාරීහු ඇයට කීහ. ඔවුන් කිසියම් බෙහෙත් පෙති දෙකක් බලහත්කාරයෙන් ඇගේ මුවට දමා එය ගිල්ලවීය. අනතුරුව, හඬා වැටෙන ඇය තනිකොට ඔවුහු පිටව ගියෝය. ඇය ඊට කලින් ලිංගික සබඳතා පවත්වා නොතිබුණි.

141. කිසියම් වේලාවකට පසු, මේජර් මනතුංග නමැති පිරිමි හමුදා නිලධාරියකු සමග ඔවුහු පෙරළා ආවෝය. තමන් කියන ආකාරයට ක්‍රියා නොකළහොත්, ඇයගේ අත් පා ගැට ගසා විවිධ පුද්ගලයන් සෑම රැයකම එවන බව කියා විද්‍යාට තර්ජනය කළ කාන්තා නිලධාරිනියෝ සිනාසුණෝය. මේජර් මනතුංග සමග ඇය තනිකර ඔවුහු පිටව ගියහ. තමන්ට කරදරයක් නොකරන මෙන් විද්‍යා හඬමින් ඔහුගෙන් අයැදුවා ය. බිමට වකුටු වූ ඇය ඇඳ කකුලක එල්ලී සිටියාය. ඒ නිසා, පිටව ගිය කාන්තා නිලධාරිනියන්ට පෙරළා එන ලෙස ඔහු දන්වා සිටියේය. විද්‍යාට පහර දෙන්නට පටන්ගත් ඔවන් දෙදෙනා ඇය ඇඳ මතට තල්ලු කළෝය. ඉක්බිතිව, ඔවුහු ඇයගේ දෑත් ඇඳ විට්ටමට තබා ගැට ගසා කාමරයෙන් පිටව ගියහ.

142. මේජර් මනතුංග විද්‍යාට පහර දෙමින් ඇගේ මුළු ශරීරයම ස්පර්ශ කරන්නට පටන් ගත්තේය. ඇය ඇඳ සිටි ඇඳුම ගැලවීම පහසු වන ලෙස ඇයගේ බැඳ තිබූ දෑත් ඔහු විසින් ලිහා දමන ලදී. ඉක්බිති ඇය මතට ගොඩ වූ ඔහු, ඔහුගේ පුරුෂ ලිංගය ඇයගේ යෝනි මාර්ගය තුළට බලෙන් ඇතුල් කළේය. ඔහු කිහිප වරක්ම ඇයගේ මුව තුළට ද ලිංගය ඇතුල් කරමින් ශුක්‍ර පහ කළේය. වමනයට ආ හෙයින් ඇය මුවෙහි ලෑ ශුක්‍ර කෙළ ගැසුවේය. ඔහු එය ඇගේ මුහුණ පුරා තැවරුවේය.

143. ටික වේලාවකින් පසු, ඇයව ඔසවා කෙළින් කළ ඔහු, ඉදිරිපසට නැමී ඇඳ විට්ටම අල්ලා ගන්නා ලෙස ඇයට නියම කළේය. අනතුරුව ඔහු ඇයගේ ගුද මාර්ගය තුළට ඔහුගේ පුරුෂ ලිංගය ඇතුල් කළේය. සිය කටයුත්ත නිමා කළ පසු, ඔහු ඇයගේ දිගු කෙස් වැටියෙන් අල්ලා ඇඳෙන් බිමට ඇද දමා කාමරයෙන් පිටව ගියේය.

144. වේදනාවෙන් සෙළවෙනු නොහැකිව, විද්‍යා දිගු වේලාවක් බිම වැතිර සිටියාය. බලහත්කාරී ලිංගික දූෂණයෙන් ඇයට කන්‍යාභාවය අහිමිව තිබුණි. මෙකී කැළල විශේෂ වූ ක්ෂතියකට තුඩු දෙන්නේ දෙමළ සංස්කෘතිය තුළ කන්‍යාභාවය වූ කලී කාන්තාවක් විවාහ වනතුරු සුරැකිය යුතු ගුණාංගයක් සේ සැළකෙන බැවිනි; කැමැත්තෙන් හෝ අකමැත්තෙන් කන්‍යාභවය අහිමි වූ මනාලියන් ප්‍රතික්ෂේප කෙරේ. සාමාන්‍ය පුද්ගලයකු ලෙස සිය ජීවිතය අවසන් බව ද, මෙයින් පසු කිසිවකු තමන්ට ආදරය නොකරනු ඇතැයි ද ඇය සිතුවාය.

145. අවසානයේ කාන්තා නිලධාරිනියන් දෙදෙනා පෙරළා කාමරයට පැමිණ, ඇඳුම් අන්දවා අනෙක් ගැහැණුන් රඳවා ඇති කාමරයට ඇය කැටුව ආහ. කඳවුරෙහි  කිසිදු පිරිමියකු රඳවා නොතිබිණ. විද්‍යා හඬා වැටෙන විට, මෙහි සිදුවන්නේ මෙය බව සෙසු රැඳවියෝ ඇයට කීවෝ ය: 'පිටතින් එන පිරිස් අපට මෙම අපරාධ සිදු කරති'.

146. මාසයෙන් මාසය, 15-20ත් අතර ප්‍රමාණයක් පිරිමින් විසින් විද්‍යා ලිංගික හිංසනයන්ට පාත්‍ර කරන ලද අතර ඉන් බොහෝ දෙනෙක් එක් වරකට වැඩි වාර ගණනක් එසේ සිදු කළහ. ඔවුන් සියළු දෙනා සිංහල බස කතා කළෝය. සෑම රැයකම ඇය සහ අනෙකුත් රැඳවියෝ, 'ලිංගික වධ කුටිය'ට යාමේ තමන්ගේ වාරය එළඹෙතැයි බියෙන් ජීවත් වූහ. කඳවුරෙහි නේවාසික පිරිමි සෙබළු, සේවා මුරයෙන් පසු සෑම රැයකම පාහේ රැඳවියන්ට ලිංගික බලහත්කාරකම් කිරීමට එහි ආවෝය. කඳවුරෙන් බැහැර පිටස්තර සෙබළු ද ඒ සඳහා එහි ආහ. ඇතැම් විට, එක් අයකුට වඩා ගණනකට ලිංගික අවශ්‍යතා පැන නැගුණු අතර ඒ සඳහා ඔවුහු පිටත වූ කූඩාරම්වලට රැඳවියන් ගෙනගොස් ලිංගික බලහත්කාරකම් කළහ. විද්‍යා දෙතුන් වරක්ම කූඩාරම් තුළ බලහත්කාරයට ලක් වූවාය.

147. බොහෝ අවස්ථාවලදී, සොල්දාදුවන් විසින් ඇයට ලිංගික බලහත්කාරකම් කරද්දී සෙසු සෙබළු එය ඡායාරූප හෝ වීඩියෝ ගත කළහ. ඇතැම්විට කාන්තා නිලධාරිනියෝ එය නරඹමින් ඇයට සිනාසුණෝය.

148. අඩුම වශයෙන් තුන් වතාවක්, බොහෝ විට දිවා කාලයේදී කාන්තා නිලධාරිනියන් විසින් විද්‍යා, බලහත්කාරී දූෂණය හා ලිංගික හිංසනයට භාජනය කරන ලදී. කියන දේ නොකළහොත් ඔවුහු ඇයට අතුල් පහර දුන්හ. ඔවුහු සිය ඇඟිලි ඇයගේ යෝනි මාර්ගයට ඇතුල් කර ඔවුන්ගේ පියොයුරු හා යෝනි පිරිමදින ලෙස ඇයට අණ කර සිටියෝය.

149. අත්අඩංගුවේ සිටි මාස ගණනකට පසු එක රැයක, ඔවුන් නිදා සිටි කුටියෙන් එක් කාන්තා රැඳවියෙන් පිටතට කැඳවාගෙන යනු ලැබිණ. කෙටි වෙලාවකින්, ලිංගික වධ කුටිය දෙසින් විද්‍යාට වෙඩි හඬක් ඇසුණි. සිදුවන්නේ කුමක්දැයි බැලීමට ඇය දොරටුව වෙතට ගිය අතර හිසෙන් ලේ වැගිරෙන ඒ කාන්තාව සෙබළුන් විසින් කාමරයෙන් පිටතට රැගෙන යනු ඇය දුටුවාය. ඇයගේ සිරුර ඇඳ රෙද්දකින් වසා තිබින. යළි කිසි දිනක විද්‍යා ඇය නොදුටුවාය.

150. ඇ මේ කඳවුරෙහි රඳවා සිටි කාලය තුළ ආසන්න වශයෙන් මාසයකට වරක් රැකවළුන් විසින් රැඳවියන්ට එන්නතක් ලබා දෙන ලදී. ඔවුහු සියළු රැඳවියන්ට එකම ඉඳිකටුව භාවිතා කළෝය. එම එන්නත කුමක්දැයි ඇයට කිසි දිනක නොකියන ලද අතර, හැම විටම උපත් පාලන කොපු භාවිතයකින් තොරව විවිධ පිරිමින් විසින් අනේක වාරයක් ලිංගික බලහත්කාරයට ලක් කරන ලද නමුත් ඇය හෝ අවශේෂ කාන්තාවන් කිසිවකු ගැබ් නොගැනීම නිසා එය යම් උපත් පාලන ක්‍රමයක් බව පෙනෙන්නට තිබුණි.

151. ඇය ලද එකම ප්‍රතිකාරය වූයේ, ඇයට අපස්මාර ගැස්ම ඇතිවන්නට පටන් ගත් පසු වවුනියා රෝහලට කෙටි හමුවකට රැගෙන ගිය අවස්ථාවක පමණි. දෙදිනකට පසු ඇයව පෙරළා කඳවුරට ගෙන එන ලද අතර තවත් මාස ගණනාවක් ඇ එහි රඳවා තිබිණ.

### *ඇ) "හතරවැනි තට්ටුවේ"දී ප්‍රශ්න කිරීම සහ වධහිංසා*

152. 2011 මාර්තු මාසයේ දිනක, විද්‍යා සහ අනෙක් රැඳවියන් පරික්ෂා කිරීම සඳහා කාන්තා ඔත්තුකාරියක් කඳවුරට ගෙන එන ලදී. ඒ රාත්‍රියේදී පැමිණි සොල්දාදුවෝ විද්‍යා දෑස් හා දෑත් බැඳ පිටතට කැටුව ගියෝය.

වාහනයක නංවා සැහෙන දුරක් ගෙන යාමෙන් පසු ගොඩනැගිල්ලක් තුළට රැගෙන යනු ලැබ තරප්පු පේළි ගණනාවක් නැග යාමට ඇයට සිදුවිය. අඳුරු කුටියක ඇය රඳවනු ලැබුණු අතර, පහර කෑමට ලක්වන කලක මෙන් ගැහැණුන් සහ පිරිමින් මරහඬ දෙනු එළිවන තුරු ඇයට ඇසුණි.

153. පසු දින උදෑසන, සිවිල් හැඳගත් පිරිමින් විසින් විද්‍යා පියගැට පේළි ඔස්සේ පහතට කැටුව යන ලදී. ඔවුන් තමන් කවුරුන්දැයි හඳුන්වා නොදුන් අතර ඔවුන් සිටින්නේ කොහේදැයි නොකීහ. තමන් වටා උස් ගොඩනැගිලි ද, ඈතින් සාගරය ද තිබෙනු ඇය කවුළුවකින් දුටුවාය.

154. එදිනත්, ඊට පසු දිනත් සිවිල් හැඳගත් නිලධාරීන් විසින් විද්‍යා ප්‍රශ්න කිරීම්වලට භාජනය කරන ලදී. පළමු දිනයේ ඇය ඔත්තුකාරියක් කරගැනීමට ඔවුහු බලපෑම් කළහ. දෙවැනි දිනයේ, ඇය ඉදිරියේ ලිපි ගොනුවක් තැබූ ඔවුහු එය අත්සන් කරන්නැයි ඇයට කියා සිටියෝය. ඇය එය ප්‍රතික්ෂේප කළ විට යළිත් ඇය රඳවා සිටි අඳුරු කුටිය තුළට ගෙනයනු ලැබුණි. පසුව, කුටියට ඇතුල් වූ නිලධාරීන් දෙදෙනෙක් ඇයට දිග රිටකින් පහර දුන්හ. අයෙක් විදුලි පන්දමක් දල්වාගෙන සිටි අතර අනෙකා ඇයට පිටුපසට පහර දුන්නේය. ඔවුන් පිටව ගිය පසු, ඔවුන්ගේ තැන වෙනත් පිරිමින් දෙදෙනකු විසින් ගන්නා ලදී. ඔවුහු මාරුවෙන් මාරුවට ඇය බලහත්කාරී ලිංගික දූෂණයට ලක් කළහ.

### *ඇ) හමුදා මුළුතැන් කඳවුරක ලිංගික වහල්කම*

155. පසු දිනයේ, රැකවලුන් විසින් ඇයගේ දෑස් හා දෑත් බැඳ පිටගැට පේළි ඔස්සේ බැසගොස් ගොඩනැගිල්ලෙන් පිටතට රැගෙන යනු ලැබුණි. නොදන්නා ප්‍රදේශයක පිහිටි හමුදා කඳවුරක් කරා දිගු දුරක් ඔවුහු ඈ වාහනයකින් රැගෙන ගියෝය. කඳවුරේ හමුදා නිලධාරීන් සමග කතා කළ රැකවල්ලු, විද්‍යා එහි රඳවා පිටව ගියහ. ලොග් සටහන් පොතක ඇයට සිය අත්සන් යෙදීමට සිදු වූ අතර ඉක්බිති ඇයව එහි වූ නිවසකට රැගෙන යනු ලැබිණ.

156. ප්‍රදේශයේ හමුදා අනු ඛණ්ඩ සඳහා මධ්‍යම මුළුතැන් ගෙය වශයෙන් පවත්වාගෙන යනු ලැබුණේ එම කඳවුර ය. කොළඹ 'හතරවැනි තට්ටුවට' විද්‍යා රැගෙන යාමට පෙර රඳවා තිබූ හමුදා කඳවුර මෙන්ම, මෙම කඳවුර ලිංගික වහල්බිමක් වශයෙන්ද යොදා ගැනුණි. 2011 මාර්තු සිට 2013 පෙබරවාරි දක්වා ආසන්න වශයෙන් අවුරුදු දෙකක කාලයක් මෙම කඳවුර අඩස්සියේ විද්‍යා පසුවූවා ය. ඇය සමග අවුරුදු 18ත් 35ත් අතර කාන්තාවන් දොළොස් දෙනකු එහි රඳවා තිබිණ.

157. මේ කාලය තුළ, ගැණිය නොහැකි තරම් ප්‍රමාණයක් සෙබළුන් විසින් අනේක වාරයක් ඇය බලහත්කාරී ලිංගික දූෂණයට ගොදුරු කරන ලදී. සෝදා පිරිසිදුව නොසිටීමට ඇය කටයුතු කළ නමුත් එය විසින් සෙබළුන් අධෛර්යමත් නොකෙරිණ. බොහෝ අවස්ථාවල, ඔවුහු ඇයගේ මුව තුළත්, ශරීරය පුරාත් ශුක්‍ර පහ කළහ. ගුද මාර්ගයෙන් දරුණු ලේ වහනයට තුඩු දුන් බලහත්කාරී ගුද සංසර්ගයට නිරන්තරයෙන් ඈ පාත්‍ර කරනු ලැබුණි. ඇතැම් අවස්ථාවලදී පිරිමින් රංචු වශයෙන් ඇය බලහත්කාරී ලිංගික දූෂණයට ගොදුරු කරන ලදී. ඈ හඬා වැටුණහොත් හෝ ඔවුන්ගේ තෘප්තිය සඳහා අවශ්‍ය දේ නොකළහොත්, ඔවුහු ඇයට අතුල් පහර දුන්හ. ඇතැම්විට කෝපයට පත්වන ඔවුහු ඇයගේ හිසට තුවක්කුවක් එල්ල කළෝය. ඔවුන් සියළු දෙනා සිංහල හමුදා සෙබළුන් වූහ. ඇතැමුන් ඉහළ නිල දැරුවන් විය.  කිසිවකු විසින් කිසිවිටක කාරුණික බවක් හෝ සහානුකම්පාවක් පෙන්නුම් නොකරන ලදී.

158. ඇය අත්අඩංගුවේ සිටි කිසිදු අවස්ථාවක ජාත්‍යන්තර රතු කුරුස කමිටුව හෝ වෙනත් පිටස්තර පිරිස් රැඳවුම් ස්ථාන නිරීක්ෂණයට නොආහ.

159. මේ දැවුරුද්ද තුළ, ඈ රඳවා තබාගත්තවුන් විසින්, ඇයත් අනෙක් කාන්තාවනුත් ගැබ් ගැනීම වළකනු පිණිස නිරන්තරයෙන්ම එන්නත් ලබාදීම සිදුකළහ. ඇය නිදහස් කිරීමට කලින් දා රාත්‍රියේ අවසන් එන්නත ලබා දී තිබේ.

160. 2013 පෙබරවාරි මාසයේ හෝ ඒ ආසන්න දිනක, විද්‍යා වාහනයක නංවාගෙන වවුනියාවේ ජෝසෆ් කඳවුරට ගෙනගිය අතර එහිදී ඇයගේ පවුලේ අය සමග ඇය නැවත එක් විය. මුළුතැන් කඳවුරින් ඇය නිදහස් කරගනු පිණිස ඇයගේ පවුලේ සාමාජිකයන් විසින් කප්පම් මුදලක් ගෙවා තිබිණ. විද්‍යා නිදහස් කරන ලද්දේ, ප්‍රදේශයේ පොලිස් සථානයකට නිරන්තරව වාර්තා කිරීමේ කොන්දේසිය මත ය.

### *ඉ) පොලිස් ස්ථානයක ලිංගික වධහිංසා*

161. පොලිසිය විසින් නිරන්තරයෙන්ම සිදුකරන අයුතු ස්පර්ශ කිරීම් සහ ලිංගික හිරිහැර තිබියදීත්, නියෝග ප්‍රකාරව ඈ පොලිස් ස්ථානයට ක්‍රමවත්ව වාර්තා කළාය. නමුත් 2014 වසරේ එක්තරා දිනක ඇය පොලිස් ස්ථානයට වාර්තා කළ විට, එහි සිටි පොලිස් නිලධාරියකු ඇයව හමුදා සෙබළුන් පස් හය දෙනකුට භාරදුන් අතර,

ඔවුහු ඔවුන්ගේ පුරුෂ ලිංග පෙන්වා ඒවා ස්පර්ශ කරන මෙන් ඇයට බලකර සිටියහ. ඔවුහු ඇයව බිම පෙරළා ඇය හැඳ සිටි සාය එසවූහ. එයින් කිහිප දෙනෙකුම ඇය බලහත්කාරී ලිංගික දූෂණයට පාත්‍ර කළහ. අපස්මාර ගැස්මක් හටගැනීමෙන් පසු ඇය අවසානයේ පෙරළා නිවෙස බලා පිටත් කර හැරුණි.

162. මේ සිදුවීමෙන් පසු, නියමිත පරිදි පොලිස් ස්ථානයට වාර්තා කිරීමෙන් ඇය වැළකී සිටියාය. වාර්තා නොකිරීම නිසා ඇය අවසානයේ යළිත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලදී. හමුදා සෙබළුන් තමන්ට අතවර කළ බව ඇය දැන් වූ විට ඔවුහු ඇ සහ ඇගේ පරීක්ෂණ ලිපි ගොනු හමුදාවට භාර දුන්හ. දේශපාලකයකු මැදිහත් වී ඇය නිදහස් කරගන්නා තෙක් හමුදාව විසින් මාස කිහිපයක් ඇ රඳවා තබා ගන්නා ලදී.

163. තාවකාලිකව නිදහස් කොට තිබියදී ඇය ශ්‍රී ලංකාවෙන් පලා ගියාය.

164. විද්‍යාට එරෙහිව කිසිදු අපරාධයක් සම්බන්ධයෙන් අභිචෝදනාවන් ගොනු නොකෙරුණි.

165. වධ හිංසාවන්ට පාත්‍ර කිරීමත්, ලිංගික වහල්භාවයේ යොදවා ගැනීමත්, හුදකලා සිර අඩස්සියෙහි තබා ගැනීමත් විසින් විද්‍යාගේ කායික හා මානසික සෞඛ්‍යය මත ප්‍රබල බලපෑමක් ඇති කර තිබේ. ඉන් ගැළවී ගැනීමට ඇය අරගල කර ඇති අතර දිවි නසා ගැනීමේ පෙළඹුම් මානසිකත්වයන් රෝගීව සිටි ඇය මුහුණ දුන් මානසික ක්ෂතිය හේතුවෙන් විස්තීර්ණ මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර අවශ්‍ය කර තිබුණි.

## VII. නිමල් ජයසූරිය වධහිංසාවට ලක්කිරීම

166. නිමල් ජයසූරිය සිංහල සම්භවයක් ඇති ශ්‍රී ලාංකිකයෙකි. මහජන දැනුවත් කිරීම් සඳහා මාරුවීමට පෙර හේ විවිධ මානව හිමිකම් සංවිධානවලට සම්බන්ධව වැඩ කළේය. දූෂණයට එරෙහිවත්, මානව හිමිකම් ආරක්ෂා කිරීමටත් ඔහු කැප වී ක්‍රියා කළේය.

167. සිය වෘත්තීය කටයුතු අතරවාරයේ ඔහු, තමා හා සමාන වැඩ කටයුතුවල නියැලුණු දෙමළ සගයකු වූ 'සිවා' (ඔහුගේ ආරක්ෂාව පිණිස යෙදූ අන්වර්ථ නාමයකි) හා මිතුරු විය.

168. රාජපක්ෂ බලයේ සිටීමත්, යුද්ධය තීව්‍ර වීමත් සමග දූෂණයට හා මානව හිමිකම් උල්ලංඝනයට එරෙහිව කතා කිරීම වඩ වඩාත් අසීරු විය. කතා කිරීමේ නිදහස යටපත් කරන ලද අතර ආණ්ඩුව විවේචනය කිරීම භයානක සේ සැළකින.

169. 2008 වසරේ මුල් භාගයේ සන්ධ්‍යාවක, සිවිල් හැඳගත් නිලධාරීන් පිරිසක් විසින් ස්වකීය සගයා වූ සිවා රැගෙන ගිය බව නිමල්ට දැනගන්නට ලැබුණි. මැදිහත්වීම සඳහා ජනයා ඒකරාශී කිරීමට නිමල් ප්‍රයත්න දැරීය. සිවා හොඳින් දැන හැඳින සිටි ප්‍රමුඛ ක්‍රියාධරයන්ට ඔහු දුරකථන ඇමතුම් ඔස්සේ කතා කළද බිය පල කළ ඔවුහු වෙනත් කෙනකුට කතා කර උදව් ඉල්ලා සිටින්නැයි කීහ.

170. පසුදා උදයේ නිමල් සත්‍යය පසක් කරගත්තේය: සිවා කොළඹ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය හෙවත් ටීඅයිඩී කාර්යාලයට රැගෙන ගොස් තිබුණි. සිවා සොයාගනු පිණිස ඔහු වහා එහි ගියේය.

171. සෝදිසි මුර කපොලු කිහිපයක් පසුකිරීමෙන් පසු, ඔහුට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ කාර්යාලය ඉදිරිපිට මුර කුටියක රැඳී සිටීමට සලස්වනු ලැබුණි. මද වෙලාවකට පසු නිලධාරියෙක් පැමිණ ඔහුගේ හැඳුනුම්පත රැගෙන ගියේය. අනතුරුව සිවිල් ඇඳුමින් සැරසුණු අයෙක් පැමිණ "ඔයා සිංහල. ඔයාට දරුවෙක් ඉන්නවා. එහෙම තිබිලාත් ප්‍රශ්නයක් හදාගන්න යන්නේ ඇයි?" ඔහුට කීවේය. සිවා එල්ටීටීඊ සංවිධානයෙන් මුදල් ලබන බවට තහවුරු කළහොත් ඔහුට යන්නට ඉඩ දිය හැකි බව නිලධාරියා කීය. සිවාට එල්ටීටීඊ සංවිධානයෙන් මුදල් ලැබෙන බව නිමල් ප්‍රතික්ෂේප කළේය.

172. හෝරා ගණනාවක් රැඳී සිටීමෙන් පසු බොහෝ දුරට පෙරළා ගෙදර යන්නට එදින ඉඩ නොලැබෙන බව නිමල් පසක් කරගත්තේය. වෙනත් අයට හානියක් නොවනු පිණිස, ඔහු සිය ජංගම දුරකථනයේ සටහන් ඇමතුම් මතකය මකා දැමුවේය.

173. අවසානයේ, දවසේ අපර භාගයේ දී නිමල් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ කාර්යාලය තුළට කැඳවනු ලැබුණි. සිය කාර්යාලයට පැමිණ අසුන් ගන්නා මෙන් සාජන්ට්වරයෙක් ඔහුට කියා සිටියේය. ඉක්බිති, අවශේෂ නිලධාරීහු තරුණ දෙමළ රැඳවියකු එතුළට ගෙන ආවෝය. ඒ වන විටත් අපහසු තත්ත්වයක සිටි ඔහු යට ඇඳුම පමණක් හැඳ සිටියේය. ඔහුට බිම වැටෙන්නට පා පහරක් දුන් එක් නිලධාරියෙක්, ඔහුගේ දෑත් පුටු කකුලකට අල්ලා මාංචු

දැමුවේය. ඉක්බිති ඔවුහු ඔහුගේ ශරීරය හැකිතාක් දිගහැරෙන සේ ඔහුගේ දෙපා මේස කකුලකට අල්ලා මාංචු දැමූහ. සෙළවෙන්නටවත් ඔහුට නොහැකි විය.

174. නිලධාරීන් තරුණයාට වධහිංසා කරනු බලා සිටින්නට නිමල්ට බල කෙරුණි. තරුණයා කෙස් වැටියෙන් අල්ලාගත් සාජන්ට්වරයා ඔහුගේ හිස තදින් බිත්තියේ හැප්පුවේය. නිලධාරීහු ඔහුට අතින් සහ පයින් පහර දෙන්නට පටන් ගත් අතර තරුණයා වේදනාවෙන් හඬ තැලීය. නිමල් ලැජ්ජාවෙන් බරිත විය: නිලධාරීන් සාමාන්‍ය ලෙස ඔහුට සිංහලෙන් කතා කළ අතර තමන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය සමග වැඩකරන බැව් තරුණයා සිතනු ඇතැයි ඔහු බිය විය. නිලධාරීන් තරුණයාට දරුණු ලෙස පහර දෙන අතරතුර, නිමල්ගේ ගම් පළාත් කොහේදැයි සාජන්ට්වරයා මිත්‍රශීලී හඬකින් විමසීය.

175. මෙම දසුන ඔහු අපහසුතාවයකට පත්කරන ලද දෙයක් වූයේ මානව හිමිකම් ක්‍රියාධරයකු වශයෙන් නිමල් අනේක වාරයක් වධහිංසා පිළිබඳ ලේඛනගත කොට ඇති නිසා ය: දැන් ඔහු සිය දෑස් අබියස එය සිදුවනු දකියි. තරුණයාට තමා ඉදිරියේ වධ දෙන ලද්දේ සිවාට එරෙහිව තමා ලවා සාක්ෂි සපයාගැනීමට පීඩනයක් ඇති කරගැනීමට විය හැකියැයි යන සිතිවිල්ල අදටත් නිමල් තුළ හොල්මන් කරයි. තරුණයාට පහර දීම හමාර කළ පසු ඔවුහු ඔහුගේ ලේ වැකි සිරුර මාංචුවලින් ගළවා බිම දිගේ ඇදගෙන ගියහ.

176. නිමල් වෙත ආ සාජන්ට්වරයා ඔහුගේ කෙස් වැටියෙන් අල්ලා ඔහු පැමිණියේ කුමක් සඳහාදැයි දැනගැනීමට අවශ්‍ය බව කියා සිටියේය. තමන් පැමිණියේ තම සගයා වූ සිවා බැලීමට යැයි නිමල් කීය. සාජන්ට් නිමල්ගේ නාසය ඇඟිලි අතරට සිරකොට වේදනා දනවන ලෙස මිරිකා ඇද්දේය. තමා සිංහලදැයි ඔහු නිමල්ගෙන් විමසීය. 'ඔව්' යැයි නිමල් පිළිතුරු දුන් විට ඔහුගේ මුහුණ වෙනස් විය. සාජන්ට්වරයා මෘදු ලෙස ඔහුගේ උරහිසට තට්ටුවක් දමා 'මම යනවා'යි කියමින් ඔහුගේ බෑගය ද රැගෙන පිටව ගියේය.

177. සිවා සමග නිමල් ද ත්‍රස්ත විමර්ශන කොට්ඨාශ කාර්යාලයේ රඳවා තබනු ලැබුණි. එහි ජ්‍යෙෂ්ඨතම නිලධාරියා ප්‍රසන්න ද අල්විස් ය. ඔහු විමර්ශන ඒකකයන් තුනක් අධීක්ෂණය කළේය. නිමල් හා සිවා පිළිබඳ විමර්ශන කරන ලද්දේ තුන්වැනි ඒකකය විසිනි. තුන්වැනි ඒකකය භාර නිලධාරියා ජනකාන්ත නම් වූ අතර, වධකයන් ලෙස කැපී පෙනුණු දෙදෙනකු ඇතුළු නිලධාරීන් හය දෙනකු ඔහු යටතේ ක්‍රියා කළෝය. ඒ දෙදෙනා වූයේ ඒ වනවිටත් නිමල්ට මුණගැසුණු සාජන්ට්වරයා සහ පොලිස් කොස්තාපල්වරයෙකි. මේ දෙදෙනා පරපීඩකයන් ලෙස පැහැදිලිව පෙනුණි: මිනිසුන්ට වධ හිංසා පමුණුවීමෙන් සහ නිමල් හා අනෙක් රැඳවියන්ට ජීවිත පිළිබඳ බියක් ඇති කිරීම මගින් ඔවුහු සන්තුෂ්ටියක් ලැබූහ.

178. ඔහුට ලිහිල් සැළකුමක් ලැබීමට හේතුව ඔහු සිංහලයකු වීම යැයි කොස්තාපල්වරයා නිමල්ට කීය. දෙමළ රැඳවියන් මෙන් නිමල් විලංගු ලා නොතිබුණු අතර වාඩි වී සිටීමටත්, කොරිඩෝවේ සිටගෙන සිටීමටත් ඔහුට අවසර තිබුණි. කෙසේ වුවද, නිමල් නිරන්තරයෙන් පහරදීම්වලට ලක් කරනු ලැබුණි. කොස්තාපල්වරයාගේ ප්‍රියතම හිංසන ක්‍රියාව වූයේ රැඳවියකු හා මුහුණින් මුහුණ හිඳ ඔහුගේ කෙස් වැටියෙන් අල්ලා උදරයට හිරවන සේ හිස පහතට නවගෙන සිටීමයි. ඉක්බිති ඔහු සිය අත්ල වකුටු කොට කොඳු නාරටියේ මැදට වන්නට වූ නිශ්චිත ස්ථානයකට වැරෙන් පහර දුන්නේය. මෙම තාක්ෂණය ඔහු මනාව ප්‍රගුන කර තිබිණ. ඔහු හැමවිටම නිමල්ගේ කොඳු නාරටියේ එකම තැනට පහර දුන්නේය. එය හැමවිටම ප්‍රබල වේදනාවක් ඇති කළේය.

179. සාමාන්‍යයෙන් නිමල්ගෙන් ප්‍රශ්න කරනු ලැබුවේ තුන්වැනි ඒකකය භාර නිලධාරී ජනකාන්ත විසිනි. හෙතෙම නිමල්ගෙන් ඔහුගේ වැඩ කටයුතු ගැනත්, ඔහුගේ සගයන් ගැනත්, ඔවුන්ගේ වැඩ කටයුතු එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධයක් තිබුණේද යන්න ගැනත් විමසීය.

180. ම්ලේච්ඡ ලෙස පහර දෙන ලද ඔහු හා සිටි දෙමළ රැඳවියන් මෙන් නොව, නිමල් සාමාන්‍යයෙන් පීඩාවට බඳුන් කරන ලද්දේ මානසිකව ය.දෙමළ රැඳවියන් බියජනක ලෙස වධයට පමුණුවනු බලා සිටීමට ඔහුට බල කෙරුණි. එක් අවස්ථාවකදී, මැදියම් රැයේ, දෑත් මාංචු ලෑ රැඳවියකු කොස්තාපල්වරයා විසින් කාමරයට ගෙන එන විට නිමල් නින්දේ සිටියේය. කොස්තාපල්වරයා විසින් තමා ඉදිරියේම එම මිනිසාට වධහිංසා පමුණුවනු නිමල් බලා සිටියේය. ඔහුගේ ඉල බැරැන්දවලටත්, උදරයටත් අත් මිටින් පහර දුන් අතර සිමෙන්ති පිරවූ පයිප්ප බටවලින් ඔහුගේ දෙපාවලට පහර දෙනු ලැබුණි. එය පැය බාගයක් පමණ වේලා සිදුකෙරුණි; ඒ මිනිසා හඬමින් විලාප දුන්නේය. ඔහු මරා දමන බවට කොස්තාපල්වරයා තර්ජනය කළ අතර 'තම බිරිඳ ගැබිනියක බවත්, තම දරුවා දකිනු පිණිස ජීවත්වන්න ඉඩ දෙන්නැ'යි ඒ මිනිසා කැඩුණු සිංහලෙන් ආයාචනා කළේය.

181. මුරකාවලුන් රාත්‍රී සහ දිවා සේවා මුර අනුව වැඩ කල අතර, උදැසන වැඩ මුරය ආරම්භ වූ විට, තමන් ඉකුත් රාත්‍රියේ රැඳවියන්ට වධහිංසා පැනවූ ආකාරය සෙස්සන් හා රස කර කීමෙන් කොස්තාපල්වරයා ආස්වාදයක් ලැබීය.

182. කොස්තාපල්වරයා විසින් සිය මිතුරා වූ සිවාට කළ දෙය නිමල් කිසි කලෙක අමතක නොකරනු ඇත. එක්තරා දහවලක, 'මම අරුව ගන්න යන්නේ'යි කොස්තාපල්වරයා සෙස්සන්ට කීවේය. ඔහු අදහස් කළේ කුමක්දැයි කිසිවකු දැන නොසිටියේය. නමුත් එදා රාත්‍රියේ දරුණු ළතෝනියකින් නිමල් කැළඹුණේය. පසුදින උදෑසන, වතුර ටැංකිය අසළට ගිය නිමල් ලෙයින් පෙඟුණු සිවාගේ තුවාය දුටුවේය. 'ඊයේ රෑ යමක් සිද්ධ වුණා'යි කොස්තාපල්වරයා පසුදා නිමල් හා කීවේය. ඔහු සහ අනෙක් නිලධාරීන් 'ක්‍රිකට් විකට් එකක් සිවාගේ පස්ස පැත්තෙන් ඇතුල් කළ' බව ඔහු ප්‍රකාශ කළේය. තමන් එය කළ ආකාරය හා සිවා විලාප දුන් ආකාරය විස්තර කරමින් කොස්තාපල්වරයා පුරසාරම් දෙඩවීය. දින කිහිපයකට පසු, මළ මිනිසකු බඳු සිවා තුන්වැනි ඒකකයේ කාර්යාලයට පෙරළා රැගෙන යනු ලැබුණි.

183. මේ කාලය පුරාම, සෙස්සන්ට කායික වධහිංසා පමුණුවනු බලා සිටින්නට නිමල්ට බල කෙරුණු අතර සිවාට එරෙහිව සාක්ෂි දෙන්නැයි පීඩනයක් නිලධාරීන් විසින් ඔහුට ඇති කළේය.

184. තුන්වැනි ඒකකයේ රඳවා සිටියදී, වෙනත් ආරක්ෂක සේවාවන්වල ශාඛා සාමාජිකයන් මිනිසුන් ප්‍රශ්න කරනු වස් එහි යන එනු නිමල් නිරීක්ෂණය කළේය. කොස්තාපල්වරයා විසින් ඔවුන් හඳුන්වන ලද්දේ 'බුද්ධි අංශ' යනුවෙනි. මෙම පුද්ගලයෝ මනා පිළිවෙලකින් යුතුව, අත් දිග කමිස හැඳ, විශේෂ බෑග් සහ ලිපි ගොනු මිටි රැගත් පිරිසක් වූහ. සමහර අවස්ථාවල ඔවුහු එහි පැමිණ රැඳවියන් කැටුව ගියෝය.

185. එක් අවස්ථාවකදී, තුන්වැනි ඒකකය බාර නිලධාරී ජනකාන්තගේ කාර්යාලය තුළ සිටිය දී විවරව තිබූ ලාච්චුවක රැඳවුම් නියෝග මිටියක් නිමල් දුටුවේය. එකී නියෝග මුද්‍රිත අකුරින් තිබූ අතර, අත්සනට පසෙකින් 'ආරක්ෂක ලේකම්' යැයි රබර් මුද්‍රාවක් වැදී තිබුණි. මේ පිළිබඳ වඩා මිත්‍රශීලී නිලධාරියකුගෙන් ඔහු විමසූ විට, ඒ අත්සන 'ඉහළම ලොක්කා'ගේ යැයි ඔහු පැහැදිලි කළේය. තමන් මෙහෙයුමක් දියත් කිරීමට කලින් 'ප්‍රධානියාගේ' අවසරය ලබාගැනීම අවශ්‍ය බැව් ඔහු පහදා දුනි.

186. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය බාරයේ රඳවා සිටි සති කිහිපයකට පසු, නිමල් අධිකරණයට කැටුව ගොස් නිදහස් කරනු ලැබීය. කිසිදු අපරාධ චෝදනාවක් ඔහුට එරෙහිව එල්ල නොකෙරුණි.

187. කෙසේ වුවද, තමන් ගැන සෝදිසියෙන් සිටින බව ඔහු පසක් කරගත්තේය. ඔහු සිටින්නේ කොහේද, කරමින් සිටින්නේ කුමක්ද යන්න දන්නා බව පෙනුණු නිර්නාමික ඇමතුම්කරුවන්ගෙන් ඔහුට තර්ජන එල්ල වුණි. ඔහුගේ නිවස අවට නාඳුනන ජනයා ගැවසුණෝය.

188. තම ආරක්ෂාව ගැන බිය වූ නිමල් සහ ඔහුගේ පවුල ශ්‍රී ලංකාවෙන් පලා ගොස් විදේශයක රැකවරණ සෙවූහ.

189. නිමල් මුහුණ දුන් බිහිසුණු අත්දැකීම විසින් නොනැසී පවත්නා තදබල කායික හා මානසික ක්ෂතියක් ඔහු තුළ ඉතිරි කොට තිබේ. කොස්තාපල්වරයා විසින් සිය කොඳු නාරටියේ පහර දුන් තැන වේදනාව වසර ගණනාවකට පසුත්, ඔහු විඳවනු ලබයි. වරදකාරී බව හා ලැජ්ජාව පිළිබඳ හැඟීම්වලින් ඔහු රෝගීව ජීවත් වේ. බලහත්කාරයෙන් තමන්ට නැරඹීමට සිදු වූ වධහිංසා පමුණුවීමේ දසුන් මනසින් ප්‍රතිවාදනය වනු පාලනය කිරීමට අසමත් ඔහු අතීතාවර්ජනයන් හා දුස්-ස්වප්නයන්ගෙන් පීඩා විඳියි.

## VIII. සමන් පෙරේරා වධහිංසාවට ලක්කිරීම

190. සමන් පෙරේරා ශ්‍රී ලාංකීක සිංහලයෙකි. 2011 ගිම්හානය වනවිට සමන්, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ එක්තරා අංශයක සිවිල් සේවකයකු වශයෙන් වැඩ කරමින් සිටියේය. එක් සවස් කාලයක, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය හෙවත් ටීඅයිඩීයේ නිලධාරීන් ලෙස තමන් හඳුන්වා දුන් සිවිල් හැඳගත් අයවළුන් විසින් ඔහුගේ නිවසේදී ඔහුව අත්අඩංගුවට ගන්නා ලදී.

### *අ) "හතරවැනි තට්ටුවේ" දී වධහිංසා සහ ලිංගික හිංසන*

191. කොළඹ 'හතරවැනි තට්ටුව' ගොඩනැගිල්ලට රැගෙන ගිය සමන්, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් සති කිහිපයක් රඳවා තබා ගන්නා ලදී. මේ කාලය තුළ, ඔහු රඳවා තිබුණේ යපොලු යොදා නිශ්චිත අවශ්‍යතාවක් සඳහා සාදන ලද රැඳවුම් කුටියක් තුළ ය. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ පස්වැනි ඒකකයේ රත්නායක නමින් හඳුන්වනු ලැබූවකු ඇතුළු නිලධාරීන් ගණනාවක් විසින් ප්‍රශ්න කිරීම සහ වධහිංසාවට ලක්කරණු පිණිස, මෙම ස්ථානයෙන් වෙනත් කාමරයකට ඔහුව නැවත නැවතත් රැගෙන යන ලදී.

192. අතිරේක ආරක්ෂක ලේකම්වරයාගේ අත්සනින් හදිසි නීතිය යටතේ සමන්ගේ රැඳවුම් නියෝගය නිකුත් කරන ලද්දේ කොළඹ 1 නව මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 6 වැනි මහලේ පිහිටි ආරක්ෂක අමාත්‍යාංශය විසිනි.

193. 'වධක කුටිය' පිහිටා තිබුණේ සමන්ගේ රැඳවුම් කුටිය වූ කොරිඩෝරයේම එහාට වන්නට ය. ඔහු සහ අනෙක් සිරකරුවන් එහි ගෙනයනු ලැබුණේ නිරුවත්ව දෑස් බැඳදමා ය. වධහිංසනය සඳහා සැලසුම් කළ විශාල කාමරයක් වූ එහි සිවිලිමේ, ප්‍රශ්නකරන්නන් විසින් රැඳවුම්කරුවන් හිස පහළට සිටින සේ ලණුවකින් එල්ලනු පිණිස යොදාගත් යකඩ බාල්කයක් තිබිණ. ඒ තුළ වධයට භාජනය කරනු ලැබූවන්ගේ මරහඬ ඔහුට අසන්නට ලැබුණි.

194. ප්‍රශ්නකරන්නන් විසින් රැඳවියන් වධයට භාජනය කරන ලද්දේ සන්ධ්‍යාවන්හිදී ය. ප්‍රශ්න කිරීම සඳහා සමන් රැගෙන ගිය සෑම අවස්ථාවකදී ම ඔහුව නිරුවත් කරනු ලැබුණි.

195. අනේක වාරයක් වධක කුටියට රැගෙන යන ලද සමන් හිංසනයටත්, අවමානයටත් පාත්‍ර කෙරුණි: ඔහු නිරුවත්ව දෙපයින් එල්ලා තබා සිටියදීත්, බිම වැතිරී සිටියදීත් ඔවුහු ඔහුට පහර දුන්හ. ඔහුගේ නාසය බිඳ, කන්වලට පහර දී, වෘෂණ කෝෂ මිරිකා, දෑස්වලට මිරිස් කුඩු දැමූ ඔවුහු ටී 56 ප්‍රහාරක රයිෆලයකින් පහර දී ඔහුගේ ඇඟිලි කඩා දැමූහ. ඔහු වතුර ඉල්ලා සිටි විට ඔවුහු ඔහුට මුත්‍රා පානය කරන්නට සැලැස්වූහ. කටු කම්බි ඇතුල් කළ පයිප්ප බටයක් ඔහුගේ ගුද මාර්ගය තුළට බලෙන් ඇතුල් කළ ඔවුහු ඔහුව ලිංගික වශයෙන්ම වධයට පැමිණවූහ. එසේ කළ පසු, මුලින් පයිප්ප බටය පිටතට අදින ලද ඔවුහු, අනතුරුව ඔහුගේ ගුද මාර්ගය ඉරී අධික ලෙස රුධිරය වහනය වන්නට සළස්වමින් කටු කම්බිය සෙමින් පිටතට ඇද්දාහ.

196. ඇතැම් අවස්ථාවලදී ප්‍රශ්න කිරීමේ කාමරයට පැමිණෙන ස්ථාන භාර නිලධාරී ප්‍රසන්න ද අල්විස්, වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබාගන්නා මෙන් නිලධාරීන්ට බල කළේය. ප්‍රසන්න විසින් ද, සමන්ට පහර දී මරා දැමීමට තර්ජනය කළේය.

197. අනෙක් අවස්ථාවලදී, ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අවශේෂ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කාමරවල වඩා විශාල කාමරයක් වූ ප්‍රසන්නගේ කාර්යාලය තුළ දී සමන්ව ප්‍රශ්න කිරීම්වලට භාජනය කරනු ලැබුණි. ප්‍රසන්න සම්මානයක් භාරගන්නා අවස්ථාවක සේයාරුවක් බිත්තියක එල්ලා තිබුණි. ඔහුට පුටුවක් ලබාදෙනු වෙනුවට, ප්‍රසන්න විසින් හැම විටම ඔහුට තම මේසය අසළ දණගසාගෙන සිටීමට සැලැස්වීය. එහිදී, එල්ටීටීඊ සංවිධානයට සහාය ලබාදීම ගැන ඔහුට චෝදනා කළ ප්‍රසන්න, එල්ටීටීඊ සංවිධානයට සහයෝගය පළකරන වෙනත් රජයේ නිලධාරීන්ගේ නම් ඉල්ලා සිටියේය. තමන් එවැනි දෙයක් කර නැති බව සමන් අවධාරණය කළ විට, ඔහුගේ හිස අවට ප්‍රදේශයට පහර දී, පා පහරවල් එල්ල කළ ප්‍රසන්න , ඇත්ත නොකීවහොත් තමන් ඔහු බූස්ස සිර කඳවුරට යවන බව කියා සිටියේය.

*ආ) ආරක්ෂක ලේකම්වරයාගෙන් දුරකතන ඇමතුමක්*

198. එක් අවස්ථාවකදී, ප්‍රසන්නගේ මේසය අසළ සමන් දණ ගසාගෙන සිටියදී දුරකථනය නාද විණ. දුරකථනයට පිළිතුරු දුන් ප්‍රසන්නගේ සහායකයා අමතුම්කරුට 'කරුණාකර රැඳී ඉන්නැ'යි කීවේය. ඉක්බිති, සහායකයා " මේ, ආරක්ෂක ලේකම්"යි ප්‍රසන්නට රහසේ මිමිණුවේය.

199. ඒ වකවානුවේ ආරක්ෂක ලේකම්වරයා ගෝඨාභය රාජපක්ෂ ය.

200. දුරකථනය අතට ගත් ප්‍රසන්න මිනිත්තු 2-3ක පමණ කාලයක් දුරකථනයට පිළිතුරු දුන්නේය: "ඔව් සර්, මම කරන්නම්. ඔව්, මම ඒ ගැන හොයලා බලන්නම්. හරි, මම ඒ ගැන සොයා බලන්නම්. හරි සර්, හරි". දුරකථන සංවාදය අවසන් කළ ප්‍රසන්න කාමරයෙන් පිටව ගොස් විනාඩි 10කින් පමණ යළිත් පැමිණියේය. ඒ වන විටත් බිම දණ ගසාගෙන සිටි සමන්ට පහර දුන් ඔහු, එහි වූ වෙනත් නිලධාරියකු අමතා ඔහුව රැඳවුම් කුටියට රැගෙන යන්නැයි කියා සිටියේය.

201. වෙනත් මාලයක වූ ප්‍රශ්න කිරීමේ කාමරයකට සමන්ව රැගෙන ගිය අවස්ථා ද තිබිණ. දණහිස් හිරි වැටීමට හා වේදනාවකට ලක් වන සේ ලෝහ කෝප්ප මත දණ ගසාගෙන සිටීමට ඔහුට බල කරනු ලැබුණි. ලෙයින් නැහැවුනු වෙනත් රැඳවියන් ඔහු දුටු අතර, මිනිසුන් වේදනාවෙන් ළතෝනි දෙනු ඔහුට ඇසුණි.

202. පසුව අධිකරණය හමුවට පමුණුවන ලද සමන් රිමාන්ඩ් බන්ධනාගාරයකට යොමුකරනු ලැබුණි. ඒ වසරේදීම පසුව ඔහුවා මුදා හරින ලද අතර ඔහුට එරෙහිව වූ සියළු චෝදනාවලින් නිදොස් කරනු ලැබුණි

203. ඔහු නිදොස් කෙරුණු පසුත්, නිලධාරීන් ඔහු සොයා ආ අතර අවසානයේ ශ්‍රී ලංකාවෙන් පලා ඒමට ඔහුට බල කෙරුණි.

204. ඔහු අත් විඳි වධහිංසා හේතුවෙන් අද වනතුරුත් සමන් කායික හා මානසිකව විඳවන්නේය. කාලයක් තිස්සේ පවතින කායික වේදනාවන්ගෙන් සහ පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ වධහිංසා පමුණුවනු සිහිනයෙන් දැක බියව මරහඬ දෙමින් මුත්‍රා පහව අවදිවීම ඇතුළු නිත්‍ය  මානසික ක්ෂතියෙන් ඔහු පීඩා විඳියි. වධහිංසා

පමුණුවන අතර නාසය බිඳ දැමීමෙන් පසු නිරන්තරයෙන් ඔහුගේ නාසයෙන් ලේ ගලන අතර ස්වකීය පවුලෙන් වෙන්ව ජීවත්වීම හේතුවෙන් පිටරට දී සිය දිවි හානි කරගැනීමට ද හෙතෙම උත්සාහ කර තිබේ.

## IX. සෙන්දිල් පුවනේස්වරන්ට සිදුකළ වධහිංසා

205. ශ්‍රී ලාංකික දෙමළ සම්භවයක් ඇති සෙන්දිල් පුවනේස්වරන් බ්‍රිතාන්‍යයට පැමිණියේ උපාධි අධ්‍යාපනය සඳහා ය. එහිදී රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව උද්ඝෝෂණය කිරීමටත්, වෙනත් දෙමළ අය හා එක්ව දේශපාලන ක්‍රියාකාරකම්වල යෙදීමටත් ඔහුට නිදහසක් ලැබුණි.

206. 2011 අගභාගයේදී රෝගී පවුලේ සාමාජිකයකු දැක බලා ගැනීම පිණිස සෙන්දිල් ශ්‍රී ලංකාවට පෙරලා ගියේය. ගුවන් තොටුපලේදී ඔහු නවතා ගත් ආගමන විගමන නිලධාරීහු රාජපක්ෂ ආණ්ඩුවට විරුද්ධව යුරෝපයේ උද්ඝෝෂණවලට සහභාගි වී තිබේදැයි ඔහුගෙන් විමසූහ. යන්නට ඉඩ දුන් පසුව ඔහු ශ්‍රී ලංකාවේ උතුරේ පිහිටි සිය පාරම්පරික ගම බලා ගියේය. ගමේදී මිතුරන් හමුවීමට ගිය ඔහු ශ්‍රී ලංකාවේ දේශපාලනයත්, රාජපක්ෂ ආණ්ඩුවට විරුද්ධව ලන්ඩනයේ පවත්වන ලද උද්ඝෝෂණත් පිළිබඳව සාකච්ඡා කළේය. ඒ සාකච්ඡා පසු කලෙක ඔහු හඹා එන්නට විය. අත්අඩංගුවේ ඔහුගෙන් ප්‍රශ්න කළ ප්‍රශ්නකරුවෝ ඒ කතාබහේ විස්තර දැන සිටියහ. කවරකු හෝ ඔහු ගැන ඔත්තු දී තිබුණි.

*අ) පැහැරගැනීම*

207. දිනක් ඔහු ගමේ වෙළෙඳ සලකට ගොස් නිවස බලා ආපසු එද්දී, ජීප් රියකින් පැමිණි නිල ඇඳුම් ඇඳ සිටි පිරිමි කණ්ඩායමක් විසින් ඔහු නවතනු ලැබිණි. ඔහුගෙන් ප්‍රශ්න කිහිපයක් අසන්නට තිබෙන බව ඔවුහු පැවසූහ. ඔහුගේ අත්වලට මාංචු දැමූ එක් නිලධාරියකු විසින් ඔහු ජීප් රිය තුලට ඇද දමන ලදී. මුලින්ම ළඟ තිබෙන හමුදා කඳවුරකට ගෙනගොස් දවස් කීපයක් එහි සිරකරගෙන සිටි ඔහුගෙන් බ්‍රිතාන්‍යයේ අධ්‍යාපනය ලබද්දී සිදුකළ දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳව විමසන ලදී. ප්‍රශ්නකරන්නන් අත ඔහු පිළිබඳ ලිපි ගොනුවක් තිබුණි. මේ ප්‍රශ්න කිරී වලදී ඔහුට බැටන් පොලුවලින්ද, යකඩ පටියක දාරයෙන්ද තලන ලදී. ඔහුගේ හිස බිත්තියේ ඇන බර සපත්තු දැමූ පයින් ගසන ලදී. ඔහුගෙන් කරන ලද ප්‍රශ්න කිරීම් සම්බන්ධයෙන් ලිපි ගොනුවක සටහන් තබා ගන්නා ලදී.

208. තොරතුරු සහිත ලිපි ගොනුවත් සමගම ජෝසප් කඳවුරට යවන ලද සෙන්දිල්, එහිදී ඡායාරූප ගතකොට, ඇඟිලි සලකුණු ගෙන, යට ඇඳුමින් පමණක් යුතුව භූගත කුටියක සිර කරන ලදී. ඊළඟ දින පහේදී නිලධාරීන් කණ්ඩායමක් විසින් ඔහුගෙන් දිගින් දිගටම ප්‍රශ්න කරන ලදී.

209. කලින් හමුදා කඳවුරේදී ඔහු කියූ දේවල් ප්‍රශ්නකරුවෝ ඒ වනවිටත් දැන සිටියහ. ඒ ප්‍රශ්නම නැවත ඇසූ ඔවුහු සෙන්දිල් එල්ටීටීඊ සාමාජිකයකු බවට චෝදනා කළහ. ඔහු එය ප්‍රතික්ෂේප කළ විට, යකඩ විලි දැමූ පොලුවලින් කොන්දට, උරහිසට, කකුල් සහ ලිංගේන්ද්‍රියට ඔවුහු පහර දුන්හ. නිලධාරීන් ඔහුට සිංහලෙන් කෑගැසුවත්, ඒ කිසිවක් ඔහුට වැටහුනේ නැත.

210. තවත් අවස්ථාවලදී, ඔහුගෙන් ප්‍රශ්න කිරීමට කරදර නොවූ නිලධාරීහු කාමරයට ඇතුල් වූ විගස ඔහුට කුරිරු ලෙස පහර දුන්හ. වටේට ඔහු ඇදගෙන ගොස්, ඔලුව බිත්තියේ ඇන, ඉවක් බවක් නැතිව, බැටන් පොලු වලින් සහ වයර් වලින් පහර දුන්හ.

*ආ) ජෝසෆ් කඳවුරේදී හංවඩු ගැසීම*

211. දෙවැනි දිනයේ හෝ ඊට ආසන්න දිනකදී ප්‍රශ්නකරුවෝ රත් යකඩ පොලුවලින් සෙන්දිල් හංවඩු ගැසූහ. ශරීරයේ විවිධ කොටස් වල හංවඩු ගැසීම පහසු වන පිණිස ඔහු රඳවාගත්තෝ විවිධ ඉරියව්වල තබා ඔහු හිර කළහ. නිලධාරීන් කිහිප දෙනකු ඔහුට බිත්තියකට තබා සිරකොට අල්ලාගෙන සිටියදී තවත් අයෙක් ඔහුගේ පිට මත රත් වූ යකඩයෙන් දිගට හරහට ඉරි ඇන්දේය. පසුව, නිලධාරීන් කිහිප දෙනෙක් ඔහු උඩුබැල්ලෙන් හිරකොට තබා පපුවේ හංවඩු ගැසීමෙන් අනතුරුව අනික් පැත්තට හරවා කකුල් සහ පිට හංවඩු ගැසූහ. නවත්තන ලෙස ඔහු ඔවුන්ට පින්සෙන්ඩු විය. බලහත්කාරයෙන් ඔහු දණගැස්වූ විට කලවේ පිලිස්සුම් තුවාල බත්කෙන්ඩේ තුවාල වල ඇලුණි. හංවඩු ගැසීමෙන් පසු ඔහුගේ හිස බිත්තියක අනින ලදී. මේ සියලු වධබන්ධන බලා සිටීම සඳහා තවත් නිලධාරීහු කාමරයට පැමිණියහ. කොක් හඬ දුන් ඔවුහු ඔහුට, ඔහුගේ පවුලේ උදවියට සහ දෙමළ ජනතාවට අසභ්‍ය අපහාස කළහ.

212. තවත් දවසක සෙන්දිල් පාපොච්චාරණයක් ලියාදීම ප්‍රතික්ෂේප කළ විට ඔවුහු නැවතත් ගිනියම් යකඩ පොලු වලින් ඔහු පිළිස්සූහ. ජීවිතය බේරා ගැනීම සඳහා පසුබෑ ඔහුට දෙමළ කතා කරන නිලධාරියකු විසින් අණ කරන ලද දේ ලියන්නට සිදුවිය.

213. ජෝසොෆ් කඳවුරේ රඳවාගෙන සිටි පළමු සතිය ගතවූ පසු ඔහුගේ සිර කුටියට ආ මුරකරුවෝ ඔහුට ටී ෂර්ට් එකක් සහ දිග කලිසමක් දුන්හ. දෑස් වසා බැඳ ඔහු එළියේ නවතා තිබූ වාහනයකට ඇදගෙන යන ලදී. පැයක් පමණ ගමන් කල වාහනය නවතා ඔහු එළියට ඇද දමන ලදී. ඔහු මුණ ගැසුණු නන්නාඳුනන පුද්ගලයෙක්, තමන් සෙන්දිල් නිදහස් කරගැනීම සඳහා පවුලේ සාමාජිකයන් විසින් මුදලට යොදාගන්නා ලද නියෝජිතයකු ලෙස හඳුන්වා දුන්නේය.

214. ඥාතියකු රැඳී සිටි නිවසකට සෙන්දිල් රැගෙන යනු ලැබුණි. ඔහු තම ඇඳුම් ගලවන්නට උත්සාහ කළත් සමේ පිළිස්සුම් තුවාලවලින් වෑහෙන ඕජස්වල වස්ත්‍රය ඇලී සිටියේය. එසේ ඇළුණු රෙදි ගළවා ඉවත්කිරීම සඳහා වතුරෙන් පෙඟවීමට ඔහුට සිදුවිය. කුඩු කරන ලද ප්‍රතිජීවක තුවාලවල ගෑ ඔහුගේ ඥාතියා ඊළඟ දවසේම ඔහු කටුනායක ගුවන් තොටුපලට වහාම ගෙන ගියේය. ඔහු නිරුපද්‍රිතව එංගලන්තයට ආපසු පැමිණියේය.

215.  සෙන්දිල් ශ්‍රී ලංකාව හැරදා පැමිණි දවසේ සිට ඔහුගේ පවුලේ උදවිය ශ්‍රී ලංකාවේ බලධාරීන්ගේ ප්‍රචණ්ඩ හිරිහැර හා අඩන්තේට්ටම් වලට මුහුණ දී තිබේ. 2013 අග භාගයේ නිල ඇඳුම් ඇඳගත් සොල්දාදුවෝ ඔහුගේ මහ ගෙදරට පැමිණියහ. සෙන්දිල්ගේ පියාට පහර දී වවුනියාව පොලිස් ස්ථානයට ගෙන ගිය ඔවුහු ඔහු ඉන්නා තැන හෙළි කරන්නට පියාට කීහ. පොලිසිය අන්තිමේදී ඔහුගේ පියා නිදහස් කළේ කොන්දේසි තුනක් යටතේය. පවුලේ සාමාජිකයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සමග ගනුදෙනු නොකළ යුතුය, එල්ටීටීඊ සංවිධානයට උපකාර කරන පවුල් සමග කතා නොකළ යුතුය, මාස තුනක් ඇතුලත සෙන්දිල් පොලිස් ස්ථානයට ගෙන ආ යුතුය.

216. 2016 දී ඔවුන්ගේ නිවසට පැමිණි සිවිල් ඇඳුම් හැඳගත් නිලධාරියෝ සෙන්දිල් සහ ඔහුගේ සහෝදරයා ගැන ප්‍රශ්න කළහ. ඒ ගැන කියන්නට සෙන්දිල්ගේ දෙමාපියෝ නොදත්හ.  නිලධාරීහු ඔහුගේ පියාට නහය කැඩෙන්නට බැට දුන්නහ.  ඇතිවුනු කලබගෑනිය ඇසී අසල්වාසීන් නිවසට ඇදී ඒම නිසා නිලධාරීන්ට හැරී යන්නට සිදුවුනි.

217. දුස්ස්වප්න හා බියජනක ආවර්ජනවලින් සෙන්දිල් අදත් තැති ගනී. චිත්ත ඒකාග්‍රතාව ඇති කරගත නොහැකි වීමෙන් ඔහුට උපාධි අධ්‍යයන කටයුතු අවසන් කිරීම පමා කරන්නට සිදුවිය. තවමත් මානසික හා ශාරීරික වේදනාවෙන් පීඩා විඳින ඔහුගේ පිටේ හංවඩු කැළැල් තිබේ.

218. සෙන්දිල්ට විරුද්ධව කිසිදු අපරාධයක් සම්බන්ධයෙන් කිසිවිටෙකත් නඩු පවරා නැත.

## X. රමණන් සිවලිංගම්ට සිදුකළ වධහිංසා

219. රමණන් සිවලිංගම් දෙමළ සම්භවයක් ඇති ශ්‍රී ලාංකිකයෙකි. 2008 වසරේදී ඔහු විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටියේය. එක් දිනක් ඔහුගේ පංතියේ මිතුරෙක්, ආසන්නයේ වූ භාණ්ඩ අළුත්වැඩියා කරන කඩයක් වෙත ගෙන එන ලදුව එහෙත් එසේ කිරීමට අසමත් වූ කුඩා ස්ටීරියෝ ස්පීකර් යුගළක් ඔහු ලඟතබා යාමට හැකිදැයි විමසා සිටියේය. ඒවා ගෙන යාමට පසුව පැමිණෙන බවත් එවිට වෙනත් කඩයක් වෙත ගෙන යන බවත් මිතුරා පැවසීය. තම  පංතියේ මිතුරා එල්ටීටීඊය සමඟ සම්බන්ධ බව එම කාලයේදී රමණන් දැන සිටියේ නැත.

*අ) දෙමටගොඩ පොලිස් ස්ථානයේදී අත්අඩංගුවට ගැනීම හා වධහිංසා කිරීම*

220. 2008 වසරේ ජුනි මාසයේ හෝ ඒ ආසන්නයේ, රමණන්ගේ නිවස්නය පරීක්ෂා කිරීමට පොලිස් නිලධාරීන් කණ්ඩායමක් පැමිණියහ. ඔවුන් ඔහුව අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම සඳහා කොළඹ දෙමටගොඩ පොලිස් ස්ථානය වෙත රැගෙන එන ලදී. ඔහුව ඡායාරූප ගතකොට ඇඟිලි සළකුණු  ලබා ගැනුණි.

221. ඉන් පසුව එළඹි සතියේදී, ඔහුව පොලිස් ස්ථානයේ රඳවා තබාගත් අතර වධහිංසාවන් යටතේ ප්‍රශ්න කෙරුණි. ඔහුව ප්‍රශ්නකරන්නන් පිළිතුරු ලබාගත්තේ පහරදීම් හා හුස්ම සිරකිරීම්   තුළිනි. ඔහු එල්ටීටීඊ සාමාජිකයෙක් බවට චෝදනා කළ ඔවුහු, එල්ටීටීඊ ය තුළ සිටිනා ඔහුගේ පංතියේ මිතුරන් හෙළිදරව් කරන ලෙස බල කළහ. ඔහුගේ නිවසේ වූ ස්ටීරියෝ ස්පීකර් තුළ තිබී පුපුරන ද්‍රව්‍ය සොයාගත් බවට ඔව්හු චෝදනා කළහ. රමණන් හට ඒ සම්බන්ධව කිසිදු අදහසක් නොතිබිණි: ඒවා ස්ටීරියෝ ස්පීකර් මිස අන් යමක් ලෙස සිතන්නට ඔහුට හේතුවක් නොවීය.

222. ඔහුව ප්‍රශ්නකරන්නන් ලී පොලුවලින් ඔහුට පහර දුන් අතර ගුටි ඇනීම් හා පා පහර එල්ල කළහ. ඔවුහු ඔහුගේ හිස බිත්තියේ තදින් වැද්දූහ. පෙට්‍රල් පෙඟවූ ප්ලාස්ටික් මල්ලකට හිස ඔබා ආශ්වාස කරන්නට ඔහුට බල කෙරුණි. හුස්ම ගැනීමට මහත් වෑයමක් දරන්නට සිදුවූ අතර හුස්ම හිර වෙන්නා සේ ඔහුට දැනුණි. දවස් ගණනාවක් යන තුරුම පෙට්‍රල් ගන්ධයත් කරකැවිල්ලත් ඔහුගේ හිස තුළ විය.

223. සතියකට පමණ පසු, පොලීසියට මුදල් ගෙවා පවුලේ අය ඔහු නිදහස් කර ගත්හ. ඔහුට එරෙහිව කිසිදු චෝදනාවක් ගොනු නොකෙරුණි. අවසානයේ යථා තත්ත්වයට පත් වූ ඔහු නැවත විශ්ව විද්‍යාලයට යාම ඇරඹීය. එහෙත් උපාධිය සම්පූර්ණ කර ගැනීමේ ඔහුගේ සැළසුම් අතරමග නැවතුණි.

## *ආ) පැහැර ගැනීම සහ හුදකලා සිර අඩස්සියෙහි තබා ගැනීම*

224. ඊළඟ වසරේදී ශ්‍රී ලංකා රජය හා එල්ටීටීඊය අතර පැවති සිවිල් යුද්ධය නිමාව දුටුවේය. එල්ටීටීඊය විසින් පාලනය කරන ලද ශ්‍රී ලංකාවේ උතුරු පළාත සම්පූර්ණයෙන්ම හමුදාව විසින් ආක්‍රමණය කොට අත්පත් කරගන්නා ලදි. යුද්ධය නිසා අවතැන් වූ දහස් ගණනක් සාමාන්‍ය ජනයා රැඳවුම් කඳවුරුවලට ගාල් කෙරුණි. එල්ටීටීඊ සාමාජිකයෙකුව සිටි රමණන්ගේ දුර ඥාතියෙක් එවන් එක් කඳවුරකින් බේරී පලා ගොස් රටින් පිටවීමට උත්සාහ දරා තිබුණි: අල්ලා ගත්තේ නම් ඔහුගේ ජීවිතය අනතුරක විය.

225. 2009 වසන්තයේ දී ඔහුගේ ඥාතියා කොළඹට පැමිණි අතර උප්පැන්න සහතිකය හා ගමන් බලපත්‍රය ලබා ගැනීමට තමාට සහය වන මෙන් හෙතෙම රමණන්ගෙන් ඉල්ලා සිටියේය.

226. දින කිහිපයකට පසු, අවන්හලක සිට පෙරලා ගෙදර බලා පැමිණෙමින් සිටි රමණන් ඉදිරියේ අංක තහඩු නොමැති වෑන් රියක් නැවැත්වීය. සාමාන්‍ය ඇඳුමින් සැරසුන මිනිසුන් කණ්ඩායමක් විසින් විවෘත වූ පැති දොරෙන් ඔහුව බලහත්කාරයෙන් ඇතුළට තල්ලු කෙරුණි. ඔහු උදව් ඉල්ලා කෑගැසුවද සද්ද කළහොත් මරා දමන බවට ඔවුහු තර්ජනය කළහ. ඔහුගේ දෑස් බැඳ දැමූ ඔවුහු, වාහනයක නංවාගෙන රැඳවුම් කඳවුරක් වෙත ඔහුව ගෙන ගියහ. අදාළ ස්ථානයට ඇතුළු වූ වාහනය වේග කඩනයන් මතින් ධාවනය වන්නට විය. ඇතුළත දී ඔහුගේ ඇඟිලි සළකුණු ලබා ගත් අතර ඔහුව නිරුවත් කෙරුණි. අනතුරුව සාමාන්‍ය ඇඳුමින් සැරසුන රැකවලුන් විසින් ඔහුව ඡායාරූප හා වීඩියෝගත කරනු ලැබුණි. ඔවුහු ඔහුව ජනෙල් රහිත සිර කුටියක් තුළ අගුළු ලෑහ.

## *ඇ) වධදීම් හා ලිංගික හිංසනයන් යටතේ ප්‍රශ්න කිරීම*

227. ඊළඟ සති තුනේදී, නැවත නැවතත් ඔහුව තමන්ගේ සිර කුටියේ සිට ප්‍රශ්න කිරීමේ කාමරයක් වෙත රැගෙන යන ලදි. එම කාමරයේ කොන්ක්‍රීට් බංකුවක්, කොන්ක්‍රීට් කණු හා පැල්ලම් ගැසුන බිත්ති තිබූ අතර මහත් දුර්ගන්ධයකින් යුක්ත විය. සිවිලිමේ සිට යකඩ ගරාදි එල්ලා වැටී තිබුණි. ලී මුගුරු, බැටන් පොලු හා වෙනත් මොට්ට ආයුධ එහි විය.

228. රැකවලුන් ඔහුව ප්‍රශ්න කිරීමේ කාමරය වෙත රැගෙන යන සෑම විටෙකම රමණන් භීතියෙන් මර හඬ දුන්නේය. ප්‍රශ්නකරන්නන් ඔවුනොවුන් හා කතා කරන ලද්දේ සිංහල බසිනි. එහෙත් ඔවුහු දෙමළ බසින් ඔහුගෙන් ප්‍රශ්න කරමින්, ඔහුගේ ඥාති සහෝදරයාට සහ වෙනත් එල්ටීටීඊ සාමාජිකයන්හට රටෙන් පැන යන්නට ඔහු උදවු කළ බවට චෝදනා නැගූහ. කලින් වසරේදී ඔහුව දෙමටගොඩ පොලිස් ස්ථානයේ රඳවා තබාගැනීම සහ ප්‍රශ්න කිරීම පිළිබඳව ඒ වන විටත් ඔවුහු දැන සිටියහ. අත්අඩංගුවට ගත් "පසුගිය වාරය" ලෙසින් ඒ ගැන සඳහන් කළ ප්‍රශ්නකරන්නෝ, එයම නැවත කිරීම සහ නොනවත්වාම එල්ටීටීඊයට උදවු කිරීම සම්බන්ධව ඔහුට චෝදනා කළහ.

229. අධික භීතිය නිසා කතා කරගත නොහැකි බව ඔහුට වැටහුණි. එවිට ඔවුහු, ඔහුට පහර දීමට පටන් ගත්හ. කොන්ක්‍රීට් කණුවකට තබා ගැට ගැසූ ඔහුට ලී මුගුරු හා සිමෙන්ති පිරවූ ප්ලාස්ටික් පයිප්ප බටවලින් පහර දුන්හ. ඔවුහු නොනවත්වා මුෂ්ටි පහර දුන් අතර පැළඳ සිටි බරැති බූට් සපත්තුවලින් පා පහර දුන්හ. ඔහුගේ හිස තාප්පයේ ඇන්නාහ. මුහුණ බිමට ස්පර්ශ වන සේ බලහත්කාරයෙන් බිම දිගා කොට, ඇවිදීමට හෝ සිටගැනීමට නොහැකි වන තෙක් ඔහුගේ පතුල්වලට පොල්ලකින් පහර දුන්හ.

230. ඔහු රඳවා ගෙන සිටි කාලය මුළුල්ලේම ප්‍රශ්න කිරීම් සහ පහරදීම් නොනවත්වා සිදුවූ අතර එකිනෙක හා මුසුව තිබුණි. එක් අවස්ථාවකදී ඔවුන්, ඔහුව දෙපයින් එල්ලා, හුස්ම හිරවන තෙක් හිස වතුර පිරවූ බෑගයක ඔබා තිබුණි. තවත් අවස්ථාවකදී පෙට්‍රල් පෙඟවූ ප්ලාස්ටික් මල්ලකින් ඔහුගේ හුස්ම හිර කෙරුණි.

231. ඔවුහු එක්තරා අවස්ථාවකදී ඡායාරූප පෙළකින් මිනිසුන් හඳුනා ගන්නා ලෙස රමණන්ට පැවසූහ. ව්‍යාකූලබව හා භීතිය නිසා එක් ඡායාරූපයක සිටි ඥාතියෙක් හඳුනා ගැනීමට ඔහු අපොහොසත් විය. එවිට ඔහු

බොරු කරන බවට චෝදනා එල්ල විය. එක් රැකවලෙක් ගිනියම් වූ යකඩ කූරක් ගෙන එන අතරේ අනෙක් අය ඔහුව නොසෙල්වෙන ලෙස අල්ලා ගත්හ. ඔවුන් පිලිස්සෙන ලෝහය නැවත නැවතත් ඔහුගේ පසුපසට තබා තද කළේ දැවෙන වේදනාවක් හා ජීවිත කාලයක් රැඳෙන කැළල් ඔහුට අත්කර දෙමිනි. එසේ නොකරන ලෙස රමණන් ඔවුන්ට බැගෑපත් විය. ඒ වෙනුවට තමා මරා දමන්නැයි ඔහු ඉල්ලීය. ප්‍රශ්නකරන්නෝ දුම් පානය කළහ; සිනාසුනහ; කතා බස් කළහ; සිංදු කීහ.

232. එක් වරෙක ප්‍රශ්න කිරීම්වලින් අනතුරුව රමණන් ප්‍රශ්න කිරීමේ කාමරය තුළ තනිව සිටි අවස්ථාවකදී පෙරළා ඔහු වෙත පැමිණි එක් ප්‍රශ්නකරන්නෙක් සිය ලිංගේන්ද්‍රිය රමණන්ගේ මුව තුළට බලහත්කාරයෙන් ඇතුල් කළේ මුව සංසර්ගයේ යෙදීමට බල කෙරෙන අයුරිනි. තවත් වරෙක, ඔහුගේ ප්‍රශ්නකරන්නන් සීතලෙන් මිදුන යම් වස්තුවක් බලෙන් ඔහුගේ ගුද මාර්ගයට ඇතුළු කළේ, බලවත් වේදනාවක් ඔහුට ඇතිකරලමිනි.

233. මෙවන් හිංසනයන් ගෙන් ඇති කළ පීඩනය යටතේ, ඔහුට කියවිය නොහැකි බසකින් - සිංහලෙන් ලියැවී තිබූ පාපොච්ඡාරණයක් වැන්නකට ඔහු අත්සන් කළේය.

234. මෙවන් වධයන්ගෙන් පිරුන සති ගණනාවකින් පසුව, රමණන්ට තනිවම ඇවිද යාමට නොහැකි විය. ඔහුගේ මුහුණ ඉදිමී තිබූ අතර පිටු පස විවෘත තුවාලයන් විය. එක් රාත්‍රියක මිනිසුන් කිහිප දෙනෙක් පැමිණ දෑස් බැඳ, ඔහු සිටි සිර කුටියෙන් පිටතට රැගෙනවිත් වාහනයක නංවාගෙන, පැය ගණනාවක් තිස්සේ ගමන් කළහ. අවසානයේදී ඔවුන් ඔහුව පිටතට තල්ලු කොට, ඔහුව බලාපොරොත්තුවෙන් රැඳී සිටි මිනිසෙක් වෙත බාර දුන්හ. එම මිනිසා රමණන්ට පැහැදිලි කළේ ජෝසොෆ් කඳවුරෙන් නිදහස් වීමට අවශ්‍ය ගෙවීම කිරීමට ඔහුගේ පවුලේ අය තමාගේ සේවය ලබා ගත් බවයි.

235. සිය ජීවිතය කෙරෙහි වූ බිය නිසා, අවසානයේදී සිය පවුලේ අයගේ සහයෙන් ශ්‍රී ලංකාවෙන් පලාවිත් විදේශ රටක රැකවරණය ලබාගත්තේය. තමා ලද වධයන් නිසා අද දක්වාම ඔහු කායිකව හා මානසිකව පීඩා විඳියි. සුළු දුරක් ඇවිද්ද ද ඔහුගේ දෙපා රිදුම් දෙයි. රාත්‍රී කාලයන්හී දී නිරතුරු බිහිසුණු සිහින දකියි; දහවල් කාලය පුරා බියකරු අතීතාවර්ජනයන් ඔහු වෙත වෙයි.

236. රමණන්ට එරෙහිව කිසිදු අපරාධයක් සම්බන්ධයෙන් චෝදනාවන් ගොනු නොකෙරුණි.

## XI. වසන්ති රත්නසිංහම්ට සිදුකළ වධහිංසා

237. වසන්ති රත්නසිංහම් ශ්‍රී ලාංකික දෙමළ කාන්තාවකි. 2000 දී ඇය දෙමළ ඊළම් විමුක්ති කොටි (LTTE) පාලනයේ සිවිල් පරිපාලනයේ මුල්‍ය අංශයේ සේවය කළාය. පෙරට ඇදෙමින් සිටි ශ්‍රී ලංකා යුද හමුදාවේ ඉවක් බවක් නැති ෂෙල් ප්‍රහාරවලට බියේ දහස් සංඛ්‍යාත සාමාන්‍ය වැසියන් පලා ගිය 2009 මුල භාගයේ ඇය සිය නිවෙසින් අවතැන් කරන ලදී.

238. මුහුදු මාර්ගය ඔස්සේ යුද කලාපයෙන් පැන යාමට ඇය උත්සාහ කළත් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඇය අල්ලා ගන්නා ලදී. පොලිසිය භාරයට පත් කරන ලද ඇය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළබඩ පුල්මොඩ්ඩෙ පොලිස් ස්ථානයේ රඳවා තබා ගන්නා ලදී.

239. මාස දෙකක පමණ කාලයක් පුල්මොඩ්ඩෙ පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන සිටි වසන්තිට, අඩුම වශයෙන් තුන් වතාවක් වත් කුරිරු ශාරීරික සහ ලිංගික වධහිංසා පමුණුවන ලදී. ඇගේ වධකයන් වූ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ (TID) නිලධාරීන් වසන්තිගෙන් ප්‍රශ්න කළේ පොලිස් නිලධාරිනිය කාමරයෙන් පිටත් කර හැරීමෙන් පසුය. ඔවුන්ට දැනගන්නට අවශ්‍ය වී තිබුනේ එල්ටීටීඊ මුදල් පරිහරණය සඳහා වගකිව යුත්තේ කවුද යන්න සහ ඒ මුදල් ලැබුනේ කොහින්ද යන්නයි. ඇය පිළිතුරු දුන් විට ඔවුන් කළේ ඇය බොරු කියන බවට චෝදනා කරමින් ඇගේ පිටටත්, කකුල් වලටත් බැටන් පොලු වලින් බැට දීමයි. ඇගේ පියයුරු මිරිකූ ඔවුහු කුණුහරුප කියවමින් “එල්ටීටීඊ කාන්තාවන් ගැටගසන ආකාරයට” ඇගේ හිසකේ ගොතන ලෙස කියා සිටියහ.

### *අ) පුල්මොඩ්ඩෙ පොලිස් ස්ථානයේදී ලිංගික හිංසන*

240. වසන්තිට ලිංගික වධහිංසා පමුණුවන ලදී. ලී පොල්ලක් ඇගේ යෝනියට ඇතුල් කිරීමෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ නිලධාරීහු ඇය දූෂණය කළහ. මහත් සේ වේදනාවට පත් ඇය කෑ මොර දුන්නාය. ඔවුහු ඇගේ බඩට ඇන පියයුරුද මිරිකූහ. ඊළඟ දවසේ ඇගේ මුත්‍රා සමග ලේ පිටවිය. අවිවාහක කන්‍යාවියක් වන ඇගේ සංස්කෘතික අනන්‍යතාවට එම ලිංගික දූෂණයෙන් සිදු වූයේ මහත් හානියකි. මේ වධබන්ධනයෙන් පසු විවාහයක් කරගැනීමේ හැකියාවක් නැති වෙතැයි ඇය මහත් බියට පත් වුවාය.

241. ඉන් අනතුරුව ඔවුහු සිංහලෙන් ලියැවුනු ලියවිල්ලක් අත්සන් කරන ලෙස ඇයට කීහ. ඇය කොතරම් බියට පත්වී සිටියේද යත්, භාෂාව හෝ එම ලියවිල්ලෙන් කියවෙන දේ හෝ නොදත්තත් ඊට අත්සන් කළාය.

242. වසන්ති ඉන් පසුව බූස්ස කඳවුරේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ රැඳවුම් මධ්‍යස්ථානයට මාරුකර යවන ලදී. වෙනත් සිරකරුවන් කෑමොර දෙනු ඇගේ සිරමැදිරියේ සිටියදී ඇයට ඇසුණි. එහිදීද ඇය ප්‍රශ්න කිරීමට ගෙනයන ලදුව නිලධාරියකු විසින් සිගරට්ටුවකින් ඇගේ ඇතුල් කලවා පුලුස්සා වාචිකව පරිභව කරන ලදී.

243. මාසයක පමණ කාලයක් බූස්සේ සිටීමෙන් අනතුරුව ඇය කොළඹ “හතරවැනි තට්ටුවේ” ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ රැඳවුම් මධ්‍යස්ථානයට මාරු කරන ලදී. ඔවුන් ඇය සිරකළේ තුන් පැත්තකින් යකඩ කූරුත්, එක් පැත්තකින් බිත්තියකුත් සහිත සතුන් රඳවන කූඩුවකට සමාන සිර කුටියකය. “හතරවැනි තට්ටුවේ” සිටි ටික කාලයේදී ඇයට කියවිය නොහැකි භාෂාවක් වන සිංහලෙන් ලියන ලද ලියැවිල්ලකට අත්සන් කිරීමට ඇයට නැවතත් බල කරන ලදී.

244. 2010 දී ඇය නිදහස් කරන තුරු වසන්ති එතැන් පටන් අවුරුද්දක පමණ කාලයක් සිරගතව සිටියාය. ඉන් පසුව නිතිපතා බලධාරීන්ට වාර්තා කරන මෙන් ඇයට අණ කොට තිබුණි. ඇගේ ගමේ සිටියදී, ඇය සමග සංවාසයේ යෙදෙන්නට අවශ්‍ය යැයි කී සිංහල සොල්දාදුවන්ගේ අඩන්තේට්ටමට ඇය ගොදුරු වූවාය. තවදුරටත් ලිංගික ප්‍රචණ්ඩතාවට ගොදුරු වනු ඇතැයි බියෙන් ඇය විදේශයක රැකවරණ පතා ශ්‍රී ලංකාව හැර පලා ආවාය.

245. වධහිංසාව නිසා තවමත් මානසික හා ශාරීරික පීඩාවට පත්ව සිටින වසන්ති බරපතල ප්‍රසවවේද ගැටළු වලින් පීඩා විඳ ඇත්තීය.

## XII. මයූරන් රාජ්කුමාර් වධහිංසාවට ලක් කිරීම

246. ශ්‍රී ලාංකික දෙමළ ජාතිකයකු හා රජයේ ගුරුවරයකු වූ මයූරන් රාජ්කුමාර් 2011 වසන්ත කාලයේදී සිවිල් ඇඳුම් හැඳගත් දෙදෙනකු විසින් නවත්වන ලද්දේ ඔහු සේවයට යමින් සිටියදී ය. තුවක්කුවක් පෙන්වා බිය ගැන්වූ ඔවුහු ඔහුව දෑස් බැඳ බලයෙන් යතුරු පැදියක නංවාගෙන ජෝසොෆ් කඳවුර ලෙස හඳුන්වන වවුනියාවේ වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයට රැගෙන යන ලදී.

247. ඔහු එහි ළඟා වූ පසු, ප්‍රශ්න කිරීම සඳහා ඔහුව කුටියකට රැගෙන යන ලද අතර ඔහුගේ දෑස් බැඳ තිබූ රෙදිකඩ ඉවත් කරනු ලැබුණි. කාමරයේ වූ මේසයට ඉහළින් මඳ දීප්ත ආලෝකයක් විය. මේසයේ අනෙක් පස රාජා නම් නිලධාරියා අසුන් ගෙන සිටියේය.

248. අවශේෂ නිලධාරීන් ඔහුට කායික වධ හිංසා පමුණුවන අතරතුර රාජා නමැති නිලධාරියා ඔහුව ප්‍රශ්න කිරීම කරගෙන ගියේය. එල්ටීටීඊ සංවිධානය සඳහා විදේශයන්ගෙන් මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් ඔහුට චෝදනා කළ ඔවුහු අදාළ මුදල් ලබාදෙන මෙන් ඔහුට බලකර සිටියේය. තමා කිසිදු සම්බන්ධයක් නැති බව කී විට, එක් නිලධාරියෙක් ඔහුට පුටුවෙන් බිමට වැටෙන සේ ඔහුගේ පපුවට පයින් පහර දුන්නේය. බර බූට් සපත්තුවලින් ඔහුගේ ඇඟිලි හා පපුව තලා දැමූ ඔවුහු ඔහුට අතුල් පහර දුන්හ. ඔහුට පොලු, මුගුරුවලින් පහරදෙන ලද අතර තුවක්කු බඳකින් පහර දී ඔහුගේ ලිංග ප්‍රදේශයට පා පහරවල් එල්ල කෙරුණි. සමහර දෙනා ස්ත්‍රී අවයව ද, තවත් අය දෙමළ ජනයා පිළිබඳ නිග්‍රහයන් ද සම්බන්ධ කොට අසභ්‍ය වදනින් අවමන් කළහ. ඔහුගේ පාදවල යටි පතුල්වලට හා විළුඹට, ඔහු සිහි විසඥ වන තුරුම පහර දෙනු ලැබුණි.

### *අ) ජෝසොෆ් කඳවුරේදී හංවඩු ගැසීම්*

249. කිසියම් වෙලාවකට පසු මයූරන් අවදි වූයේ, දුම්වැටිවලින් සිය සම පුලුස්සන වේදනාවෙනි. ඔහු පොළොවේ මුණින් අතට වැතිර හුන්නේය. කිසිවෙක් ඔහුගේ දැත් මත සිටගෙන සිටි අතර ඔහුගේ ගෙළ පිටුපසට තුවක්කුවක් අල්ලාගෙන සිටියේය. ඉක්බිති රත් වූ ලෝහ යෂ්ටියකින් ඔහුගේ පිටුපස හා වම් බාහුවේ හංවඩු ගසනු ලැබිණ. මෙය දෙවරක් සිදු වූ අතර, ඒ දෙවතාවේදීම ඔහු සිහි විසඥ වනතෙක්ම ඔවුහු හංවඩු ගැසීම සිදුකළහ.

250. දින කිහිපයකට පසු ඔහුගේ ඥාතීන් විසින් ඔහු වෙනුවෙන් කප්පම් මුදලක් ගෙවීමෙන් පසු මයූරන් නිදහස් කෙරුණි. ජෝසොෆ් කඳවුරින් නික්ම යාමට කලින් ඔහු ඇමතූ රාජා නමැති නිලධාරියා, රජයේ රෝහලකට හෝ මානව හිමිකම් සංවිධාන කරා නොයන ලෙසත්, සිදු වූ දේ කවුරුන් සමග හෝ ප්‍රකාශ කළහොත් ඔහුව මරා දමන බවටත් තර්ජනය කළේය.

251. 2012 ගිම්හාන සමයේදී, ඔහුගේ ලිපි ගොනුව වසා දැමීමට පෙර ප්‍රශ්න කිහිපයක් ඇසිය යුතු හෙයින් නැවතත් ජෝසොෆ් කඳවුරට එන්නැයි ඔහුට දන්වනු ලැබුණි. ඒ පිළිබඳ කණස්සලු නොවන ලෙසත්, ඔහුට පෙරළා යාමට

ඉක්මණින් අවසර දෙන බවත් ඔහුට දැනුම් දී තිබිණ. එය විශ්වාස කළ ඔහු කඳවුරට ගියේය. නමුත් නව නිලධාරීන් පිරිසක් විසින් ඔහුව රඳවාගෙන ප්‍රශ්න කරමින් වධහිංසා පැමිණවූහ.

252. යළිත් වතාවක්, එල්ටීටීඊ මුදල් ලබා ගැනීම පිළිබඳ ඔහුට චෝදනා කෙරුණි. අදාළ මුදල ඉදිරිපත් නොකළහොත්, කොළඹ හතරවැනි තට්ටුවට ඔහු ගෙන යන බවට ඔහුට තර්ජනය කරනු ලැබිණ. එවැනි මුදලක් තමන් සතුව ඇතැයි යන්න ඔහු විසින් ප්‍රතික්ෂේප කළ විට, ඔවුහු ඔහුගේ හිසය මොට්ට අවියකින් පහර දුන්හ. පහරේ බලවත්කම හේතුවෙන් දතක් ගැළවෙන තරම් වේගයෙන් ඔහුගේ නිකට මේසයේ වැදුණි. හිසෙන්, නිකටෙන් සහ මුවින් ලේ වගුරුවමින්, ඔහු අව සිහියෙන් පොළොව මතට ඇද වැටුණේය. අනතුරුව නිලධාරීහු ඔහුගේ යටිබඩ හා ඉකිලි ප්‍රදේශයට පයින් පහර දුන් අතර ඔහු සිහි විසඥව ගියේය.

253. ඔහුගේ පවුලේ අය විසින් දෙවැනි වරටත් කළ ගෙවීමකින් පසු ඔහු නිදහස් කර හැරුණි.

254. 2013 වසන්ත කාලයේ දී, යළිත් ජෝසොෆ් කඳවුරට වාර්තා කරන්නැයි ඔහුට දන්වා තිබුණි. මරණ බියෙන් ශ්‍රී ලංකාව අතහැර ආ ඔහු එයින් පසු පෙරළා යළිත් නොගියේය.

255. ඔහුගේ වධකයන් විසින් ඔහු වෙත පමුණුවන ලද වධහිංසා හේතුවෙන් අදටත් හෙතෙම කායික වේදනාවන්ගෙන් මෙන්ම මානසික සෞඛ්‍ය ගැටළුවලින් පීඩා විඳියි. තමන් විඳි වධහිංසාවන් අතීතාවර්ජන හා දුස්-ස්වප්න තුළින් නිතර අත්විඳින ඔහු ඩහදිය දමමින් ද, භීතියෙන් ද, හුස්ම ගැනීමේ අපහසුවකින් ද අවදි වේ.

## XIII. අඛණ්ඩව පවත්වාගෙන යන දණ්ඩ මුක්තිය

256. තමන් යටතේ සේවය කළවුන් විසින් පැහැර ගැනීම්ද, රට පුරා රඳවාගෙන සිටි අයට වධහිංසා හා ලිංගික දූෂණද සිදුකළ බවට විශ්වසනීය චෝදනා ගෝඨාභය සිය නිලය දැරූ මුළු දශකය පුරාම ඔහුට පුන පුනා දැනුම් දෙන ලදී. මේ හැම විටම රාජපක්ෂවරුන් කළේ ඒවා තිර කොට ප්‍රතික්ෂේප කිරීමය. ප්‍රතික්ෂේප කිරීම් දිගටම පවත්වාගෙන යා නොහැකි වූ කල සත්‍යය හෝ යුක්තිය ඉටු වීම වළක්වනු පිණිස ගෝඨාභය විසින් තමන්ට පක්ෂපාතී අයගෙන් හෝ අපරාධකරුවන්ගෙන් හෝ සමන්විත පරීක්ෂණ මණ්ඩල පිහිටුවන ලදී.

### *අ) ශ්‍රී ලංකාවේ වධාත් ප්‍රකට රහස: වධහිංසා පිළිබඳ වාර්තා නිරන්තරයෙන් ගෝඨාභයගේ අවධානයට යොමු කරන ලදී*

257. වධහිංසා සහ වෙනත් මානව හිමිකම් උල්ලංඝන රාජපක්ෂ පාලනයේ අවධානයට බොහෝ අවස්ථාවල යොමු කරන ලද හෙයින් ඒ සියල්ල එක ලියවිල්ලක ලැයිස්තු ගත කිරීම මහත් දැවැන්ත කාරියක් වනු ඇත.

258. 2005 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට වධහිංසා සම්බන්ධ පැමිණිලි 4,368 ක් ලැබී තිබේ. ඒ, වින්දිතයන් ඉදිරිපත් වූ අවස්ථාවලදී පමණකි. බොහෝ දෙනා ඉදිරිපත් වීමට බිය වූහ.

259. වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත මන්ෆ්‍රෙඩ් නොවැක් 2007 දී ශ්‍රී ලංකාවට පැමිණ, වෛත්‍ය පාර සහ බූස්ස කඳවුර ඇතුළු මේ පැමිණිල්ලේ සඳහන් රැඳවුම් ස්ථාන කිහිපයක් නිරීක්ෂණයේ යෙදුනේය. ඔහු විසින් 2008 පෙබරවාරියේ සම්පාදනය කරන ලද වාර්තාවේ, "වධහිංසාව ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස භාවිතා කරනු ලැබේ" යනුවෙන් සඳහන් කර තිබේ. මේ පැමිණිල්ලේ සඳහන් වන හුස්ම හිර කිරීම සහ පැට්‍රෝල් පෙඟවූ උර ඇතුළු විශේෂිත වධ බන්ධන විධික්‍රම කිහිපයක්ද එහි ලේඛනගතකොට ඇත. එම වාර්තාව බාර දෙනු ලැබූ රාජපක්ෂ ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් "අදහස් දක්වා" තිබේ.[7]

260. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 2009 මානව හිමිකම් වාර්තාවද ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) විසින් බූස්ස කඳවුරේ රැඳවියන්ට එරෙහිව යොදා ගන්නා එයාකාර, විශේෂිත වධ බන්ධන විධික්‍රම විස්තර කර ඇත. 2010, 2011 සහ 2014 වාර්තා ද බූස්ස කඳවුරේ එවැනිම TID වධහිංසා ගැන සඳහන් කිරීමෙන් පෙනී යන්නේ කිසිදු වෙනසක් සිදුවී නැති බවයි.

261. සිය ධුර කාලය තුළදී යුද හමුදාව විසින් සිදුකරන ලද ලිංගික ප්‍රචණ්ඩතා පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් ගෝඨාභයට අභියෝගද කර තිබේ. 2009 මැයි මාසයේ යුද්ධය අවසන් වූ පසු දිවි ගලවා ගත්තවුන් සිරකොට සිටි කඳවුරෙන් ලිංගික දූෂණ පිළිබඳ චෝදනා කඩිනමින් මතුවන්නට විය. සොල්දාදුවන් විසින් කඳවුරෙන් පැහැර ගෙන යනු ලබන කාන්තාවන් ලිංගික අපහරණයට ගොදුරු කරගන්නා බව සහන සේවකයෙක් වැනල් 4

[7] Id. at ¶ 6.

ප්‍රවෘත්තිවලට කියා සිටියේය. සුපුරුදු පරිදි රාජපක්ෂ පාලනය විසින් මෙම චෝදනා ආණ්ඩු විරෝධී ප්‍රචාර ලෙස ප්‍රති ක්ෂේප කරන ලදී. කෙසේ වෙතත්, චැනල් 4 වාර්තාකරුට පුද්ගලිකව දුරකතනයෙන් ඇමතූ ගෝඨාභය රාජපක්ෂ ඔහු ලිංගික දූෂණය සම්බන්ධයෙන් වාර්තා කිරීම නිසා පිටුවහල් කරන බව කියා සිටියේය. *"මගේ සොල්දාදුවෝ සාමාන්‍ය වැසියන් දූෂණය කරන බවද තමුසේ චෝදනා කරන්නේ? ඔහේගේ වීසා අවලංගුයි. තමුසෙව පිටුවහල් කරනවා.'*[8]

262. ශ්‍රී ලංකාවේ තත්ත්වය ජාත්‍යන්තර ප්‍රජාවට කෙතරම් ප්‍රශ්නයක් වූයේද යත්, 2002 සහ 2011 අතර කාල සීමාවේ සිදුවූ මානව හිමිකම් උල්ලංඝන චෝදනා සම්බන්ධයෙන් විධිමත් එක්සත් ජාතීන්ගේ විමර්ශනයක් පවත්වන ලෙස ඉල්ලා සිටින එක්සත් ජාතීන්ගේ යෝජනාවකට එක්සත් ජනපදය සහ තවත් රටවල් විසින් අනුග්‍රහය දක්වන ලදී. ජාත්‍යන්තර පරීක්ෂාව තම රටට විරුද්ධ එකක් ලෙසින් ගෝඨාභය රාජපක්ෂ විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

### *ආ) ගෝඨාභය යුක්තිය අවහිර කොට දණ්ඩ මුක්ති සංස්කෘතියක් තහවුරු කළේය*

263. මේ චෝදනා හමුවේ, වධහිංසාව සහ වෙනත් මානව හිමිකම් උල්ලංඝන විභාග කොට නඩු පැවරීම සඳහා, යුද අපරාධ සඳහා අභිචෝදනා ඉදිරිපත් කළ හැකි යුද්ධාධිකරණ ඇතුළු සකල මෙවලම් යොදාගැනීමේ බලය ගෝඨාභය සතුව තිබුණි. ඒ වෙනුවට ඔහු කිසිවිටෙකත් විමර්ශන නොකරන බවට ප්‍රසිද්ධියේ දිවුරා සිටියේය: "මේ රටේ කිසිම විමර්ශනයක් කරන්නේ නෑ; කරන්න හදන කාට උනත් මම විරුද්ධ වෙනවා," යි ඔහු පැවසීය. "මේ රටේ කිසිම වරදක් සිදුවුනේ නෑ කියලා මමයි කියන්නේ, සිද්ධ වුනු කිසි දේකට කිසිම විමර්ශනයක් නෑ".

264. අපක්ෂපාතී ලෙස යුක්තිය ඉටු කර දෙනු වෙනුවට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව කළේ ජාත්‍යන්තර විමර්ශනයක් සඳහා වන ඉල්ලීම් වෙනතකට හැරවීම සඳහා කොමිසම් සහ පරීක්ෂණ මණ්ඩල මාලාවක් පිහිටුවාලීමයි. පළමුවැන්න වූයේ යුද්ධය පවත්වාගෙන ගිය ආකාරය විමර්ශනය කිරීම සඳහා වූ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමයි (LLRC). එහි ආරම්භක සැසියේදී මානව හිමිකම් සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නොකළ සභාපතිවරයා සාක්ෂිකරුවන්ගෙන් ඉල්ලා සිටියේ "අතීතය අමතක කරන" ලෙසයි.

265. ඊළඟට පැමිණියේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාවේ නිර්දේශ අනුව යාමටත්, සොල්දාදුවන් විසින් පුද්ගලයන් ලඝු අයුරින් ඝාතනය කෙරෙනු දක්වමින් නැවත ඉස්මතු වූ වීඩියෝවලට ප්‍රතිචාර දැක්වීම සඳහාත් පත් කරන ලද හමුදා පරීක්ෂණ මණ්ඩලයයි. මණ්ඩලය සමන්විත වුනේ යුද්ධයට හවුල්වූවත්, දැන් තමන්ගේම ක්‍රියාකලාපය විභාග කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හතරදෙනකුගෙනි. කිසිදු විස්මයක් ඇති නොකරමින්, ඔවුන් විසින් තීරණය කර තිබුණේ "සාමාන්‍ය වැසියන්ට හානි සිදුවීම වැලැක්වීම සඳහා යුද හමුදාව සියලු පූර්වාරක්ෂාවන් යොදා තිබුණු" බවයි.

266. ඒ කාල වකවානුවේම යුද්ධයේ අවසාන භාගයේ "මානව හිමිකම් උල්ලංඝන චෝදනා" විමර්ශනය කිරීම සඳහා තවත් පංච පුද්ගල විමර්ශන අධිකරණයක් 2012 දී පිහිටුවන ලදී.[9] එම අධිකරණයේ ප්‍රධානියා වූයේ ගෝඨාභය රාජපක්ෂගේ සගයකු වන ජගත් ජයසූරියයි. යුද අපරාධ චෝදනා ලබන ඔහුද වධක භූමියක් වන ජෝසප් කඳවුරේ 2007 සිට 2009 දක්වා අණදෙන නිලධාරියා වශයෙන් රාජකාරි කළේය. විමර්ශන අධිකරණ වාර්තාව කිසිවිටෙකත් ප්‍රසිද්ධියට පත් නොකළත්, හමුදාව පැවසුවේ එමගින් තමන් නිර්දෝෂී කරන ලද බවයි. එයද පුදුමයට කරුණක් නොවේ.

267. කරුණු වසං කොට ආරක්ෂක හමුදා සාමාජිකයන් නෛතික සුපරීක්ෂණයෙන් ආරක්ෂා කිරීම සඳහා වන මේ උත්සාහ දැරීම් ආරක්ෂක ලේකම් ලෙසින් ගෝඨාභය විසින් බලය පවරා අනුමත කරන ලද්දේය. මේ විමර්ශනවලට නායකත්වය දුන් නිලධාරීන්ට බැඳියා අතර ගැටුම් තදින්ම තිබුණු බව ඔහු දැන සිටියේය. මෙම වසං කිරීම් අනුමත කිරීම මගින්, ඔහුගේ සහ වෙනත් ඉහල නිලධාරීන්ගේ සම්බන්ධය පිළිබඳ සාක්ෂි එළිදරව් වීම වලක්වාලීම සහතික කෙරුණි.

268. යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලබන ඉහළ නිලධාරීන් සඳහා උසස්වීම් ද, ඔවුන්ට ලොව පුරා රාජ්‍ය තාන්ත්‍රික පදවි ලබා දීමද ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය රාජපක්ෂ විසින් අනුමත කරන ලදී. විදේශීය හෝ ජාත්‍යන්තර ආයතන විසින් විමර්ශනය කරනු ලැබීමෙන් ආරක්ෂාව සලසන මුක්තිය එමගින් ඔවුන්ට සැලසුණි. උදාහරණ කිහිපයක් අතරින් දෙකක් ගතහොත්, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය

---

[8] Journalist who reported on internment camps in Sri Lanka tells his story, Nick Paton Walsh, The Guardian, 10 May 2009. https://www.theguardian.com/world/2009/may/10/channel-4-sri-lanka.

[9] Army Probe Continues, 29 Mar 2012, Daily Mirror Lanka, https://www.pressreader.com/sri-lanka/daily-mirror-srilanka/

වැසියන් 40,000 ක් මරා දැමීම සහ යුද සිරකරුවන් නඩු නොඅසාම ඝාතනය කිරීමට සම්බන්ධතාවක් ඇති බවට එක්සත් ජාතීන්ගේ නිලධාරීන් විසින් චෝදනා කරන ලද 58 වැනි බලකායේ හමුදා ආඥාපති ශවේන්ද්‍ර සිල්වා 2010 අගෝස්තු හෝ ඊට ආසන්න කාලයක ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නියෝජ්‍ය නිත්‍ය නියෝජිත ලෙස පත් කරන ලදී. 2012 සැප්තැම්බර් හෝ ඊට ආසන්න කාලයකදී, 55 වැනි බලකායේ හමුදා ආඥාපති ප්‍රසන්න ද සිල්වා, ආරක්ෂක උපදේශක ලෙස එක්සත් රාජධානියට පත්කර එවන ලදී. ඔහු පිළිබඳ යුද අපරාධ සාක්ෂි රැගත් ගොනුවක් ස්කොට්ලන්ඩ් යාර්ඩ් වෙත භාර දෙනු ලැබුවත්, බ්‍රිතාන්‍ය පොලිසියට ඔහුගෙන් ප්‍රශ්න කළ නොහැකි විය. මේ නිලධාරීන් ක්‍රියාකාරී රාජකාරියේ නිරතව සිටියවුන්ය. ඒ නිසාම ඔවුන්ගේ පත්වීම් සහ අනුයුක්ත කිරීම් අනුමත කළ යුතුව තිබුනේ ගෝඨාභය විසිනි.

269. අපරාධකරුවන් දණ්ඩ මුක්තිය භුක්ති විඳිමින් සිටියදී, අතුරුදහන් වීම් පිළිබඳව පැමිණිලි කරන්නට උත්සාහ කළ ඥාතීන් හෝ කොමිසන් සභා හමුවේ සාක්ෂි දුන් හෝ ජාත්‍යන්තර ආයතනවලට තොරතුරු ලබාදුන් හෝ වින්දිතයන්ට ප්‍රචණ්ඩ ප්‍රතිප්‍රහාරවලට මුහුණ දෙන්නට සිදුවිය.

270. ගෝඨාභය, තුමුම ජාත්‍යන්තර රූපවාහිනිය ඔස්සේ සාක්ෂිකරුවකුට මරණීය තර්ජන කළේය. හිටපු හමුදාපති සරත් ෆොන්සේකා අධිකරණයකදී යුද අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි දුන්නොත් කුමක් වේදැයි අසනු ලැබූ කල්හි ඔහුගේ පිළිතුර වූයේ, "ඒක දේශද්‍රෝහී වීමක්. එයා ඒක කළොත් අපි එයාව එල්ලනවා" යන්නයි.

271. දණ්ඩ මුක්තිය අද දක්වාම අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. මානව හිමිකම් උල්ලංඝනය කළවුන් වගවීමෙන් බැඳ තබන බවට වන කැපවීම ලෙස ආණ්ඩුව විසින් හුවා දක්වනු ලැබුවේ පැහැරගැනීම්, වධහිංසා සහ නඩු නැති ඝාතන සම්බන්ධ ලාංඡනමය නඩුකර කිහිපයක් විවෘත කිරීමය. එහෙත්, එම විමර්ශන මෙහෙයවීම භාරව සිටින නිලධාරියාම, නිශාන්ත ද සිල්වා, මේ පැමිණිල්ලේ වධකයකු ලෙස නම් කර තිබේ. ඒ චෝදනාව බලධාරීන් වසර ගණනාවකට පෙර දැන සිටියකි.

272. නිසි කාර්යදාමයක හෝ අපක්ෂපාතී යුක්තියක සහතිකයක් ලබාගැනීමට නොහැකි නිසාද, තමන් සහ තමන්ගේ ඥාතීන්ට එරෙහි ප්‍රචණ්ඩ ප්‍රතිප්‍රහාර පිළිබඳ බිය නිසාද, පැමිණිලිකරුවන්ට ශ්‍රී ලංකාවේ අධිකරණවලින් ඵලදායී පිළියමක් සලසා ගැනීමේ හැකියාවක් නොමැත.

## චෝදනාව I: වධහිංසාව

(සියලු පැමිණිලිකරුවන්)

273. ඉහතින් දක්වන ලද සියලුම ඡේද මෙතැන් පටන් මෙහි දක්වා ඇති ලෙසින් ඇතුළත් කරගනු ලැබේ.

274. ඉහත 54 ඡේදයේ සිට 255 දක්වා විස්තර කර ඇති ක්‍රියා මගින් පැමිණිලිකරුවන්ට ශාරීරික හා මානසික දෙයාකාරයෙන්ම මහත් දුක් වේදනා ගෙන දෙන ලද අතර, වධහිංසාවට පාත්‍ර වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත [Torture Victim Protection Act, 28 U.S.C. § 1350, note § 3(b)(1)] විසින් නිර්වචනය කර ඇති පරිදි වධහිංසාව සංයුක්ත කරයි. වෙනත් ආකාරයක විදේශීය නීතියක් මුවාවෙන් සිදුකරන ලද වධහිංසක ක්‍රියාවලට එරෙහිව, කරනු ලැබූ ස්ථානය හෝ වින්දිතයන්ගේ හෝ අපරාධකරුවන්ගේ හෝ පුරවැසි භාවය නොතකා, පියවර ගැනීමට එකී පනත ඉඩ සලසා දෙයි.

275. පැමිණිලිකරුවන්ට වධහිංසා පැමිණුනේ නෛතික ප්‍රතිපාදනවලට ආවේණික ලෙසින් හෝ ආනුෂංගිකව හෝ නොවේ.

276. මේ ක්‍රියා සිදුකරන විට පැමිණිලිකරුවන් සිටියේ ශ්‍රී ලංකා යුද හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයන්ගේ අත්අඩංගුවේ සහ කායික පාලනයට යටත්වය.

277. මෙහි විස්තර කෙරෙන දණ්ඩන ක්‍රියා හිතාමතා, චේතනාන්විතව සිදුකරන ලද්දේ (i) පැමිණිලිකරුවන්ගෙන් පාපොච්චාරණ හෝ තොරතුරු හෝ ලබාගැනීම; (ii) රාජපක්ෂ ආණ්ඩුවට ඔවුන්ගේ ඇතැයි හැඟී යන විරෝධය සම්බන්ධයෙන් දඬුවම් කිරීම හෝ බිය ගැන්වීම; සඳහා හෝ (iii) පැමිණිලිකරුවන්ගේ වාර්ගික, ලිංගික, දේශපාලනික, සහ/ හෝ සංස්කෘතික අනන්‍යතාවයට වෙනස්කොට සැලකීම පදනම් කොටගෙනය.

278. මෙහි විස්තර කෙරෙන දණ්ඩන ක්‍රියා සිදුකරන ලද්දේ ශ්‍රී ලංකා රජයේ නියමාකාර හෝ ගම්‍යමාන හෝ අධිකාරය හෝ නීතිය මුවාවෙන් හෝ ශ්‍රී ලංකා යුද හමුදාවේ සහ පොලිස් බලකායේ සාමාජිකයන් විසිනි.

279. වගඋත්තරකරු සහ ඔහුගේ අනු කාර්ය මණ්ඩලය හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ සම කුමන්ත්‍රණකරුවන් විසින් සිදුකරන ලද ක්‍රියා ශ්‍රී ලංකාවේ නීති උල්ලංඝනය කරයි. වධහිංසාවෙන් නිදහස මූලික අයිතිවාසිකමක් ලෙස ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තියේ නිධන් කොට ඇත. වධහිංසා පැමිණවීම සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ වධහිංසාව තහනම් කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඇති ජාත්‍යන්තර අවනත භාවය ක්‍රියාත්මක කරන 1994 අංක 22 දරන ශ්‍රී ලංකාවේ වධහිංසා පනත අනුවද වධහිංසා කිරීම සාපරාධී වරදකි.

280. පැමිණිලිකරුවන්ට එරෙහිව සිදුකරන ලද වධහිංසක ක්‍රියා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වැසියන්ට එරෙහිව 2005 සහ 2015 අතර කාල පරිච්ඡේදයේ සංවිධිත රටාවකට සහ චර්යාවකට සිදුකළ මානව හිමිකම් උල්ලංඝනවල අංගයක් වන්නේය. වගඋත්තරකරු ඒ සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙයි.

## විධාන වගකීම

281. අදාළ සෑම කාල වකවානුවකම ගෝඨාභය ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ව සිටියේය. ඒ අනුව දළ වශයෙන් 2005 නොවැම්බරයේ සිට 2015 ජනවාරි දක්වා ඔහු හමුදා සහ බුද්ධි අංශ වලට අණ දීමේ සහ පාලනයේ බලය දරා සිටියේය. එමෙන්ම දළ වශයෙන් 2005 නොවැම්බරයේ සිට 2013 අගෝස්තු දක්වා පොලිස් බලකායට අණ දීමේ සහ පාලනයේ බලය දරා සිටියේය. එම බලමුළුවලට අදාළව ඔහු දැරූ විධාන වගකීම් අතර අණදීමේ අධිකාරිය සහ වගකීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ එම බලමුළුවල වැඩකටයුතු කළමනාකරණය ඇතුළත් විය. එවැනි සේනාවල පුද්ගලයන් පත්කිරීමට, අනුමත කිරීමට, ඉවත් කිරීමට සහ හමුදා අධිකරණයන් හා වෙනත් හමුදාමය යුක්තිය පසිඳලීමේ ක්‍රම ඇතුළු ක්‍රියාමාර්ග මගින් ඔවුන් පිළිබඳ විනය ක්‍රියාමාර්ග ගැනීමට ද ඔහුට බලය තිබුණි.

282. මෙම බලමුළුවල අනු කාර්ය මණ්ඩල පාලනය පැවතියේ ගෝඨාභය අතය. ඔහු සැබවින්ම අණ දුන්නේය, වාර්තා ලබා ගත්තේය, අනුකූලතාව අධීක්ෂණය කළේය, ඇතැම් විෂමාචාරවලට දඬුවම් පමුණුවා තවත් ඒවා ඉවසා සිටියේය.

283. තම විධානය යටතේ වූ නිලධාරීන් වධහිංසා, ලිංගික දූෂණ, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, සහ ජාත්‍යන්තර හා ශ්‍රී ලාංකික නීති උල්ලංඝන සිදුකළ හෝ සිදුකරන බවට ගෝඨාභයට සැබවින්ම දැන සිටියේය.

284. තම විධානය යටතේ වූ නිලධාරීන් විසින් වධහිංසා, ලිංගික දූෂණ, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ඇතුළු වෙනත් උල්ලංඝන සිදු කරනු ලැබූ, සිදුකරනු ලබන හෝ සිදුකරන්නට යන බව විධානයේත්, පාලනයේත්, ආරක්ෂක අමාත්‍යාංශයේ තිබූ සන්නිවේදන පද්ධතිවලත් ආනුභාවයෙන් ගෝඨාභය බොහෝ දුරට දැන සිටිය යුතුය.

285. වධහිංසා, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, ලිංගික දූෂණ, ලිංගික වහල්භාවය, යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධවලට විරුද්ධව පනවා ඇති තහනම් ඇතුළු ජාත්‍යන්තර හා ශ්‍රී ලාංකික නීති සම්බන්ධයෙන් තමන්ගේ විධානය යටතේ වන සියලුම නිලධාරීන් පුහුණු කිරීම සහ හා ඊට අනුකූල වීම සහතික කිරීමට ආරක්ෂක ලේකම් වශයෙන් ගෝඨාභය රාජපක්ෂට ජාත්‍යන්තර හා ශ්‍රී ලාංකික නීතියෙන් වගකීමක් තිබුණි.

286. තම විධානය යටතේ වූ හමුදා, බුද්ධි සහ පොලිස් බලමුළු විසින් ජාත්‍යන්තර හා ශ්‍රී ලාංකික නීති උල්ලංඝනය කිරීම් විමර්ශනය, වලක්වාලීම සහ ඒවාට දඬුවම් කිරීමේ වගකීමෙන් ආරක්ෂක ලේකම් වශයෙන් ගෝඨාභය බැඳී සිටියේය.

287. මෙහි දැක්වෙන උල්ලංඝන වලක්වාලීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ගෝඨාභය සිදු කළේ නැත; නැතහොත් එසේ කිරීම ප්‍රතික්ෂේප කළේය. එවැනි උල්ලංඝන කිරීම සම්බන්ධයෙන් ඔහුගේ පහළ කාර්ය මණ්ඩල සාමාජිකයන් විමර්ශනය කොට දඬුවම් පැමිණවීම ගෝඨාභය සිදු කළේ නැත; නැතහොත් එසේ කිරීම ප්‍රතික්ෂේප කළේය. එමනිසා, විධාන වගකීම පිළිබඳ සිද්ධාන්තය අනුව ගෝඨාභය නෛතිකව වගකිව යුතු ය.

## කුමන්ත්‍රණය

288. දෙමළ ජනතාවට හිංසා කිරීම සඳහා ශාරීරික ප්‍රචණ්ඩතාව සහ බියගැන්වීම යොදාගැනීමේ පොදු සැලසුමකට අනුව, ගෝඨාභය ආරක්ෂක අමාත්‍යාංශයේ වෙනත් නිලධාරීන් සමග කුමන්ත්‍රණය කර සංවිධානගතව ක්‍රියා කළේය.

289. මේ කුමන්ත්‍රණය සාර්ථක කරගැනීම සඳහා ගෝඨාභය යට දැක්වෙන, එහෙත් ඊට පමණක් සීමා නොවෙන, ක්‍රියා ගණනාවක යෙදුනේය:

අ) සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීමෙන් හා අපචේෂණයෙන් යුක්තිය නිසියාකාර ඉටු කිරීම අවහිර කිරීමට, වලක්වාලීමට හෝ ඊට බලපෑම් කිරීමට උත්සාහ දැරීම; සහ

ආ) අපරාධකරුවන් අල්ලා ගැනීම, ඔවුන්ට නඩු පැවරීමට හෝ දඬුවම් කිරීමට අවහිර වන ආකාරයෙන් ඔවුන්ට ආධාර කිරීම.

290. මෙම කුමන්ත්‍රණය සාර්ථක කරගැනීම සඳහා ඔහුගේ සම කුමන්ත්‍රණකරුවන් විසින් සිදුකරන ලද ක්‍රියාවලට ගෝඨාභය හවුලේද, තනිවද වගකිව යුතු වෙයි.

### ආධාර සහ අනුබල දීම

291. තම අනුකාර්ය මණ්ඩල සාමාජිකයන්ට මෙහි චෝදනා කෙරෙන නීති විරෝධී ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා ගෝඨාභය ආධාර අනුබල දුන්නේය; නැතහොත් බරපතල ලෙස සහාය හෝ රුකුල් හෝ දුන්නේය; එමෙන්ම, ඔහු එම ක්‍රියා සිදුකිරීමේ වැදගත් සාධකයක් විය. සහාය හෝ රුකුල් දීම සම්බන්ධයෙන්, වෙනත් කරුණු අතර, දෙමළ ජනතාව සහ දේශපාලන විරුද්ධවාදීන් ලෙස හැඟී ගියවුන්ට හිංසා කිරීමට අනුබල දීම සඳහා ශ්‍රී ලංකාවේ නීතිය සහ හමුදා යුක්ති විනිශ්චය වරණීය ලෙස බලාත්මක කිරීම ද ඇතුලත් වෙයි.

මෙම වරණීය බලාත්මක කිරීම් අතර යට දැක්වෙන දෑද වෙයි:

අ) වින්දිතයන්ට වධහිංසා කිරීම නවතා ඔවුන් නිදහස් කරවා ගැනීම සඳහා වින්දිතයන්ගෙන් සහ ඔවුන්ගේ ඥාතීන්ගෙන් අල්ලස් මුදල් ලබා ගැනීමට අවසර දීම; මෙමගින් වධක භූමිවල සිටි අපරාධකරුවන්ට මූල්‍යමය වරදානයක් සැලසිණි.

ආ) ලිංගික දූෂණය සහ හමුදා පරිශ්‍රවල ලිංගික වහල් භාවය පවත්වාගෙන යාම ඇතුළු ලිංගික ප්‍රචණ්ඩතා සඳහා අවසර දීම; මෙමගින්, වින්දිතයන්ට යම් ආකාරයක දඬුවමක් හා බියවැද්දීමක් සිදුකිරීමට අමතරව, අපරාධකරුවන් පිනවන වරදාන ක්‍රමයක්ද නිර්මාණය කෙරිණි.

### බලය

292. ගෝඨාභය සහ ඔහු යටතේ වූවන්, නියෝජිතයන් හා ශ්‍රී ලංකා රජයේ සම කුමන්ත්‍රණකරුවන් අතර සැබෑ හෝ අභ්‍යුපගත හෝ බල නියෝජන සම්බන්ධතාවක් අදාළ සෑම අවස්ථාවකම පැවතිණි.

293. මෙහි විස්තර කෙරෙන නීති විරෝධී ක්‍රියාකාරකම්වල යෙදුනු හමුදාවේ, බුද්ධි සේවාවේ සහ පොලිසියේ නිලධාරීන් ක්‍රියාකළේ මෙම බල නියෝජන සම්බන්ධතාවේ අවකාශය තුළය. පැමිණිලිකරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කළවුන් ක්‍රියා කළේ වගඋත්තරකරුගේ සත්‍ය හෝ ගම්‍යමාන හෝ අධිකාරිය යටතේ සහ, දෙමළ ජනතාවට හිංසා කිරීම සහ ප්‍රතිවිරුද්ධ දේශපාලනය මර්දනය කිරීම සඳහා වන වගඋත්තර කරුගේ පොදු සැලැස්ම අරබයා ය.

294. මීට අමතරව, යුද හමුදාවේ, බුද්ධි අංශයේ සහ පොලිස් බලඇණියේ නිලධාරීන් විසින් මානව හිමිකම් උල්ලංඝන - මෙහි දැක්වෙන ක්‍රියාද ඇතුලත්ව - සිදුකරන ලද සංවිධිත රටාව සහ අභ්‍යාසය ගෝඨාභය විසින් අනුමත කරන ලදී. තමන්ගේ පාලනය යටතේ ඉන්නා නියෝජිතයන් විසින් එවැනි නීති විරෝධී කටයුතු සිදුකරන බව ඔහුට පුන පුනා දැනුම් දෙන ලද අතර, ඔහු ඔවුන්ට බලය පවරා, දිරිගන්වා, ඔවුන් ආරක්ෂා කළේය.

295. 2009 ජුනි 26 වැනි දිනට ප්‍රථම වධහිංසාවට ලක්වූ සියලුම පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් ගත් කල, සීමාවලට අදාළ කිසියම් නීතියක් වේනම්, එය සුවිශේෂ තත්වයන් විසින් ඉවත් කර තිබේ. (1) ඔවුන්ගේ වධහිංසාව සහ උල්ලංඝන අඛණ්ඩව සිදුවන පීඩාවක් වීම, (2) 2015 ජනවාරි දක්වා වගඋත්තරකරු යුදහමුදා සහ පොලිස් බලඇණිවල පාලනය තමන් යටතේ පවත්වාගෙන යාම, සහ (3) ධුරය හැර යාමෙන් පසු වගඋත්තරකරු එක්සත් ජනපදයට යාම ඊම කලාතුරකින් සිදුවන්නක් වීම, වෙනත් කරුණු අතර වෙයි. මේ තත්ත්වයන් තුනම විසින් මේ ක්‍රියාව කලින් දිනකදී සිදුකිරීම පැමිණිලිකරුවන්ට ප්‍රායෝගික නොවන්නක් - සහ ආරක්ෂාකාරී නොවන්නක් - බවට පත් කරන ලදී. බලන්න *Hilao v. Estate of Marcos*, 103 F.3d 767, 773 (9th Cir. 1996) (හිටපු ජනාධිපති ධුරයෙන් ඉවත් වන තුරු සීමා මායිම්)

296. තමන්ට සිදුකරන ලද වධහිංසාවේ සෘජු හා ආසන්න ප්‍රතිපලයක් ලෙස, පැමිණිලිකරුවෝ අති විශාල හානිකර පීඩාවකට ගොදුරු වී සිටිති. එහි නිශ්චිත අගය තීරණය කළ යුතු වන්නේ නඩු විභාගයේදී ය.

297. මීට අමතරව, වගඋත්තරකරුගේ ක්‍රියා සහ පැහැර හැරීම් ඕනෑකමින්, සිතාමතා, චේතනාන්විතව, හිතුවක්කාර ලෙස, ද්වේෂසහගතව සහ මර්දනකාරීව සිදු කළ අතර නඩු විභාගයක තීන්දු කෙරෙන දණ්ඩනීය වන්දියකින් දඬුවමට යටත් කළ යුතු වන්නේය.

## චෝදනාව II: සිවිල් පහර දීම

(සියලු පැමිණිලිකරුවන්)

298. ඉහත 54 සිට 255 දක්වා ඡේදවල විස්තර කෙරෙන වගඋත්තරකරුගේ අනුකාර්යමණ්ඩල, නියෝජිතයන් සහ සම කුමන්ත්‍රණකරුවන් විසින් සිදු කරන ලද නීති විරෝධී ක්‍රියා පැමිණිලිකරුවන්ට හානිකර හෝ අවමාන සහගත ලෙස ස්පර්ශ කිරීම අරමුණ කොටගත්තේය, නැතහොත්, පැමිණිලිකරුවන්ට හානිකර හෝ අවමාන සහගත තර්ජන විය. වගඋත්තරකරුගේ අනුකාර්යමණ්ඩල, නියෝජිතයන් සහ සම කුමන්ත්‍රණකරුවන් තමන්ට හානිකර හෝ අවමාන සහගත ලෙසින් ස්පර්ශ කිරීමට සූදානම්ව සිටි බව හෝ ඔවුන්ගේ තර්ජනය ක්‍රියාත්මක කරන්නට සැරසී සිටි බව හෝ පැමිණිලිකරුවෝ සාධාරණ ලෙස විශ්වාස කළෝය.

299. මේ නීතිවිරෝධී ක්‍රියා, උත්සාහයන් සහ තර්ජන ද්වේශ සහගත සහ පැමිණිලිකාර කැමැත්තෙන් තොරව සිදුකරන ලද අතර, පැමිණිලිකරුවන්ට සෘජුව හා ආසන්න වශයෙන් බිය, මානසික ක්ෂතිය සහ චිත්ත පීඩා ඇති කළේය.

300. ඉහත 54 සිට 255 දක්වා ඡේදවලින් ආයාචනය කර ඇති පරිදි, පැමිණිලිකරුවන්ට පහර දුන් පුද්ගලයන් සම්බන්ධයෙන් චිත්තිකරු විධාන වගකීමක් දරා, ආධාර අනුබල දී සහ/ හෝ නියෝජිත-අපරාධ මූලික සහසම්බන්ධතාවක් පවත්වාගෙන ගිය අතර, සීමා වලට අදාළ සියලු නීති ඉවත් කර තිබේ.

301. පැමිණිලිකරුවන් වන්දි ප්‍රදානයකට හිමිකම් කියන අතර, එහි නිශ්චිත ප්‍රමාණය නඩු විභාගයේදී තීන්දු කළ යුතු වේ.

302. මීට අමතරව, වගඋත්තරකරුගේ ක්‍රියා සහ පැහැර හැරීම් ඕනෑකමින්, සිතාමතා, චේතනාන්විතව, හිතුවක්කාර ලෙස, ද්වේෂසහගතව සහ මර්දනකාරීව සිදු කළ අතර නඩු විභාගයක තීන්දු කෙරෙන දණ්ඩනීය වන්දියකින් දඬුවමට යටත් කළ යුතු වන්නේය.

## චෝදනාව III: සිවිල් අඩන්තේට්ටම් කිරීම

(සියලු පැමිණිලිකරුවන්)

303. ඉහත 54 සිට 255 දක්වා ඡේදවල විස්තර කෙරෙන වගඋත්තරකරුගේ අනුකාර්යමණ්ඩල, නියෝජිතයන් සහ සම කුමන්ත්‍රණ කරුවන්ගේ නීතිවිරෝධී ක්‍රියා හිතාමතාම හානිකර සහ අවමන් සහගත ලෙසින් පැමිණිලිකරුවන් ස්පර්ශ කරන්නට හේතු විය.

304. මේ නීති විරෝධී ක්‍රියා ද්වේශ සහගත සහ පැමිණිලිකාර කැමැත්තෙන් තොරව සිදුකරන ලද අතර, පැමිණිලිකරුවන්ට සෘජුව හා ආසන්න වශයෙන් බරපතල ශාරීරික හා මානසික වේදනාවත්, චිත්ත පීඩාත් ඇති කරන්නට හේතු විය.

305. ඉහත 54 සිට 255 දක්වා ඡේදවලින් ආයාචනය කර ඇති පරිදි, පැමිණිලිකරුවන්ට අඩන්තේට්ටම් කළ පුද්ගලයන් සම්බන්ධයෙන් චිත්තිකරු විධාන වගකීමක් දරා, ආධාර අනුබල දී සහ/ හෝ නියෝජිත-අපරාධ මූලික සහසම්බන්ධතාවක් පවත්වාගෙන ගිය අතර සීමා වලට අදාළ සියලු නීති ඉවත් කර තිබේ.

306. පැමිණිලිකරුවන් වන්දි ප්‍රදානයකට හිමිකම් කියන අතර, එහි නිශ්චිත ප්‍රමාණය නඩු විභාගයේදී තීන්දු කළ යුතු වේ.

307. මීට අමතරව, වගඋත්තරකරුගේ ක්‍රියා සහ පැහැර හැරීම් ඕනෑකමින්, සිතාමතා, චේතනාන්විතව, හිතුවක්කාර ලෙස, ද්වේෂසහගතව සහ මර්දනකාරීව සිදු කළ අතර නඩු විභාගයක තීන්දු කෙරෙන දණ්ඩනීය වන්දියකින් දඬුවමට යටත් කළ යුතු වන්නේය.

## චෝදනාව IV: හිතාමතා මානසික පීඩා ඇතිකිරීම

### (සියලු පැමිණිලිකරුවන්)

308. පැමිණිලිකරුවන් හිතුමතේ රඳවා තබාගැනීම සහ ඔවුන්ගේ ශාරීරික, මානසික සහ ලිංගික අපහරණය ඇතුළු වගඋත්තරකරුගේ අනුකාර්යමණ්ඩල, නියෝජිතයන් සහ සම කුමන්ත්‍රණ කරුවන්ගේ ක්‍රියාකලාපය සාහසික සහ හෘදය සාක්ෂිය කම්පා කරවන සුළු වෙයි. මේ අපහරණ මගින් පැමිණිලිකරුවන්ට මහත් චිත්ත පීඩා පැමිණවීම අපහරණය කළවුන්ගේ අභිප්‍රාය විය.

309. මෙහි විස්තර කෙරෙන ක්‍රියා පැමිණිලිකරුවන්ට සෘජුව හා ආසන්න වශයෙන් මහත් මානසික වේදනා හා පීඩා පැමිණවීය.

310. ඉහත 54 සිට 255 දක්වා ඡේදවලින් ආයාචනය කර ඇති පරිදි, පැමිණිලිකරුවන්ට හිතාමතා චිත්ත පීඩා සිදුකළ පුද්ගලයන් සම්බන්ධයෙන් චිත්තිකරු විධාන වගකීමක් දරා, ආධාර අනුබල දී සහ/ හෝ නියෝජිත-අපරාධ මූලික සහසම්බන්ධතාවක් පවත්වාගෙන ගිය අතර සීමාවලට අදාළ සියලු නීති ඉවත් කර තිබේ.

311. පැමිණිලිකරුවන් වන්දි ප්‍රදානයකට හිමිකම් කියන අතර, එහි නිශ්චිත ප්‍රමාණය නඩු විභාගයේදී තීන්දු කළ යුතු වේ.

312. මීට අමතරව, වගඋත්තරකරුගේ ක්‍රියා සහ පැහැර හැරීම් ඕනෑකමින්, සිතාමතා, චේතනාන්විතව, හිතුවක්කාර ලෙස, ද්වේෂසහගතව සහ මර්දනකාරීව සිදු කළ අතර නඩු විභාගයක තීන්දු කෙරෙන දණ්ඩනීය වන්දියකින් දඬුවමට යටත් කළ යුතු වන්නේය.

### සහන සඳහා කෙරෙන ආයාචනය

නීතියෙන් අවසර දී ඇති ප්‍රමාණයට, පැමිණිලිකරුවෝ වගඋත්තරකරුට එරෙහිව නඩු තීන්දුවක් සහ ඔප්පු කිරීමට යටත්ව පහත දැක්වෙන සහන ඉල්ලා සිටිති:

(අ) හානි සඳහා වන්දි;

(ආ) දණ්ඩනීය වන්දි; සහ

(ඇ) නීතිඥයන් සඳහා සාධාරණ කුලිය, ගාස්තු හා වියදම්; සහ

(ඈ) අධිකරණයට සාධාරණ සහ යෝග්‍ය යයි හැඟී යන වෙනත් සහන.

දිනය: 2019 ජූනි 26


මයිකල් ඩී. හවුස්ෆෙල්ඩ්
mhausfeld@hausfeld.com
ස්කොට් ඒ. ගිල්මෝර්
sgilmore@hausfeld.com
**HAUSFELD LLP**
1700 K Street NW, Suite 650
Washington, DC 20006
T: (202) 540-7200

/අත්සන් කළේ/ බොනී ඊ. ස්වීනි
බොනී ඊ. ස්වීනි
bsweeney@hausfeld.com
ස්ටෙෆනි වයි. චෝ
scho@hausfeld.com
**HAUSFELD LLP**
600 Montgomery Street, Suite 3200
San Francisco, CA 94111
T: (415) 633-1908

*පැමිණිලිකරුවන්ගේ නීතිඥ*